සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

වාර්ෂික වාර්තාව

2020

නිවාසකරණයේ නව්‍ය පිවිසුම





17
සංවත්සරය
2003 - 2020

නාගරික සංවර්ධන වෙරළ සංරක්ෂණ
අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු
රාජ්‍ය අමාත්‍යාංශය

නිවාසකරණයේ නව්‍ය පිවිසුම

අඛණ්ඩව 17 වසරක් පුරා විහිදුණු සිය විශ්වාසනිය ගමන්මඟ තුළ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, සහාධිපත්‍ය නිවාසවාසීන්ගේත්, ක්ෂේත්‍රයේ දේපළ සංවර්ධකයින් සහ සේවාදායක ආයතන ඇතුළු ආයෝජකයින්ගේත් අපේක්ෂාවන් සහ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා වන රාජ්‍ය නියාමන යාන්ත්‍රණය වශයෙන් ප්‍රමුඛ කාර්යයභාරයක නිරතව සිටී.

තිරසර මානව ජනාවාසකරණය කේන්ද්‍ර කර ගත් උපාය මාර්ගික ප්‍රවේශයන් ඔස්සේ ක්‍රියාත්මක වන සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, මහා භාණ්ඩාගාරයෙන් කිසිදු ප්‍රතිපාදනයක් ලබා නොගන්නා ස්ථාවර මූල්‍ය විනයකින් යුතුව අභිමානවත්ව නැඟී සිටී. එමඟින් රාජ්‍ය ව්‍යවසාය වෙත ආදර්ශමත් පණිවිඩයක් ද ලබාදීමට හැකි විය.

ප්‍රජා සහභාගීත්ව කළමනාකරණ ක්‍රමවේදයන් ප්‍රවර්ධනය අතරේ වඩා නිදහස් සහ සුවපහසු මහල් නිවාස සංස්කෘතියක් තුළින් පරිසර හිතකාමී - මානව හිතකාමී ජීවන රටාවකට සරිලන අනාගත මඟ විවර කර දෙමින්, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සහාධිපත්‍ය ක්ෂේත්‍රයේ නියමුවා ලෙස සිය සුවිශේෂී ජාතික මෙහෙවර හෙට දිනයේත් දැයට තිළිණ කරන්නේ වගකීම් සහගත සේම තෘප්තිමත් හැඟීමකින් යුතුවය.



සහාධිපත්‍ය දේපළ ක්ෂේත්‍රයට නියාමනය සපයමින් මූල්‍ය අභියෝගයන් ජය ගනිමින් සාර්ථකත්වය කරා පියමැනීමේ ධෛර්යය හා විශ්වාසය අප සතුය.



ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කරමින් ඵලදායී සේවා වර්ධනයක් තුළින් සේවාලාභීන් වෙත තෘප්තිමත් සේවාවක් සැපයීම සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ වීකායන අරමුණයි.



අන්තර්ගතය

සභාපතිතුමාගේ පණිවිඩය /10

සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය /12

දැක්ම සහ මෙහෙවර / 05

මෙම වාර්තාව සම්බන්ධව

2020 වාර්ෂික වාර්තාව / 06

සහාධිපත්‍ය ඉතිහාසය - වර්තමානය / 07

සහාධිපත්‍ය නිවාසකරණයේ සන්ධිස්ථාන / 09

සභාපතිතුමාගේ පණිවිඩය / 10

සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය / 12

ආයතනික දළ විශ්ලේෂණය

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය / 14

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ආයතනික කළමනාකාරිත්වය / 16

අරමුණු / 17

බලතල / 18

මූල්‍ය ප්‍රගතිය / 19

සේවක පාරිභෝගික හා සාමාජීය වගකීම / 20

කාර්යාලයීය සංවිධාන ව්‍යුහය / 21

පාලන වාර්තාව

සහාධිපත්‍ය ව්‍යාපෘති සඳහා අනුමැතිය සහ සහතික නිකුත් කිරීම / 22

2020 වර්ෂයේ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් නිකුත් කරනු ලැබූ සහාධිපත්‍ය සහතික / 23

පාරිභෝගික සේවා අංශයේ කාර්යයභාරය / 24

පාරිභෝගික සේවා අංශයේ සහාධිපත්‍ය පැමිණිලි සම්බන්ධයෙන් විසඳුම් ලබාදීමේ යාන්ත්‍රණය / 25

කළමනාකරණ සංස්ථා සවිබල ගැන්වීම / 26

2005 - 2020 දක්වා ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව ඇති රාජ්‍ය සහ පෞද්ගලික සහාධිපත්‍ය වීකක /27

සහාධිපත්‍ය දේපළවල ආරවුල් විසඳීම /28

නීති අංශයේ පැමිණිලි සම්බන්ධයෙන් විසඳුම් ලබාදීමේ යාන්ත්‍රණය /29

සමාජ සත්කාරක සේවාවන් /30

තිරසර සංවර්ධන ඉලක්ක /31

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නියාමන මැදිහත්වීම /32

බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනුමත සත්‍ය හා වර්තමාන සේවක ඇස්තමේන්තුව /33

ආයතනික සැළැස්ම /34

2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචන වාර්තාව /35

විගණකාධිපති වාර්තා / 39

මූල්‍ය ප්‍රකාශන / 41

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව / 45

වෙනත් කරුණු / 48

මූල්‍ය වාර්තා / 50

මූල්‍ය කාර්යය සාධනය / 51

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය / 52

මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය / 54

සටහන් / 55

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන් / 61

මූල්‍ය ප්‍රකාශය සඳහා උපලේඛණ / 67

ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය / 70

2020.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය / 71

අයවැයගත සහ සත්‍ය අගයන් සැසඳීමේ ලේඛණය / 72

දැක්ම

රටේ නිවාස අවශ්‍යතාවට විසඳුමක් ලෙස
සභාධිපත්‍ය ජනාවාස බිහි කිරීමට සහායවීම.

මෙහෙවර

සභාධිපත්‍ය දේපළවල, පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය හා සුබ සාධනයට ගැළපෙන පරිදි ඉදිකිරීම සහ වීම දේපළ ක්‍රමවත්ව පාලනය හා කළමනාකරණය කිරීම සඳහා කළමනාකරණ සංස්ථා පිහිටුවා වීම දේපළ නඩත්තු කරවීම යන කාර්යයන් නියාමනය කිරීම.



2020 වාර්ෂික වාර්තාව

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

2020 වාර්ෂික වාර්තාව නිවාසකරණයේ නව්‍ය පිවිසුම මැයෙන් නිර්මාණය කර ඇත්තේ පරිශීලනයේ පහසුවත් විගණන හා ගිණුම් ප්‍රකාශ සම්මත ප්‍රමිතීන්ට අනුව විනිවිද භාවයකින් යුතුව ප්‍රකාශයට පත් කිරීම සඳහා වේ.

2020 වාර්ෂික වාර්තාව 2020 අගෝස්තු මස අමාත්‍ය මණ්ඩල කාර්යාලය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබූ මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කරමින් සකස් කර ඇත. ඒ අනුව එහි 3 (XII) හි ඇතුළත්ව ඇති පහත කරුණු 2020 වාර්ෂික වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත.

(අ) අදාළ කාල සීමාව සඳහා වන ආයතනයේ කාර්යය සාධනය පිළිබඳ වාර්තාව

(ආ) ඉදිරියේදී ආයතනයේ කාර්යය සාධනය වර්ධනය කර ගැනීම පිණිස අනුගමනය සඳහා අපේක්ෂිත කෙටිකාලීන සහ මධ්‍යකාලීන ක්‍රියා මාර්ග

(ඇ) වාර්ෂික වාර්තාවට අදාළ කාලසීමාව සඳහා ඉදිරිපත් වී ඇති විගණන විමසුම මඟින් පෙන්වා ඇති කරුණු නිවැරදි කිරීම සඳහා අධිකාරියේ කළමනාකාරිත්වය හා එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබ ඇති සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග

(ඈ) අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමුවිය යුතු ආයතනයට අදාළ වෙනත් කරුණු,

එමෙන්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කර ඇති වාර්ෂික වාර්තා සකස් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විගණන හා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව විගණන හා ගිණුම් ප්‍රකාශය සකසා ඇත.

වාර්තාකරණ සීමාව

ඉදිරිපත් කර ඇති 2020 දෙසැම්බර් 31 අවසන් මූල්‍ය වාර්තාවට අදාළ මූල්‍යමය නොවන තොරතුරු හා ඊට අදාළ අනෙකුත් වාර්තාකරණයන් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට පමණක් සීමා වේ. බාහිර පාර්ශවකරුවන් සහ මෙහෙයුම් කළමනාකරණය ඇතුළත්ව සමෝධානික වාර්තා විෂය පථය නිර්මාණය කර ඇත. වාර්ෂික වාර්තාකරණ චක්‍රය නිර්මාණය කර ඇත්තේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව පදනම් කර ගෙන සංසන්දනාත්මකවය. එහි මූල්‍ය නොවන තොරතුරු සඳහා ප්‍රමාණාත්මක ගැළපීමක් සිදු කර නොමැත.

ප්‍රමාණාත්මකභාවය

කළමනාකරණ මෙහෙයුම් ප්‍රවණතා සභාධිපත්‍ය දේපළ නිවාසවාසීන්, දේපළ සංවර්ධකයින්ගේ අවශ්‍යතා සහ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ උපාය මාර්ගික සැළසුම් සැළකිල්ලට ගනිමින් මෙම සමෝධානික වාර්තාවට ඇතුළත් කළ යුතු අන්තර්ගතය සකසා ඇත.





මෙම QR කේතය මඟින් වාර්තාව මාර්ගගතව පරිශීලනය කළ හැක.

නිර්මාණය සහ සැකසුම
කළමනාකරණ තොරතුරු පද්ධති අංශය
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය



සහාධිපත්‍ය
ඉතිහාසය - වර්තමානය

කොළඹ නගරයේ ජීවත් වූ පැල්පත්වාසීන්





පැල්පත්වාසීන් හා නාගරික සංක්‍රමණික ජනතාව උදෙසා ඉදිකරන ලද තනි ඒකක නිවාස සහ මහල් නිවාස

පූර්විකාව

මානව ප්‍රජාව විවිධ ආර්ථික සමාජයීය හේතූ මත නගර කරා සංක්‍රමණය වීම ඉහළ යාම නිසාවෙන්, ප්‍රතිශතයක් වශයෙන් නාගරික ජනගහණය වර්ධනය වීම පිළිබඳව ගෝලීය මට්ටමින් සාකච්ඡා කෙරෙනුයේ දැනට බොහෝ කලකට පෙර සිටය.

මෙසේ නාගරික ජන ඝනත්වය අසමතුලිත අන්දමින් වර්ධනය වීම නිසා මතුව ඇති පාරිසරික මෙන්ම, සමාජයීය ගැටළු කෙරෙහිද සංවේදී වෙමින් මේ සඳහා සුදුසු විසඳුම් සොයා බැලීම කෙරෙහි ගෝලීය වශයෙන් අවධානය යොමු වන්නේ ඒ අනුවයි. නගරබද්ව පවතින සීමිත භූමි ප්‍රමාණය වඩාත් ප්‍රශස්ත අන්දමින් හා ඉහළ ඵලදායීත්වයකින් යුක්තව සංවර්ධනය කිරීම පිළිබඳව සළකා බැලීමේදී සහාධිපත්‍ය දේපළ නිසියාකාරව ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකිරීම සහ පවත්වාගෙන යාමේ වැදගත්කම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවූයේ, එය නාගරික ජනාවාසකරණයේ තිරසර පැවැත්ම කෙරෙහි තීරණාත්මක බලපෑමක් කළ හැකි අංශයක් වශයෙන් හඳුනාගත් නිසාවෙනි.

1982 අංක 45 සහ 2003 අංක 39 දරණ පනත්වලින් සංශෝධිත 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත අනුව සහාධිපත්‍ය දේපළක් එක් එක් නිවාස ඒකකය තනි තනිව භුක්තිවිඳිය හැකි, අයිතිය දැරිය හැකි හා අයිතිය බැහැර කළ හැකි ලෙස සකස් කර ඇත. පොදු අංගෝපාංගවලින් සමන්විත වන තිරස්ව හෝ සිරස්ව විහිදුණු එකිනෙක බද්ධ වූ ඒකක එකකට වඩා වැඩි ගණනකින් යුත් ගොඩනැගිල්ලක් සහාධිපත්‍ය දේපළක් ලෙස අර්ථ නිරූපණය කර ඇත. සහාධිපත්‍ය දේපළ සඳහා දැනට භාවිතයේ පවතින සුලභ යෙදුම මහල් නිවාස වේ. එහෙත් තිරස් හා සිරස්ව ඉදිකරනු ලබන ඉහත නිර්වචනයෙන් විස්තර වන බද්ධ නිවාසද සහාධිපත්‍ය දේපළ වේ.

ශ්‍රී ලංකාව තුළ සහාධිපත්‍ය ජනාවාස සංකල්පයේ ව්‍යාප්තිය

යටත්විජිත යුගයෙන් පසු ඇරඹි නිදහස් ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් දිවයිනේ බස්නාහිර පළාතට කේන්ද්‍රීකරණය වූ කාර්මික සහ රැකියා වෙළඳපොළ තවදුරටත් ප්‍රසාරණයට ලක්වූ අතර, එම අවශ්‍යතා සැපිරීම අරමුණු කරගත් ග්‍රාමීය සහ අර්ධ නාගරික සංක්‍රමණික ජනතාවක් කොළඹ සහ තදාසන්න ප්‍රදේශ ආශ්‍රිතව වැඩි වශයෙන් පදිංචිවන්නට විය.

ඒ අනුව සහාධිපත්‍ය දේපළ පිළිබඳ ශ්‍රී ලංකාවේ ඉතිහාසය විමසා බලන විට නාගරික පැල්පත් නිවාස වෙනුවට බද්ධ නිවාස ප්‍රධානතම විසඳුම ලෙස යෝජනා කර ඇත්තේ 1959 වර්ෂයේදී ලංකාවේ නිවාස ගැටළුව සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට පත් කළ කමිටුව විසිනි.

> **පොදු අංගෝපාංගවලින් සමන්විත වන තිරස්ව හෝ සිරස්ව විහිදුණු එකිනෙක බද්ධ වූ ඒකක එකකට වඩා වැඩි ගණනකින් යුත් ගොඩනැගිල්ලක් සහාධිපත්‍ය දේපළක් ලෙස අර්ථ නිරූපනය කර ඇත**



ශ්‍රී ලංකාවේ මහල් නිවාස සම්බන්ධයෙන් වූ ප්‍රථම නිවාස පනත

එම කමිටුව ඉදිරිපත් කළ 1963 අංක xxiii දරණ සැසි වාර්තාව ශ්‍රී ලංකාවේ නිවාස ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වූ ප්‍රථම ප්‍රතිපත්ති ප්‍රකාශනය ලෙස සැළකිය හැක.

- අධික ජනගහණයෙන් යුත් කලාප සඳහා මහල් නිවාස සංවර්ධනය කළ යුතු බවට වූ නිර්දේශය ශ්‍රී ලංකාවේ සහාධිපත්‍ය දේපළ ඉදිකිරීම සම්බන්ධයෙන් වූ ප්‍රථම නිර්දේශය වේ. එවකට තිබූ පැල්පත් හා පේලි නිවාස වෙනුවට අඩු ආදායම්ලාභීන් සඳහා මහල් නිවාස ඉදි කළ යුතු බවත්,
- එමෙන්ම මෙසේ ඉදිකරනු ලබන මහල් නිවාස සඳහා අයිතිය බැහැර කිරීමේ අවශ්‍යතාවයද, එසේ කළ පසු අයිතිකරුවන්ගේ ගොඩනැගිලි, සමිතිය විසින් පොදු පහසුකම් පාලනය, අළුත්වැඩියාව හා නඩත්තුව කළ යුතු බවද, ඒ සඳහා වූ නීතිමය රාමුවක් හඳුන්වා දීම අත්‍යවශ්‍ය බවද එම වාර්තාවෙන් පෙන්වා දෙනු ලැබීය.

පසුකාලීනව ජාතික නිවාසකරණ වැඩපිළිවෙළ සඳහා සක්‍රීයව දායකත්වය දැක් වූ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, නිවාස සැළසුම් මධ්‍යස්ථානය, නාගරික සංවර්ධන අධිකාරිය සහ ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන බිහිවීම කෙරෙහිද මෙම සැසි වාර්තාවේ නිරීක්ෂණ සහ නිර්දේශ බෙහෙවින් ඉවහල් වී ඇතැයි පැවසිය හැකිය.

එසේම මෙම නිර්දේශවලට පදනම්ව පිහිටුවන ලද නිවාස අරමුදල හරහා ජාතික නිවාස දෙපාර්තමේන්තුව විසින් නිවාස යෝජනා ක්‍රම රැසක් ආරම්භ කරන ලද අතර රජයේ නිළ නිවාස ලෙස ටොරින්ටන් නිවාස යෝජනා ක්‍රමය ඇති කිරීම, මධ්‍යම පාන්තිකයන් වෙනුවෙන් ඇන්ඩර්සන් මහල් නිවාස යෝජනා ක්‍රමය ඇති කිරීම වැනි උදාහරණ ඒ යටතේ පෙන්වා දිය හැකිය.

1970 **දශකයෙන් පසු යුගය**

1970 දශකයෙන් පසුව රජය මැදිහත්වීමෙන් සහාධිපත්‍ය දේපළ (බද්ධ නිවාස සංකීර්ණ) ඉදිකිරීම වේගවත් වූ අතර, එම බද්ධ නිවාස සංකීර්ණ ලියාපදිංචිය, පරිපාලනය ආදිය පිළිබඳව 1970 අංක 12 දරණ සහාධිපත්‍ය දේපළ පනත හඳුන්වා දෙනු ලැබුවද, එම පනත ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීය. පසුව 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත ක්‍රියාත්මක කිරීමෙන් මෙම ක්ෂේත්‍රයේ ගැටළුවලට විසඳුම් ලබා දීමට බලාපොරොත්තු වුවද, විශේෂයෙන්ම කළමනාකරණය හා නඩත්තුව සම්බන්ධයෙන් පදිංචිකරුවන්ගේ සහභාගීත්වය වඩාත් පුළුල් මට්ටමකට ලබා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදය එම පනත තුළද අන්තර්ගත නොවීය. එම සහභාගීත්ව කළමනාකාරිත්ව අරමුණු ඉටු කර ගැනීම සඳහා දේපළෙහි පොදු අංගෝපාංග හා පොදු පහසුකම් කළමනාකරණය කිරීමේ වගකීම ඉටු කර ගැනීම සඳහා 1982 අංක 45 දරණ සංශෝධන පනත හඳුන්වා දෙන ලදී.

එමඟින් බද්ධ නිවාස අයිතිකම් සංශෝධන පනතට සහාධිපත්‍ය මහල් නිවාස කළමනාකරණය සහ නඩත්තුව සඳහා නිවාසවාසීන්ගේ දායකත්වය වඩාත් පුළුල් අන්දමින් ලබා ගැනීමේ ක්‍රමවේදය මඟින් කළමනාකරණ සංස්ථා නැමැති ව්‍යුහය පිහිටුවීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සළසන ලදී.

1970/80 දශකය ලංකාවේ නිවාස හා නාගරික සංවර්ධනයේ මූලෝපායන් පිළිබඳව ගැටළු ගැඹුරු ලෙස අධ්‍යයනය කළ වකවානුවකි. 1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල පනත මඟින් පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පොදු පහසුකම් මණ්ඩලය පිහිටුවීය. 1973 අංක 01 දරණ නිවාස දේපළ උපරිම පනත යටතේ අවසරලත් නිවාස සංඛ්‍යාවට වඩා වැඩිපුර නිවාස, ජාතික නිවාස කොමසාරිස් වෙත පවරන ලදී. මේ සමඟ ජාතික නිවාස කොමසාරිස්වරයා වෙත පවරන ලද පේළි නිවාස, වතු නිවාස හා මහල් නිවාසවල පොදු පහසුකම් හා පොදු අංගෝපාංග නඩත්තු කිරීම කළමනාකරණය පොදු පහසුකම් මණ්ඩලයට පවරන ලදී. එමෙන්ම 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත මඟින් නාගරික සංවර්ධන අධිකාරියද, 1979 අංක 01 දරණ පනත මඟින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියද පිහිටුවීම මෙම ක්ෂේත්‍රයේ ඇති වූ පෙරළිකාර පියවරයන් විය.

1986 දී සකසන ලද කොළඹ නගර සැළැස්ම එළිදක්වමින් නාගරික ජන සංකේන්ද්‍රයන්ට ඔරොත්තු දෙන නව ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වාදීමට රජය උත්සාහ කළ අතර, ඒ යටතේ පවා රජය වෙනුවෙන් සහාධිපත්‍ය දේපළ ඉදිකිරීමේ පුරෝගාමියා වූයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියයි. පෞද්ගලික අංශය මෙම කටයුතු සඳහා සම්බන්ධ වූයේ ඉතා අල්ප වශයෙනි.

1970/80 දශකයේ සහාධිපත්‍ය දේපළ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රධාන දායකත්වය දරණ ලද්දේ රජය වූ අතර, එම නිවාස ප්‍රධාන වශයෙන් බදු හෝ කුලී පදනම මත ලබා දීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය. ඒ අනුව එම දේපළවල පොදු පහසුකම් හා පොදු අංගෝපාංග නඩත්තුව පදිංචිකරුවන්ගේ වගකීමක් නොවූ අතර, එම වගකීම පැවරුනේ අයිතිය හිමි පාර්ශවය වූ රජය හෙවත් නිවාස දෙපාර්තමේන්තුව වෙතය. 1979 අංක 17 දරණ පනතින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමෙන් අනතුරුව එම අධිකාරිය වෙත පැවරුණු ඉහත කී දේපළවල නඩත්තු සහ අළුත්වැඩියා කටයුතු ඉටුකර ගැනීමේ ආයතනය ලෙස එවක පැවති පොදු පහසුකම් මණ්ඩලය උපයෝගී කර ගැනුණි. කෙසේනමුදු 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනතින් අරමුණු වූ සහාධිපත්‍ය දේපළ ඉදිකිරීම් සහ ලියාපදිංචිය, අයිතිය බැහැරකිරීම පිළිබඳව ප්‍රතිපාදන වලට අනුකූලව කටයුතු කිරීමක් සිදු නොවීය.

1982 අංක 45 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත, කළමනාකරණ සංස්ථා සංකල්පය හඳුන්වා දුන් නමුත් ඉහත කී පදනම නිසා එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීය.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවීම.

පුද්ගලික දේපළ සංවර්ධකයින් විසින් ලාභ ලැබීමේ අරමුණෙන් සභාධිපත්‍ය දේපළ ඉදි කිරීම නිසා එම සභාධිපත්‍ය දේපළ නියාමනය කිරීම සඳහා රාජ්‍ය අධිකාරියක අවශ්‍යතාව පැන නැගුණි. සභාධිපත්‍ය දේපළ ඉදිකිරීමෙන් පසු ඊට අදාළ සභාධිපත්‍ය පිඹුර හා ප්‍රකාශණ ලියාපදිංචි කරවීම, එසේ ලියාපදිංචි කිරීමට පෙරාතුව එම දේපළේ පොදු අංගෝපාංග සඳහා සහතිකයක් ලබා දීම, ලියාපදිංචි කිරීමෙන් පසු ඇති වන කළමනාකරණ සංස්ථාවේ සියළුම කටයුතු නියාමනය, සභාධිපත්‍ය දේපළෙහි විවිධ පාර්ශවයන් අතර පොදු දේපළ සම්බන්ධයෙන් ඇති වන ආරවුල් නිරාකරණය, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම, දේපළ නැවත සංවර්ධනය සඳහා සියළු බලතල සහිතව ක්‍රියාත්මක කිරීමට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවමින් 1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල පනත 2003 අංක 24 දරණ පනතින් සංශෝධනය කරන ලද අතර, සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ස්ථාපනය වූයේ එම පනතෙනි.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කාර්යභාරය

ශ්‍රී ලංකාවේ සභාධිපත්‍ය ඉදිකිරීම් ආශ්‍රිත මෑතකාලීන ප්‍රවණතා පිළිබඳව සැලකිළිමත්වීමේදී පෙනී යන්නේ නාගරික සහ තදාසන්න ප්‍රදේශ තුළ සභාධිපත්‍ය ජනාවාස කෙරෙහි මින් පෙර නොවූ විරූ තරමේ ඉල්ලුමක් ඇති වී තිබෙන බවයි. ඒ අනුව එම ඉල්ලුමට ගැළපෙන පරිදි ජනතාවගේ නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කර දීම පිණිස රාජ්‍ය සහ පෞද්ගලික යන ප්‍රධාන අංශ ද්විත්වයම එක්ව සභාධිපත්‍ය ජනාවාස ඉදිකිරීමේ වැඩි නැඹුරුවක් ඇති වී තිබේ.

එහිදී ඉදිකරනු ලබන සභාධිපත්‍ය දේපළ අදියරයන් අවස්ථා 03 කදී ලියාපදිංචි කිරීම සඳහා එනම්, තාවකාලික සභාධිපත්‍ය දේපළ, අර්ධ සභාධිපත්‍ය දේපළ හා පූර්ණ සභාධිපත්‍ය දේපළ වශයෙන් අවස්ථාව සළසාදීමට 2003 අංක 39 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත සම්මත කරන ලදී.

එමෙන්ම සභාධිපත්‍ය සහතිකය නිකුත් කිරීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා, අනුකූලතා සහ රෙගුලාසි ගාස්තු මෙන්ම අයදුම්පත්‍ර සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත්ව 2017 ජූලි 15 අංක 2026/25 අංකය යටතේ අතිවිශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කිරීමටද කටයුතු කර තිබේ.

සභාධිපත්‍ය දේපළ ඉදිකිරීම විවිධ රාජ්‍ය ආයතන මඟින් සිදු කිරීම තුළින් විධිමත් පරිදි දේපළ පවරා දීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් සැළකිය යුතු නිවාසලාභීන් ප්‍රමාණයකට එම දේපළ පවරාදීමට හැකියාව නොලැබුණි. මෙම තත්ත්වය සැළකිල්ලට ගෙන රජයට හෝ රජයේ නියෝජිත ආයතනයකට අයිති ඇතැම් සභාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම සහ බැහැර කිරීම සඳහා පහසුකම් සැළසීමට මෙන්ම ඒ හා සම්බන්ධ හෝ එයට අනුශාංගික කාරණා සඳහා විධි විධාන සැළැස්වීමට 2018 අංක 23 දරණ බද්ධ නිවාස විශේෂ විධි විධාන පනත හඳුන්වා දෙනු ලැබීය.

මේ අනුව සභාධිපත්‍ය දේපළ ඉදිකරන්නන්ට මෙන්ම මහල් නිවාසවාසීන්ට වඩාත් උසස් ජීවන තත්ත්වයක් අත්කර දීම අපේක්ෂා කරමින් මෙම ක්ෂේත්‍රයට අයත් සියළු අංශ නියෝජනය කරනු ලබන සේවාදායක ආයතන හා වෘත්තීයවේදීන්ගේ අදහස් හා යෝජනා ලබා ගනිමින් සභාධිපත්‍ය ක්ෂේත්‍රයට අයත් වන සභාධිපත්‍ය නීති පද්ධතිය, කාලීන අවශ්‍යතාවන් සේ සළකා සංශෝධනය කිරීමට දැනට කටයුතු කෙරෙමින් පවතින අතර, ඒ අනුව 1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල පනත සහ 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත සංශෝධනය වීමට නියමිතය.

සභාධිපත්‍ය නිවාසකරණයේ සන්ධිස්ථාන 1959 - 2020

1959 ලංකාවේ නිවාස ගැටළුව සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට කමිටුවක් පත් කිරීම.

1963 ශ්‍රී ලංකාවේ නිවාස ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වූ ප්‍රථම ප්‍රතිපත්ති ප්‍රකාශනය එළි දැක්වීම.

1970 1970 අංක 12 දරණ සභාධිපත්‍ය දේපළ පනත මඟින් සභාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් වූ නීතිමය ප්‍රතිපාදන හඳුන්වාදීම.

1973 1973 අංක 01 දරණ දේපළ උපරිම පනතින් මහල් හා බද්ධ නිවාස පාලනයට පුළුල් බලතල පැවරෙන පරිදි 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත ස්ථාපිත කරන ලදී. එමඟින් 1972 අංක 12 දරණ පනත ඉවත් කෙරුනු අතර මහල් නිවාස ඒකක අයිතිකරුවන්ගෙන් සැදුම්ලත් සංගමයක් හෝ මණ්ඩලයක් පිහිටුවා ගැනීම නීත්‍යානුකූල බවට ප්‍රතිපාදන සලසන ලදී. එමෙන්ම එම දේපළ නඩත්තුව සඳහා පොදු පහසුකම් මණ්ඩලය පිහිටුවීම 1973 අංක 10 දරණ පනතින් සිදු කරන ලදී.

1982 කළමනාකරණ සංස්ථා ක්‍රමය හඳුන්වාදීම සිදුකෙරුණේ 1982 අංක 45 දරණ බද්ධ නිවාස අයිතිකම් සංශෝධන පනතින් වන අතර කළමනාකරණ සංස්ථා ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා වන බලතල එම පනතේ අඩංගු විය.

2003 සභාධිපත්‍ය දේපළ ඉදිකිරීමෙන් පසු එයට අදාළ සභාධිපත්‍ය පිඹුර හා ප්‍රකාශණය ලියාපදිංචි කරවීම, එසේ ලියාපදිංචි කිරීමට පෙරාතුව එම දේපළේ පොදු අංගෝපාංග සඳහා සහතිකයක් ලබාදීම, ලියාපදිංචි කිරීමෙන් පසු ඇතිවන කළමනාකරණ සංස්ථාවේ සියළුම කටයුතු නියාමනය, සභාධිපත්‍ය දේපළේ විවිධ පාර්ශවයන් අතර පොදු දේපළ සම්බන්ධයෙන් ඇතිවන ආරවුල් නිරාකරණය, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම, දේපළ නැවත සංවර්ධනය සඳහා සියළු බලතල සහිතව ක්‍රියාත්මක කිරීමට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවමින් 1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල පනත 2003 අංක 24 දරණ පනතින් සංශෝධනය කරන ලද අතර, සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ස්ථාපනය වූයේ එම පනතෙනි. තවද, සභාධිපත්‍ය දේපළක් තාවකාලික අර්ධ සහ පූර්ණ ලෙස අවස්ථා 03 කදී ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචියට අවස්ථාව සළසාදීම සඳහා 2003 අංක 39 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත සම්මත කරන ලදී.

2017 සභාධිපත්‍ය සහතිකය නිකුත් කිරීම සඳහා සපුරාලිය යුතු මූලික අවශ්‍යතා, අනුකූලතා සහ රෙගුලාසි ගාස්තු මෙන්ම අයදුම්පත්‍ර සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත්ව 2017 ජූලි 15 අංක 2026/25 අංකය යටතේ අති විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කරන ලදී.



සභාපතිතුමාගේ පණිවිඩය

> මහල් නිවාසවාසීන්ගේ පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් සම්බන්ධයෙන් වන රාජ්‍ය නියාමන අධිකාරිය ලෙස නිවාසවාසීන්ගේ සහ ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා 2020 වසර තුළදී වැදගත් ප්‍රතිපත්තිමය සහ පරිපාලනමය තීරණ රැසක් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය හඳුන්වාදෙනු ලැබීය.

දූරදර්ශී ලෙස නියාමන අවශ්‍යතා සැළසුම් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සභාධිපත්‍ය දේපළ ක්ෂේත්‍රයට පරිබාහිර වූ කොවිඩ් - 19 වසංගත තත්ත්වය තුළ පවා අපගේ මෙහෙයුම් කටයුතු සහ උපායමාර්ගික ක්‍රියාමාර්ගයන් ක්‍රමානුකූලව ඉදිරිය කරා රැගෙන යාමට අපට හැකි වීම අතිශයින් සතුටුදායක කරුණකි.

සැබැවින්ම මෙම කාල වකවානුව අප කාටත් දුෂ්කර ව්‍යායාමයක් බවට පත් වූ අතර, ඉදිරි කාල සීමාවද මෙවැනි යම් යම් දුෂ්කරතා සමඟින් ගමන් කිරීමට සිදු වන නිසා එය බෙහෙවින් අභියෝගාත්මක කරුණක් වන බවට සැකයක් නැත.

වසංගතය හේතුවෙන් ගෝලීය ආර්ථිකයේ ඇති වූ පසුබෑම හා සමඟාමීව 2020 වසරේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 3.6% කින් සංකෝචනය විය. ආර්ථිකයේ සෑම අංශයකටම මූර්ත ආර්ථික කටයුතුවලට විමඟින් බාධා එල්ල වූ අතර සභාධිපත්‍ය ක්ෂේත්‍රයේ ඉදිකිරීම්ද සැළකිය යුතු ලෙස පසුබෑමකට ලක් විය. එකී දුෂ්කර තත්ත්වය යටතේ වුවද 2019 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ආදායම 2.6% කින් ඉහළ නංවා ගැනීමටද, ශුද්ධ ලාභය 81% කින් වර්ධනය කර ගැනීමට හැකිවීමද, මෙහෙයුම් හා නඩත්තු වියදම් 8% කින් අඩු කර ගැනීමට හැකිවීමද අප ලැබූ ජයග්‍රහණයකි.

සභාධිපත්‍ය දේපළ නියාමන අධිකාරිය ලෙස අපගේ දිගු කාලීන දැක්ම වනුයේ “ සවිමත් කළමනාකරණ සංස්ථාව සුවපහසු මහල් නිවාස ජීවන රටාවක සවියයි.” වීම කරුණ කේන්ද්‍ර කොටගෙන ගොඩ නැඟී ඇති අතර, සභාධිපත්‍ය ව්‍යවසාය හා කළමනාකරණ සංස්ථා පරිපාලනය, නඩත්තුව සහ කළමනාකරණය ඉලක්ක කර ගෙන නිරතුරුවම ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කිරීමට ලැබීම සතුටට කරුණකි.

මෙරට පසුගිය දශක 04 ක පමණ කාලය තුළ සිදු වූ ශීඝ්‍ර නාගරික සංවර්ධනය හේතුවෙන් එහි ප්‍රතිඵල භුක්ති විඳීමට කැමති ග්‍රාමීය ජනතාව ග්‍රාමීය භූමියේ සිට නාගරික ප්‍රදේශ කරා සංක්‍රමණය වීම නිසා නාගරික හා තදාසන්න ප්‍රදේශවල විශාල නිවාස ඉල්ලුමක් ඇති විය. ඊට සංකල්පයක් ලෙස බිහි වූ මහල් නිවාසයන් හි සභාධිපත්‍ය දේපල නියාමනය සඳහා අප අධිකාරියේ කාර්යයභාරය ව්‍යවස්ථාපිත නීති සංශෝධනයන් මඟින් විරින්වර පුළුල් විය.

නියාමන අධිකාරියක් ලෙස සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය 17 වන වියට පා තබන්නේ ලොවම ගොදුරු කරගත් දරුණු වසංගත තත්ත්වයක් මත ගොඩනැගුණා වූ අනේකවිධ බාධාවන් බිඳගෙන ජයග්‍රහණය කරා පිය මැනීමේ නොසැලෙන අධිෂ්ඨාන ශක්තියෙනි.

තිරසාර දිගු දැක්මක් ඇතිව ජයග්‍රාහී ඉලක්කයන් රාශියක් සපුරා ගැනීමේ බලාපොරොත්තුවෙන් 2020 වසර කරා අප පිය නැගුනේ ගරු ජනාධිපතිතුමන්ගේ සෞභාග්‍යයේ දැක්මෙහි දස වැදෑරුම් ප්‍රතිපත්තිවලට අනුව තිරසර පරිසර සංකල්පයක් ඉටු කර ගැනීමේ අභිලාෂයෙනි.

ජාතියේ ආහාර සුරක්ෂාව වෙනුවෙන් රජය විසින් ආරම්භ කරනු ලැබූ “හෙට දිනය වෙනුවෙන් අද වවමු.” වගා සංග්‍රාම ව්‍යාපෘතිය සඳහා සභාධිපත්‍ය මහල් නිවාසවාසීන් සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරනු ලැබූ අතර, විමඟින් එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන උපාය මාර්ග - අංක 17 සඳහාද ප්‍රවේශයක් ලබාදීමට අධිකාරියට හැකි විය.

තවද, නිවාස ව්‍යාපෘතීන් හි ප්‍රජා සහභාගීත්වයෙන් රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකි වීම තුළින් පරිසර සංරක්ෂණය හා GO GREEN සංකල්පය ක්‍රියාවට නැංවීමටද හැකි විය.

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව යමින් ශ්‍රී ලංකාවට ආවේණික වන්නා වූ පරිසර හිතකාමී මෙන්ම මානව හිතකාමී ඉදිකිරීම් කර්මාන්තයක් ඇසුරෙන් ජාත්‍යන්තරය ජය ගැනීමට අවශ්‍ය පරිසරය සැකසීම කෙරෙහි

වන අප ආයතනික දායකත්වය මැනවින් සහ වඩාත් සංවිධානාත්මකව ලබා දීම කෙරෙහි අප කටයුතු කරමින් පවතින බැව් මෙම අවස්ථාවේදී දන්වා සිටින්නේ ඉමහත් සතුටකින් යුක්තවය.

“සෑම දෙනාටම නිවසක අවශ්‍යතාවය තිබුණත් එම අවශ්‍යතාව තනිව සම්පූර්ණ කරගන්න බැරි බව අප දන්නා අතර, අපගේ රජය කාලයේ නිවාස ප්‍රශ්ණයෙන් විශාල වශයෙන් පීඩාවට පත් වී සිටි නාගරික අඩු ආදායම්ලාභී ජනතාවගේ නිවාස අවශ්‍යතාව විසඳන අතරම ඔවුනට නව ජීවන ක්‍රමයක් හදුන්වාදීමට අප නාගරික මෙන්ම ග්‍රාමීය ජනතාවගේත් නිවාස අවශ්‍යතාව ඔවුන්ගේ ජීවන මට්ටමින් ඉහළ යන ආකාරයෙන් විසඳිය යුතුය” යන්න සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි දැක්වේ. ඒ අනුව මහල් නිවාසවාසීන්ගේ පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් සම්බන්ධයෙන් වන රාජ්‍ය නියාමන අධිකාරිය ලෙස නිවාසවාසීන්ගේ සහ ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා 2020 වසර තුළදී වැදගත් ප්‍රතිපත්තිමය සහ පරිපාලනමය තීරණ රැසක් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය හඳුන්වාදෙනු ලැබීය.එමෙන්ම සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන්ව ඇති පරිදි නිවාසකරණය සහ බැඳුණු රජයේ ඉදිරි කාලීන ප්‍රතිපත්තිමය ස්ථාවරයන් ඒ අයුරින්ම ක්‍රියාවට නැංවීම උදෙසා වන කාර්යක්ෂම යාන්ත්‍රණයක් ක්‍රියාවට නැංවීමට 2021 ක්‍රියාකාරී සැළැස්ම මඟින් සැළසුම් කර ඇත. තවද, මනුෂ්‍ය වාසයට නුසුදුසු අන්තරායකර මට්ටමේ පවතින ගර්හිත මහල් නිවාස නැවත සංවර්ධනය කිරීමේ සැළසුම් සහ යෝජනා රජයට ඉදිරිපත් කිරීමටද කටයුතු සිදු කරමින් පවතී.

2020 නව වසර අප සුබවාදීව බලාපොරොත්තු සහිතව ආරම්භ කළත් එම බලාපොරොත්තු අභියෝගයට ලක් කරමින් කොවිඩ් - 19 නම් දරුණු ගෝලීය වසංගතය රටම වෙළා ගනු ලැබුයේ අනපේක්ෂිත ගැටළුකාරී තත්වයන් රාශියක් උදා කරමිනි. ඒ අනුව ගෝලීය ආර්ථිකය දැඩි කඩා වැටීමකට ලක් වූ අතර දේශීය ආර්ථිකයටද ඉන් දැඩි බලපෑමක් ඇති විය.

මෙම තත්ත්වය යටතේ අප අධිකාරියට දැඩි දුෂ්කරතා වලට මුහුණ පෑමට සිදු වූ අතර අපගේ ඉලක්ක කරා ගමන් කිරීමට සෞඛ්‍ය නිර්දේශ මත පනවා තිබූ සංචරණ සීමා මෙන්ම කොවිඩ් 19 වසංගතය ව්‍යාප්ත වීම වැළැක්වීමට ගෙන තිබූ ක්‍රියාමාර්ගද බලපෑම් එල්ල කරන ලදී.

දුෂ්කර තත්ත්වයක් යටතේ වුවද සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය මෙරට මහජනතාව වෙනුවෙන් ප්‍රශස්ථ මැදිහත්වීමක් දක්වමින් ජාතික යුතුකමක් තම වගකීම ලෙස සළකා කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් පීඩා විඳි අයගේ සෞඛ්‍යමය තත්ත්වය නඟා සිටුවීම වෙනුවෙන් කොවිඩ් අරමුදලට රු. මි. 10 ක් පරිත්‍යාග කරන ලදී.

අප අධිකාරියේ ප්‍රධාන ආදායම් උපාය මාර්ගය වූ සභාධිපත්‍ය සහතික ලබාදීමේ ක්‍රියාවලියට දැඩි බලපෑමක් එල්ල විය.

සංචරණ සීමා සහ ඇඳිරිනීතිය පැනවීම නිසා දේපළ සංවර්ධකයින් විසින් සභාධිපත්‍ය දේපළ ඉදිකිරීමට මන්දගාමී විය. මේ හේතුවෙන් අප බලාපොරොත්තු වූ ඉලක්කයන් කරා යාමට නොහැකි වුවත් රටෙහි ආර්ථිකයට යම් දායකත්වයක් ලබා දෙමින් 2020 වර්ෂය තුළ ලාභ ඉපයූ රාජ්‍ය ආයතන කිහිපය අතරට පත්වීම සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ලැබූ විශිෂ්ඨ ජයග්‍රහණයකි.

එමෙන්ම රජයේ නිවාස වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීම උදෙසා සක්‍රීයව දායක වන අනෙකුත් ආයතන වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වැනි ආයතන සමඟ වඩාත් අවබෝධයකින් සහ අන්තර් සම්බන්ධතාවකින් යුතුව කටයුතු කිරීමේ වැදගත්කම අප හඳුනාගෙන ඇති අතර, ඒ ඔස්සේ අප අධිකාරිය වෙත පැවරී ඇති විෂය පථය වඩාත් සාර්ථක අන්දමින් ඉටු කිරීමට ඇති හැකියාව වර්ධනය කර ගැනීමටද අපේක්ෂා කරන්නෙමු.

සභාධිපත්‍ය දේපළ ක්ෂේත්‍රයට නියාමනය සපයමින් මූල්‍ය අභියෝගයන් ජය ගනිමින් සාර්ථකත්වය කරා පියමැනීමේ ධෛර්යය හා විශ්වාසය අප සතුය. මෙවන් අභියෝගාත්මක සමයක සිට විගණනය කරන ලද මූල්‍ය වාර්තාවද ඇතුළත්ව 2020 වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරනුයේ සතුටුදායක හැඟීමකින් යුතුවය.

ස්තූතිය

අධිකාරියේ 2020 වර්ෂයේ කාර්යය සාධනයට දායක වූ සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු කාර්යය මණ්ඩලයේ සියළුම සේවකයින්ටත්, අධිකාරියේ කටයුතුවලදී සහාය දැක්වූ සියළු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ප්‍රධානීන්ටත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු සාමාජිකයින්ටත් ස්තූතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. තවද, අධිකාරියේ ගමන්මඟ තිරසාර ලෙස සකස් කර ගැනීමට උපදෙස් දෙමින් අප ධෛර්යයමත් කළ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය ගරු අග්‍රාමාත්‍යතුමාටත් නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමන්ටත් ලක් රජයටත් ස්තූතිය පළ කර සිටිමි. තවද, අමාත්‍යංශ ලේකම්, අතිරේක ලේකම්වරු ඇතුළු කාර්යය මණ්ඩලයටත් එසේම විගණක හා කළමනාකරණ කමිටුවේ සාමාජික මහත්ම මහත්මීන්ටත් අධිකාරියේ කටයුතුවලදී දක්වන ලද සහයෝගය පිළිබඳව ස්තූතිය පළ කර සිටින්නෙමි.

නීතීඥ සරණ කරුණාරත්න
සභාපති
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

2019 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ආදායම 2.6% කින් ඉහළ නංවා ගැනීමටද, ලාභය 81% කින් වර්ධනය කර ගැනීමට හැකිවීමද, මෙහෙයුම් හා නඩත්තු වියදම් 8% කින් අඩු කර ගැනීමටද හැකිවීම.

“ සවිමත් කළමනාකරණ සංස්ථාව සුවපහසු මහල් නිවාස ජීවන රටාවක සවියයි.” තේමාව කේන්ද්‍ර කොටගෙන ගොඩ නැඟී ඇති සභාධිපත්‍ය ව්‍යවසාය හා කළමනාකරණ සංස්ථා පරිපාලනය, නඩත්තුව, කළමනාකරණය ඉලක්ක කර ගෙන නිරතුරුවම ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් කටයුතු කිරීම.

දරුණු වසංගත තත්වයක් මත ගොඩනැගුණා වූ අනේකවිධ බාධාවන් බිඳගෙන ජයග්‍රහණය කරා පිය මැනීමේ නොසැලෙන අධිෂ්ඨාන ශක්තිය

ජාතියේ ආහාර සුරක්ෂාව වෙනුවෙන් රජය විසින් ආරම්භ කරනු ලැබූ “හෙට දිනය වෙනුවෙන් අද වවමු.” වගා සංග්‍රාම ව්‍යාපෘතියට සභාධිපත්‍ය මහල් නිවාසවාසීන් දායක කර ගැනීම.

රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හැකි වීම තුළින් පරිසර සංරක්ෂණය හා GO GREEN සංකල්පය ක්‍රියාවට නැංවීම.

මනුෂ්‍ය වාසයට නුසුදුසු අන්තරායකර මට්ටමේ පවතින ගර්හිත මහල් නිවාස නැවත සංවර්ධනය කිරීමේ සැළසුම් සහ යෝජනා රජයට ඉදිරිපත් කිරීම.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය මෙරට මහජනතාව වෙනුවෙන් ප්‍රශස්ථ මැදිහත්වීමක් දක්වමින් ජාතික යුතුකමක් තම වගකීම ලෙස සළකා කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් පීඩා විඳි අයගේ සෞඛ්‍යමය තත්ත්වය නඟා සිටුවීම වෙනුවෙන් කොවිඩ් අරමුදලට රු. මි. 10 ක් පරිත්‍යාග කිරීම.

රටෙහි ආර්ථිකයට දායකත්වයක් ලබා දෙමින් 2020 වර්ෂය තුළ ලාභ ඉපයූ රාජ්‍ය ආයතන කිහිපය අතරට පත්වීම.

සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය



> සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල සහාධිපත්‍ය දේපළ භාවිතාව දශක ගණනාවක සිට ක්‍රමිකව වර්ධනය වෙමින් පවතී. නාගරික හා තදාසන්න ප්‍රද්ශයන්හි අධික ජනගහණත්වය හේතුවෙන් ඉඩම් හිඟය, ඉඩම් මිල ඉහළ යාම ආදී හේතු නිසා පවතින නිවාස ඉල්ලුම සපුරාලිය හැක්කේ සහාධිපත්‍ය සංකල්පයට පමණි.

2020 දෙසැම්බර් 31 න් අවසන් මූල්‍ය වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය වාර්තාව සමඟ 2020 වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

පිටුසුම

2020 වසර ගෝලීයව හා දේශියව අභියෝග රැසකින් සමන්විත වූ වසරකි. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට එම අභියෝගයන්ගෙන් ලත් පන්නරයෙන් සහාධිපත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් විශේෂ කාර්යභාරයක් සිදු කිරීමට හැකි විය.

නූතන නාගරික ජනාවාසකරණය පිළිබඳ කරුණු සාරාංශගත කිරීමේදී මූලික වශයෙන් පෙන්වා දිය යුතුව ඇත්තේ මෙම විෂය පථය නිරන්තරවම යාවත්කාලීන වන නව ප්‍රවණතා සමඟින් පොදුවේ සමාජයීය සහ මානව අවශ්‍යතාවන් සපුරාලමින් රටේ ආර්ථික ජීවනාලිය කෙරෙහි පුරෝගාමී දායකත්වයක් දක්වන ක්ෂේත්‍රයක් වන බවයි.

2019 වර්ෂයේ සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයත් සමඟ ඉදිකිරීම් හා ඉදිකිරීම් ආයෝජනයන් සඳහා පෙළඹවීම මන්දගාමී වීම නිසා සහාධිපත්‍ය ක්ෂේත්‍රයද මහත් පසුගාමී තත්ත්වයක් වාර්තා කරන ලදී.

එය සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ආදායම් උත්පාදනය සඳහා බලපෑමක් වූවද සහාධිපත්‍ය නියාමන අධිකාරිය ලෙස අපගේ සේවාලාභීන්ට තෘප්තිමත් සේවා දායකත්වයක් ලබාදීමට හැකි විය.

අනපේක්ෂිත ලෙස විධායක හා මෙහෙයුම් සැළසුම් අඩපණ කරමින් 2020 වසරේදී ගෝලීය කොවිඩ් වසංගත තත්වය එළඹීම නිසා පූර්ව සංවර්ධන උපාය මාර්ග හා කළමනාකරණ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම, පුද්ගල මෙන්ම සමාජ දුරස්ථභාවය හේතුවෙන් යම් පසුබෑමකට ලක් වුවද, අධිකාරියේ කාර්යය මණ්ඩලයේ දායකත්වය නිසා එකී තත්ත්වයද යම් ප්‍රමාණයකට සමනය කර ගැනීමට හැකි විය.

මෙහෙයුම් සවිය

2020 අවසාන භාගයේදී තත්ත්වය යම් තරමක් පාලනය වූ බැවින් උපාය මාර්ගික උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස ආදායම් වර්ධන වේගය 2019 වර්ෂයට සාපේක්ෂව 2.6% කින් වර්ධනය කර ගැනීමට හැකි විය.

අධිකාරිය මඟින් සහාධිපත්‍ය සහතික නිකුතුවෙන් හා කළමනාකරණ සංස්ථා ලියාපදිංචිය සහ නැවත අළුත් කිරීම ආදී ආදායම් උත්පාදන මූලෝපායන්ගෙන් රු. මි. 203.72 ක් උත්පාදනය කර ගන්නා ලදී.

බදු ගෙවීමෙන් අනතුරුව ශුද්ධ ලාභය රු. මි. 32.6 ක් විය. එම අගය 2019 වර්ෂයේදී ලබාගත් ලාභය හා සසඳා බැලීමේදී 81% ක වර්ධනයකි.

ආසියානු සංවර්ධන බැංකුවේ පුරෝකථනයන්ට අනුව 2020 වසරේදී 55% කින් පසුබෑමකට ලක් වූ මෙරට දළ දේශිය නිෂ්පාදනය, එම මූල්‍ය වර්ෂයේ දෙවන හා තෙවන කාර්තුවල දේශියව කොවිඩ් තත්වය නැවත නැවතත් හිස එස වූ බැවින් දේපළ සංවර්ධන ක්ෂේත්‍රයට තම ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ අතර සංකෝචනය වූ දළ දේශිය නිෂ්පාදිත අගය අනුව ඉහත අගයන් අප අධිකාරිය ලබාගත් සුවිශේෂී ජයග්‍රහණයකි.

පරිපාලන වියදම් අවම මට්ටමකින් පවත්වාගෙන යාම තුළින් පොදු කාර්යය පිරිවැය 2019 වර්ෂයට වඩා 2020 වර්ෂයේදී 8% කින් අඩු කර ගැනීමට හැකි විය.

සවිමත් කළමනාකරණ සංස්ථාවක් සුව පහසු මහල් නිවාස ජීවන රටාවක්

සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල සහාධිපත්‍ය දේපළ භාවිතාව දශක ගණනාවක සිට ක්‍රමිකව වර්ධනය වෙමින් පවතී. නාගරික හා තදාසන්න ප්‍රද්ශයන් හි අධික ජනගහණත්වය හේතුවෙන් ඉඩම් හිඟය, ඉඩම් මිල ඉහල යාම ආදී හේතු නිසා පවතින නිවාස ඉල්ලුම සපුරාලිය හැක්කේ සහාධිපත්‍ය සංකල්පයට පමණි.

රාජ්‍ය අංශය මෙන්ම පෞද්ගලික අංශය මඟින් ඉදිකළ සභාධිපත්‍ය නිවාසවාසීන්ගේ පොදු අංගෝපාංග හා පොදු පහසුකම් සම්බන්ධයෙන් රාජ්‍ය නියාමන ආයතනය වූ අපි මෙම දුෂ්කර වකවානුවේදී ඔවුනට රැකවරණයක් විය. ඒ අනුව කළමනාකරණ සංස්ථා / කළමනාකරණ කමිටු මඟින් 2020 වර්ෂය තුළ ලැබුණු පැමිණිලි 512 කින් 416 කටම සේවාලාභියා තෘප්තිමත් වන ආකාරයේ විසඳුම් ලබාදීමට හැකිවිය. තවද, පරික්ෂණ සහා වෙත යොමු වූ ආරවුල් 51 කින් 32 ක්ම සමථකරණයට ලක් කරන ලදී.

සමාජ ආරක්ෂණ දායකත්වය

සංකෝචනය වූ ආර්ථික තත්ත්වයක් යටතේ වුවද, 2020 කොවිඩ් වසංගතයට මුහුණ දීම සඳහා රජය මඟින් ඉටු කළ නිරෝධායන වැඩසටහන ලෝකයේ අනෙකුත් රටවල් අභිබවා රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ගනු ලැබූ විශිෂ්ඨ ක්‍රියාදාමයකි. එහිදී සමාජ ආරක්ෂණ වගකීමක් ජාතික යුතුකමක් සේ සළකා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියද කොවිඩ් මර්දන අරමුදල සඳහා සංචිත තැන්පතුවෙන් රුපියල් මිලියන 10 ක මූල්‍ය පරිත්‍යාගයක් සිදු කරන ලදී.

සභාධිපත්‍ය දේපළවල සුරක්ෂාව

2020 වර්ෂය අවසාන භාගයේදි ආදායම් උත්පාදන ප්‍රවේශය වේගවත් කරමින් දේපළ සංවර්ධකයින් විසින් අයදුම් කරනු ලැබූ සභාධිපත්‍ය සහතික පත් සඳහා පොදු පහසුකම් හා පොදු අංගෝපාංග නිසි අයුරින් ඇති බවට සහතික කරන ලද සභාධිපත්‍ය දේපළ සහ නිෂ්කාශන සහතික 137 ක් නිකුත් කිරීම තුළින් ගැනුම්කරුවන් තුළ විශ්වාසනීයත්වයක් ගොඩනැගීමට හැකි විය. එමඟින් දේපළ සංවර්ධන ක්ෂේත්‍රය උත්තේජනයකට ලක් කරලීමට හැකි වූ අතර අඩපණව තිබූ දේපළ සංවර්ධන ක්ෂේත්‍රය වේගවත් කිරීමට හැකි විය.

එසැණින් විසඳුම්

අධිකාරිය වෙත නිරන්තරයෙන්ම යොමු වන සභාධිපත්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වූ මහජන විමසීම් සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීමේ මූලෝපායක් ලෙස 0112 - 444575 ක්ෂණික දුරකථන අංකය හඳුන්වා දෙන ලදී. එමඟින් සේවාලාභීන් වෙත කාර්යාලයීය වේලාවන්වලදී ප්‍රශස්ථ සේවා දායකත්වයක් ලබාදෙනු ලැබේ.

කාලීන අවශ්‍යතාවයට ඉඩ හසර

1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල පනත හා 1973 අංක 10 දරන බද්ධ නිවාස අයිතිකම් පනත කාලීන අවශ්‍යතාවයට ගැළපෙන පරිදි සංශෝධනය කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරලීමට හැකි වූ අතර ඒ මඟින් අධිකාරියට සභාධිපත්‍ය ක්ෂේත්‍රයේ බොහෝමයක් ප්‍රායෝගික ගැටළු සඳහා විසඳුම් ලබා ගැනීමට හැකි වනු ඇත. එමඟින් දැනට වඩා පුළුල් සේවාවක් ව්‍යාප්ත කිරීමට ද හැකිවනු ඇති බව දන්වනු කැමැත්තෙමි.

ඉදිරි දැක්ම

ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කරමින් ඵලදායී සේවා වර්ධනයක් තුළින් සේවාලාභීන් වෙත තෘප්තිමත් සේවාවක් සැපයීම සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ඒකායන අරමුණයි. ඒ සඳහා 2021 ක්‍රියාකාරී සැළැස්ම හා සංයුක්ත සැළැස්ම මඟින් සැළසුම් කර ඇති අතර පනත මඟින් පැවරී ඇති අරමුණු සහ ආයතනික අරමුණු මඟින් කාර්යක්ෂම ඵලදායී තෘප්තිමත් සේවාවක් අපගේ සේවාලාභීන් වෙත සැපයෙනු ඇත.

සභාධිපත්‍ය දේපළ සංවර්ධනය කිරීමේදී තිරසර සංවර්ධන ඉලක්ක 7, 11, 15 අනුව පරිසර හිතකාමී ස්වභාවික සුනිත්‍ය බලශක්ති ප්‍රභවයන් භාවිතා කරමින් මහල් නිවාස ඉදිකිරීම, ඝන අපද්‍රව්‍ය හා කසළ කළමනාකරණය, වැසි ජල ප්‍රතිචක්‍රීකරණය ආදී පරිසර හිතකාමී ගුණාංගයන් ඇතුළත් කර සභාධිපත්‍ය දේපළ සංවර්ධනය කිරීම සඳහා දේපළ සංවර්ධකයින් දැනුවත් කිරීම තුළින් ගුණාත්මක මහල් නිවාස ජීවන සංස්කෘතියක් උදෙසා නිති මඟ පෙන්වීම් සිදු කෙරෙනු ඇත.

සභාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් සහ පොදු අංගෝපාංගවල පවතින ගැටළුවලට විසඳුම් ලබාදීම කළමනාකරණ සංස්ථාවල නඩත්තුව, පරිපාලනය, කළමනාකරණය සම්බන්ධයෙන් ගැටළු මතු වන අවස්ථාවන්හිදී ඒ සඳහා උපදෙස් ලබාදීම යනාදී කරුණු සඳහා සභාධිපත්‍ය දේපළ ඝනත්වය වැඩි ප්‍රදේශයන්හි ප්‍රාදේශීය / කළාප කාර්යාල පිහිටුවේ.

එමෙන්ම තොරතුරු තාක්ෂණය භාවිතයෙන් සේවය සේවක දෙපාර්ශවයටම කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට සහ ආයතනික ඵලදායීත්වය වර්ධනය කිරීම උදෙසා පාලන ක්‍රියාවලිය බලගැන්වෙනු ඇත. ප්‍රතිපත්ති තීරණ සහ මෙහෙයුම් සඳහා උපයෝගී කර ගැනීමට හැකි වන පරිදි සහ ප්‍රතිපත්ති සම්පාදනයේදී සභාධිපත්‍ය සම්බන්ධයෙන් වන තොරතුරු දායක කර ගැනීමට හැකි වන පරිදි ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් ජාතික සමීක්ෂණයක් සිදු කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

සභාධිපත්‍ය සංකල්පය අනාගත නිවාස අවශ්‍යතාව මූලෝපාය වන බැවින් මේ සම්බන්ධයෙන් වන නීති පද්ධතිය හා රෙගුලාසි සම්බන්ධයෙන් දේපළ සංවර්ධකයින් වෘත්තීයවේදීන් නිවාසවාසීන් ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍යයෙන් නිරන්තර දැනුවත් කිරීම් සිදු කෙරේ.

තුති පිදුම

දුෂ්කර වකවානුවක වුවත් ඉහතින් මා සඳහන් කළ ජයග්‍රහණ අත්පත් කර ගැනීමට සහය දැක් වූ සැමට මාගේ ගෞරවය පුද කරමි. මා කෙරෙහි තබා ඇති විශ්වාසය පිළිබඳව සභාපතිතුමන්ට සහ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, විගණන හා කළමනාකරණ කමිටුවටත් මාගේ කෘතඥතාව පළ කරන අතර ඔවුනගේ වටිනා මඟ පෙන්වීම අතිශයින් අගය කරමි. එමෙන්ම සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කටයුතු සිදුකරගෙන යාමේදී වෘත්තීය සමිතිවලින් ලැබුණු සහයෝගයටද කෘතඥතාව පළ කිරීමටද මෙය අවස්ථාවක් කර ගන්නා අතර අධිකාරියේ විධායක හා අනෙකුත් සේවක මහත්ම මහත්මීන්ටත් ඔවුනගේ ශක්තිය හා කැපවීම මත මෙම අභියෝගාත්මක කාලය ජයගැනීමට හැකිවීම පිළබඳව තෘප්තිමත් වන අතර ඒ පිළිබඳ ස්තුතිය ඔවුනට පුද කරමි. මෙහෙයුම් කාර්යයන් කර ගෙන යාමේදී උපදෙස් සහ සහයෝගය ලබා දුන් ගරු අග්‍රාමාත්‍ය / නිවාස අමාත්‍යමන්ත්‍රීතුමන්ට නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමන්ටත්, ලක් රජයටත්, අමාත්‍යංශ ලේකම්තුමන්ටත්, අතිරේක ලේකම්වරුන්ටත්, විගණකාධිපතිතුමන් සහ ඔහුගේ කාර්යය මණ්ඩලයටත් මම ස්තූතිවන්ත වෙමි. අවසාන වශයෙන් අපගේ සියළු පාර්ශවකරුවන්ටද ඔවුනගේ නොමඳ සහයෝගය ලබා දීම පිළිබඳව මාගේ හෘදයාංගම ඇගයීම මේ සමඟ ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

ආචාර්ය ඉඳුනිල් ලියනගේ
සාමාන්‍යාධිකාරි
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

> නූතන නාගරික ජනාවාසකරණය පිළිබඳ කරුණු සාරාංශගත කිරීමේදී මූලික වශයෙන් පෙන්වා දිය යුතුව ඇත්තේ මෙම විෂය පථය නිරන්තරවම යාවත්කාලීන වන නව ප්‍රවණතා සමඟින් පොදුවේ සමාජයීය සහ මානව අවශ්‍යතාවන් සපුරාලමින් රටේ ආර්ථික ජීවනාලිය කෙරෙහි පුරෝගාමී දායකත්වයක් දක්වන ක්ෂේත්‍රයක් වන බවයි.
>
> සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල සභාධිපත්‍ය දේපළ භාවිතාව දශක ගණනාවක සිට ක්‍රමිකව වර්ධනය වෙමින් පවති. නාගරික හා තදාසන්න ප්‍රද්ශයන් හි අධික ජනගහණත්වය හේතුවෙන් ඉඩම් හිඟය, ඉඩම් මිල ඉහල යාම ආදි හේතු නිසා පවතින නිවාස ඉල්ලුම සපුරාලිය හැක්කේ සභාධිපත්‍ය සංකල්පයට පමණි.
>
> දේපළ සංවර්ධන ක්ෂේත්‍රය උත්තේජනයකට ලක් කරලීමට හැකි වූ අතර අඩපණව තිබූ දේපළ සංවර්ධන ක්ෂේත්‍රය වේගවත් කිරීමට හැකි විය.



වමේ සිට දකුණට,
01. එන්. පී. කේ. රණවීර මහතා **02.** දමිත කුමාරසිංහ මහතා **03.** ඉංජිනේරු තිළිණ එස්. විජේතුංග මහතා **04.** බී. එන්. ගමගේ මහත්මිය **05.** රොහාන් තුඩාව මහතා **06.** එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම මහතා

එම්. එච්. වී. රත්නකුමාර මහතා
අධ්‍යක්ෂ (නිවාස)
නාගරික සංවර්ධන අධිකාරිය
(අධ්‍යක්ෂ ජනරාල් නියෝජනය කිරීම සඳහා)
2020.02.27 සිට

දමිත කුමාරසිංහ මහතා
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව
2020.02.27 සිට

බී. එන්. ගමගේ මහත්මිය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
2020.02.27 සිට

රොහාන් තුඩාව මහතා
සභාපති
තුඩාව බ්‍රදර්ස් පුද්ගලික සමාගම
2020.02.27 සිට

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම මහතා
නාගරික කොමසාරිස්
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව
2020.12.23 සිට

ඩබ්. ටී. එල්. මානෙල් මහත්මිය
නාගරික කොමසාරිස්
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව
2020.02.27 සිට 2020.11.23 දක්වා

ඒ. ඩී. එස්. සදීකා මහත්මිය
නාගරික කොමසාරිස්
කෝට්ටේ මහ නගර සභාව
2020.02.27 සිට 2020.09.22 දක්වා

නීතීඥ රෝෂණී දිසානායක මහත්මිය
නාගරික කොමසාරිස්
කොළඹ මහ නගර සභාව
2020.02.27 සිට

ඉංජිනේරු ආර්. එච්. රුවිනිස් මහතා
සාමාන්‍යාධිකාරී
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
2020.02.27 සිට 2020.09.22 දක්වා

සභාධිපත්‍ය කළමණාකරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය



වමේ සිට දකුණට,
07. එස්. ඩී. තෙවරප්පෙරුම මහතා **08.** නීතීඥ රෝෂණී දිසානායක මහත්මිය **09.** ලලිත් එදිරිසිංහ මහතා
10. ආචාර්ය ඉඳුනිල් ලියනගේ මහතා **11.** නීතීඥ සරණ කරුණාරත්න මහතා

එස්. ඩී. තෙවරප්පෙරුම මහතා
නාගරික කොමසාරිස්
මොරටුව මහ නගර සභාව
2020.02.27 සිට

නීතීඥ සරණ කරුණාරත්න මහතා
සභාපති
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
2020.02.13 සිට

ආචාර්ය ඉඳුනිල් ලියනගේ මහතා
සාමාන්‍යාධිකාරී
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
2020.11.26 සිට

සංජීව බන්ධුකීර්ති මහතා
නාගරික කොමසාරිස්
කෝට්ටේ මහ නගර සභාව
2020.11.23 සිට 2020.12.22 දක්වා

පී. එල්. එම්. චතුරංග මහතා
නාගරික කොමසාරිස්
කෝට්ටේ මහ නගර සභාව
2020.12.23 සිට

ලලිත් එදිරිසිංහ මහතා
සාමාන්‍යාධිකාරී (වැ. බ.)
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
2020.02.27 සිට

ඉංජිනේරු තිළිණ එස්. විජේතුංග මහතා
සාමාන්‍යාධිකාරී
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
2020.11.23 සිට

ආර්. කේ. ජයවීර මහතා
සාමාන්‍යාධිකාරී
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
2020.01.01 සිට 2020.04.30 දක්වා

මාධවී එස්. පරණයාපා මහත්මිය
සාමාන්‍යාධිකාරී (වැ. බ.) / සහකාර අධ්‍යක්ෂ
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
2020.06.12 සිට 2020.11.25 දක්වා

සභාධිපත්‍ය කළමණාකරණ අධිකාරියේ ආයතනික කළමනාකාරීත්වය



අසුන්ගෙන (වමේ සිට දකුණට)

නයනා පැල්පිට මහත්මිය සහකාර සාමාන්‍යාධිකාරී (නියාමන), **නිසංසලා ඉලේපෙරුම මෙනෙවිය** සහකාර සාමාන්‍යාධිකාරී (නීති), **එස්. එච්. ආර්. පී. හේවගේ මහත්මිය** සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් / නඩත්තු), **අයි. පී. පී. යූ. ජයතුංග මහත්මිය** සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් / නඩත්තු) (වැ. බ.)

සිටගෙන (වමේ සිට දකුණට)

සජීව චන්දන ද සිල්වා මහතා සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් / නඩත්තු), **මහේෂ ගුණතිලක මහතා** අභ්‍යන්තර විගණක , **පී. අමිල නිශාන්ත මහතා** සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

අරමුණු

රජය විසින් ඉදිකළ මහල් නිවාස නඩත්තුව සඳහා 1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල පනතින් පොදු පහසුකම් මණ්ඩලය පිහිටුවන ලදී. එහි අරමුණ වූයේ, රජය විසින් ඉදි කරනු ලැබූ මහල් නිවාසයන්හි පොදු පහසුකම් හා පොදු අංගෝපාංග නඩත්තු කිරීමයි. පෞද්ගලික අංශයද මීට සමඟාමීව මහල් නිවාස ඉදි කිරීම වේගවත්වීම සහ නාගරික සහ තදාසන්න ප්‍රදේශයන්හි නිවාස හිඟයට පිළියමක් ලෙස සහ නාගරික පහසුකම් අත්විඳීම සඳහා ජනතාව වැඩි වශයෙන් මහල් නිවාස මිළ දී ගැනීම සඳහා පෙළඹුණි. ඒ හා සමඟ මහල් නිවාස විෂය පථය මෙරට පුළුල් භූමිකාවක් නිරූපණය කළ අතර ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා පොදු පහසුකම් මණ්ඩලයෙන් ඉටු කළ සේවාවට වඩා පුළුල් සේවාවක් හා මහල් නිවාස නියාමනයක අවශ්‍යතාව උද්ගත විය. ඊට පිළියමක් ලෙස 2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල සංශෝධන පනත මඟින් පොදු පහසුකම් මණ්ඩලය සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ලෙස ස්ථාපිත විය. එමඟින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සභාධිපත්‍ය දේපළවල නඩත්තුව, පරිපාලනය, කළමනාකරණය සහ නියාමනය සඳහා පුළුල් බලතල හිමි වූ අතර සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවීමේ අරමුණ පහත සඳහන් පරිදිය.



(අ) සභාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සභාධිපත්‍ය දේපළවල සභාධිපත්‍ය කොටස්, සභාධිපත්‍ය අංගෝපාංග සහ පොදු පහසුකම් පාලනය කිරීම, කළමනාකරණය කිරීම නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම;

(ආ) සභාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සභාධිපත්‍ය දේපළවල පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් නිසි ආකාරයට හොඳින් නඩත්තු කරන බවට සහතිකවීම සහ ඒ දේපළ මනා තත්ත්වයෙන් සහ සේවයට යොදවාගත හැකි අන්දමින් සහ නිසි ආකාරයෙන් නඩත්තු කිරීම සඳහා කළින් කළ අළුත්වැඩියා කිරීම් කරන විට සහතිකවීම සහ ඒ ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ සංස්ථාවට හෝ අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට සහායවීම හෝ නැතහොත් ඒ ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම කළමනාකරණ සංස්ථාවට හෝ අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන් සහායවීම හෝ නැතහොත් ඒ ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම කළමනාකරණ සංස්ථාව හෝ අයිතිකරු හෝ අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් හෝ පැහැර හරින අවස්ථාවකදී ඒ ක්‍රියාවලට සෘජුවම මැදිහත්වීම;

(ඇ) ගින්නෙන් මහජන කැළඹීම්වලින් සහ කැරලි කෝලහාලවලින් වන උපද්‍රවවලට එරෙහිව සභාධිපත්‍ය කොටස් සංයුක්ත වන සියළු ගොඩනැගිලි රක්ෂණය කිරීමට හෝ රක්ෂණය වලංගුව තබා ගන්නා ලෙස කළමනාකරණ සංස්ථාව විසින් හෝ අයිතිකරුවන් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් එසේ කරන බවට සහතිකවීම සහ ඒ සඳහා වූ වාරික හෝ වෙනත් ගාස්තු අවස්ථානෝචිත පරිදි කළමනාකරණ සංස්ථාවෙන් හෝ අයිතිකරුගෙන් ආපසු අයකර ගැනීම;

(ඈ) සභාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි සභාධිපත්‍ය පිඹුරට හෝ අර්ධ සභාධිපත්‍ය දේපළෙහි ලියාපදිංචි අර්ධ සභාධිපත්‍ය පිඹුරට පටහැනිව අදාළ අයිතිකරුවන් හෝ සභාධිපත්‍ය කොටස්වල පදිංචිකරුවන් හෝ වෙනත් තැනැත්තෙකු විසින් ඉදි කරන ලද හෝ සිදු කර ඇති සියළු අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම;

(ඉ) සභාධිපත්‍ය දේපළෙහි හෝ අර්ධ සභාධිපත්‍ය දේපළෙහි කළමනාකරණ සංස්ථාව නිසි ආකාරයෙන් ක්‍රියා කරන බවට වග බලා ගැනීම සහ ඒ කළමනාකරණ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම;

(ඊ) සභාධිපත්‍ය දේපළෙහි හෝ අර්ධ සභාධිපත්‍ය දේපළෙහි සභාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාවට හෝ අයිතිකරුට හෝ අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට ජලය, කසළ කාණු, ජලාපවාහනය, ගෑස් විදුලිය, කුණු කසළ බැහැර කිරීම, වායු සමීකරණ, දුරකතන, ගුවන්විදුලි සහ රෙඩියුෂන් වැනි සේවා ලබාදීමේදී ඒ අයිතිකරුට, අයිතිකරුවන්ට, පදිංචිකරුවන්ට සහායවීම;

(උ) සභාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ග ප්‍රවේශයන්, තණ පිට්ටනි, වතු, උද්‍යාන, ක්‍රීඩාංගන සහ වෙනත් විළිමහන් ස්ථාන පිහිටුවා නඩත්තු කිරීමට සහායවීම හෝ එවැනි පහසුකම් පිහිටුවීම සහ නඩත්තු කිරීමට අපොහොසත් වන විට කළමනාකරණ සංස්ථාවල එවැනි ක්‍රියාවන් සඳහා සෘජුවම මැදිහත්වීම;

(ඌ) සභාධිපත්‍ය කොටස්වල අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ග ප්‍රවේශයන්, තණ පිට්ටනි, වතු, උද්‍යාන, ක්‍රීඩාංගන සහ වෙනත් විළිමහන් ස්ථාන පිහිටුවා නඩත්තු කිරීමට සහායවීම හෝ එවැනි පහසුකම් පිහිටුවීම සහ නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම;

(එ) සභාධිපත්‍ය දේපළවල හෝ අර්ධ සභාධිපත්‍ය දේපළවල සභාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාවේ හෝ ඒවායේ අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ ඉල්ලීම පරිදි ඒ සභාධිපත්‍ය කොටස් නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීමේ සේවා සැපයුම;

(ඒ) පරදු දරන්නන්ගේ අයිතීන් ආරක්ෂාවීම සහතිකවීම සඳහා ලියාපදිංචි තාවකාලික සභාධිපත්‍ය දේපළ තැනීමේ ප්‍රගතිය නියාමනය කිරීම සහ ඒ අයිතීන් ආරක්ෂා කිරීමට අවශ්‍ය කවර හෝ අවස්ථාවකදී ඊට මැදිහත්වීම;

(ඔ) රජය විසින් අනුමත කිරීම සඳහා ප්‍රාග්ධන ආයෝජන සැළසුම් ඇතුළු සභාධිපත්‍ය දේපළ නැවත සංවර්ධනය කිරීම් වැඩසටහන් සකස් කිරීම සහ අනුමැතිය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම;

(ඕ) රජය විසින් අනුමත කරනු ලබන වැඩසටහන්වලින් සභාධිපත්‍ය දේපළ නැවත සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භාරගැනීමට හෝ ඒ ව්‍යාපෘති ක්‍රියාවේ යෙදවීමට භාර ගැනීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ රජයේ යම් නියෝජිත ආයතනයකින් හෝ පෞද්ගලික සංවර්ධනකරුවෙකුගෙන් ඉල්ලා සිටීම;

(ක) යම් ලියාපදිංචි අර්ධ සභාධිපත්‍ය පිඹුරක හෝ තාවකාලික සභාධිපත්‍ය පිඹුරක දැක්වෙන යම් සභාධිපත්‍ය ගොඩනැගිල්ලක් අයිතිකරු විසින් අවසන් කිරීම පැහැර හැරීමේදී එය අවසන් කිරීමට භාර ගැනීම

සහ

(ග) අධිකාරියේ අරමුණුවලින් යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා ඉඩම් සංවර්ධනය කිරීම හෝ නැවත සංවර්ධනය කිරීම;

(ව) ඉහත සඳහන් අරමුණු සියල්ලම හෝ ඉන් යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන හෝ අහිතකර වන වෙනත් සියළු දේ කිරීම;

බලතල

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සභාධිපත්‍ය දේපළවල රාජ්‍ය නියාමන අධිකාරිය ලෙස සභාධිපත්‍ය දේපළ නිවාසවාසීන් සඳහා පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග සම්බන්ධයෙන් ප්‍රශස්ථ, විශ්වාසනීය සහ සුවපහසු මහල් නිවාස ජීවන රටාවක් අත් කර දීම සඳහා 2003 අංක 24 දරණ පොදු පහසුකම් (සංශෝධන) පනත මඟින් පුළුල් බලතල පවරණ ලදී. මේ යටතේ කළමනාකරණ සංස්ථාවන්ට අවශ්‍ය ඕනෑම අවස්ථාවක අවශ්‍ය උපදේශාත්මක සහ නියාමන කටයුතු සඳහා මැදිහත්වීමට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට හැකියාව ලැබී ඇත. එමෙන්ම මහල් නිවාසවාසීන්ගේ හිතකර ජීවන රටාවට සහ ගොඩනැගිලි ව්‍යුහයට හානිදායක වන මට්ටමින් ඉදි කර ඇති අනවසර ඉදි කිරීම් ඉවත් කිරීම, මනුෂ්‍ය වාසය සඳහා නුසුදුසු සහ අන්තරාදායක ගර්හිත සභාධිපත්‍ය දේපළ හඳුනාගෙන ඒ සඳහා සංවර්ධන යෝජනා රජයට ඉදිරිපත් කිරීමටද එමඟින් බලය පැවරී ඇත. ඒ අනුව 2003 අංක 24 දරණ පනතින් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට පනතේ ප්‍රකාරව පැවරී ඇති බලතල පහත සඳහන් පරිදී වේ.



(අ) අත්කර ගැනීම, අධිග්‍රහණය, සතු කිරීම, ප්‍රදානය කිරීම හෝ මිළ දී ගැනීම මඟින් යම් නිශ්චල හෝ චංචල දේපළක් අත්කර ගැනීම නැතහොත් එවැනි දේපළක් ත්‍යාගයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීම හෝ එවැනි දේපළක් දැරීම, කළමනාකරණය කිරීම, විකිණීම, භාරදීම, හුවමාරු කිරීම, බද්දට දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) දේශීය හෝ විදේශීය යම් ප්‍රභවයකින් ත්‍යාග සහ පරිත්‍යාග ලබා ගැනීම;

(ඇ) කර්තව්‍යය ඉටුකිරීමේදී අධිකාරියට අවශ්‍ය වන මුදල් ණයට ගැනීම;

(ඈ) අධිකාරිය විසින් කුලියට දී ඇති යම් ඉඩම් කොටසක් හෝ ගොඩනැගිලි හෝ සභාධිපත්‍ය දේපළ සඳහා කුලිය අය කිරීම;

(ඉ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරිය විසින් ඉටුකරනු ලබන යම් සේවා සඳහා ගාස්තු හෝ අය කිරීම් අය කිරීම;

(ඊ) සභාධිපත්‍ය කොටස්වලට අයිතිකරුවන්ට ඇති සම්බන්ධතාවට සමානුපාතිකව ඔවුන්ගෙන් වාරික මුදල් අය කර ගැනීම;

(උ) සභාධිපත්‍ය කොටස්වල පොදු පහසුකම්වලට හෝ පොදු අංගෝපාංගවලට අයිතිකරු ඇතුළු යම් තැනැත්තෙකු විසින් සිදු කරන ලද යම් හානියක් යථා තත්ත්වයට ගෙන ඒමෙහි ලා දරන ලද වියදම් අයිතිකරුවන්ගෙන් හෝ ඒ තැනැත්තාගෙන් අය කර ගැනීම;

(ඌ) යම් සභාධිපත්‍ය දේපළ කොටසක කළමනාකරණ සංස්ථාවේ හෝ එහි අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ ඉල්ලීම පිට ඒ දේපළ කොටස පිළිසකර කිරීම, අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම ඇතුළු සේවා ඒ සභාධිපත්‍ය දේපළ කොටසට සැපයීම සහ ඒ සඳහා ගාස්තු අය කර ගැනීම;

(එ) ඉදිකිරීම් කටයුතු භාර ගැනීම;

(ඒ) වෙනත් සභාධිපත්‍ය දේපළ කොටස් හෝ පොදු අංගෝපාංගවලටද සේවා සපයන නළ රැහැන් කේබල් සහ ප්‍රණාල පරීක්ෂා කිරීම, අළුත්වැඩියා කිරීම හෝ අළුත්කිරීමේ කාර්යය සඳහා හෝ සභාධිපත්‍ය දේපළේ නැතහොත් අර්ධ සභාධිපත්‍ය දේපළේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමේ හෝ කඩා බිඳ දැමීමේ කාර්යය සඳහා නැතහොත් මේ වගන්තියේ සඳහන් බලතල අතරින් කිසිවක් ක්‍රියාවේ යෙදවීමේදී අදාළ යම් ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූලව ක්‍රියා කරන බවට සහතිකවීමේ කාර්යය සඳහා අධිකාරිය විසින්ම හෝ එහි නිසි බලය පවරන ලද නියෝජිතයින් විසින් සියළු සාධාරණ වේලාවන්හිදී යම් සභාධිපත්‍ය දේපළකට ඇතුළුවීම;

(ඔ) ලියාපදිංචි තාවකාලික සභාධිපත්‍ය පිළිබඳව දක්වා ඇති ගොඩනැගිලි ඉදි කිරීම පරීක්ෂා කිරීමේ සහ එහි ප්‍රගතිය සමාලෝචනය කිරීමේ කාර්යය සඳහා තාවකාලික සභාධිපත්‍ය දේපළෙහි යම් කොටසකට සියළු සාධාරණ අවස්ථාවන්හිදී අධිකාරිය හෝ නිසි පරිදි බලය පවරන ලද නියෝජිතයින් ඇතුළුවීම;

(ඕ) අධිකාරියේ අරමුණුවලින් යම් අරමුණක් ඉටු කිරීමේ කාර්යය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ගිවිසුම්වලට ඇතුළුවීම සහ වැඩපිළිවෙල සකස් කිරීම;

(ක) සභාධිපත්‍ය දේපළේ හෝ අර්ධ සභාධිපත්‍ය දේපළේ හෝ ලියාපදිංචි තාවකාලික සභාධිපත්‍ය දේපළේ සභාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාව සහ එහි අයිතිකරු හෝ පදිංචිකරු අතර හෝ අයිතිකරු සහ මිළ දී ගත් තැනැත්තා අතර හෝ අයිතිකරු සහ උගස්කරු අතර හෝ උගස්කරු සහ මිළ දී ගැනීමට අදහස් කරන තැනැත්තා අතර හෝ උගස්කරු හා උගස්ලාභියා අතර හෝ ඇතිවන ආරවුල් විසඳීම;

(ග) අධිකාරියේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි නිලධාරීන් සහ සේවකයින් සේවයේ නියුක්ත කරවීම සහ එහි නිලධාරීන් සහ සේවකයින් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කරවීමත

(ව) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සඳහා නීති සෑදීම;

සහ

(ජ) අධිකාරියේ අරමුණු නිසි ලෙස ඉටු කර ගැනීමට හැකිවන පරිදි අධිකාරියේ මතය අනුව අවශ්‍ය විය හැකි සියළුම දේ ඉටු කිරීම.

මූල්‍ය ප්‍රගතිය



2.6%
ආදායම්

8%
වියදම්

81%
ශුද්ධ ලාභය

2020 වර්ෂයේ අධිකාරිය රුපියල් මිලියන 203.72 ක ආදායමක් උත්පාදනය කරන ලදි. 2019 වර්ෂයේදී අධිකාරියේ ආදායම රු.මිලියන 198.48 සමඟ සසඳා බලන විට 2.6% කින් ආදායම වැඩිවීමක් පෙන්නුම් කරයි. 2019 වර්ෂයේදී සමස්ථ වියදම රු. මිලියන 172.24 ක් වූ අතර 2020 වර්ෂයේදී සමස්ථ වියදම රු. මිලියන 159.18 ක් විය. ඒ අනුව 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ සමස්ථ වියදම 8% කින් අඩු කර ගැනීමට හැකිවිය. 2020 වර්ෂයේ අදායම් බදු වෙන් කිරීමෙන් පසු ශුද්ධ ලාභය රු. මි. 32.96 ක් වන අතර එය 2019 වර්ෂයට සාපේක්ෂව 81% ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

2020 වර්ෂයේ මහා පරිමාණ සහාධිපත්‍ය දේපළ කිහිපයක ඉදිකිරීම් අවසන් කර අවසන් සහාධිපත්‍ය සහතිකය ලබා ගැනීම නිසා කොවිඩ් 19 වසංගත තත්ත්වය මත වුවද ලාභදායී තත්ත්වයක් වාර්තා කිරීමට අධිකාරියට හැකිවිය. තවද සහාධිපත්‍ය දේපළ ක්ෂේත්‍රයේ මෙහෙයුම් කටයුතු සීමා කිරීමට සිදුවීමෙන් පොදු කාර්යය පිරිවැය සැළකිය යුතු මට්ටමකට අවම කර ගැනීමට හැකි විය.

සුවපහසු මහල් නිවාස ජීවන සංස්කෘතියක් සඳහා වූ සහාධිපත්‍ය දේපළ කළමනාකරණ සහ පරිපාලන භූමිකාව තුළින් සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායකවීමු. රාජ්‍ය ආදායමට සෘජු හා වක්‍ර දායකත්වයක් ලබාදීම උදෙසා දේපළ සංවර්ධනය, නියාමනය තුළින් සහාධිපත්‍ය ක්ෂේත්‍රයේ පෙරටුගාමී මෙහෙවරක් අඛණ්ඩව ඉටු කරයි.

බදු පෙර ලාභය

මි
ලියන

44.53

රජයට ගෙවූ බදු

මි
ලියන

11.57

බදු පසු ලාභය

මි
ලියන

32.96

සභාධිපත්‍ය ක්ෂේත්‍රයේ නියාමන අධිකාරිය ලෙස දුෂ්කර වකවානුවක වුවද සේවක, පාරිභෝගික, සාමාජීය වගකීම් නොපිරිහෙළා ඉටු කරමින් සිය කාර්යයභාරය මැනවින් ඉටු කරන ලදී.

මෙම වකවානුව තුළ මහල් නිවාසයන්හී සහ සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් ක්ෂේත්‍රයේ පැනනැගුණු ගැටළු සඳහා සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් කඩිනම් පිළියම් යෙදීමටද අධිකාරියට හැකිවිය.











සේවක

කොවිඩ් 19 හදිසි තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය පරිදි එදිනෙදා කාර්යාලීය කටයුතු සිදු කිරීමට දුෂ්කරතා පැමිණි හෙයින් මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ සේවක මහත්ම මහත්මීන්ට නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරීමට අවශ්‍ය වටපිටාව සකස් කර දෙන ලදී.

එමෙන්ම සේවක සුභ සාධනය අරමුණු කර ගනිමින් පසුගිය අළුත් අවුරුදු සමයේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය අඩංගු භාණ්ඩ පාර්සලයක්ද ආයතනික සේවක පිරිසගේ දූ දරුවන් වෙනුවෙන් අවශ්‍ය පාසල් උපකරණ සහ ලිපි ද්‍රව්‍ය මිළ දී ගැනීම සඳහා විශේෂ මූල්‍යමය ප්‍රදානයක්ද ආයතනයේ සුභ සාධක සංගමය විසින් ලබාදීමට කටයුතු යොදා තිබුණි.

පසුගිය මූල්‍ය වර්ෂය තුළ ආයතනය ලබා තිබූ ප්‍රගතිය සැළකිල්ලට ගනිමින් වසර අවසාන ප්‍රසාද දීමනාව සේවක පිරිස වෙත ලබා දීමට අවශ්‍ය පියවර ගැණුනි.

තවද, රාජකාරි වගකීම් නිසි ලෙස හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාම සඳහා කාර්යාල පරිශ්‍රය නවීකරණය කරන ලදී.

සංචරණ සීමා පනවා තිබූ අවස්ථාවන්හිදී සේවක සුරක්ෂාව වෙනුවෙන් සේවය සඳහා වාර්තා කරනු ලබන සේවක මඩුල්ල සඳහා ප්‍රවාහන පහසුකම්ද ලබාදීමට කටයුතු කරනු ලැබීය.

පාරිභෝගික

පැවති තත්ත්වය මත පුද්ගල දුරස්ථභාවය හේතුවෙන් සභාධිපත්‍ය දේපළවල මහල් නිවාසවාසීන්ට කළමනාකරණ සංස්ථාවන්ට දේපළ සංවර්ධකයින්ට කාර්යය මණ්ඩලය සමඟ සේවා ලබා ගැනීම සඳහා සෘජු සම්බන්ධතා පවත්වා ගැනීම දුෂ්කර විය.

එහෙත් පාර්ශවකරුවන්ට හැකි උපරිම ආකාරයට කාර්යාල සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශ අනුගමනය කරමින් ප්‍රශස්ථ සේවාවක් සළසන ලදී.
එකී කාල සීමාව තුළ පාරිභෝගික සේවා අංශයට නීති අංශයට සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි, ගැටළු නිරාකරණය කිරීම සභාධිපත්‍ය දේපළවල කළමනාකරණ සංස්ථාවන්ට උපදේශන සේවාවන් සැපයීම තම ප්‍රමුඛ වගකීම සේ සළකා ඉටු කරන ලදී. මේ සඳහා ක්ෂණික දුරකතන ඇමතුම් අංක 011-2444575 හඳුන්වා දෙනු ලැබීය.

එමෙන්ම පැවති තත්ත්වය මත ඉදි කිරීම් ක්ෂේත්‍රය යම් පසුබෑමකට ලක් වුවද දේපළ සංවර්ධකයින් අධෛර්යයමත් නොවන පරිදි සේවාවන් සළසනු ලැබීය.

තවද, තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා මහල් නිවාස ප්‍රජා සහභාගීත්වයෙන් සහ අධිකාරියේ මැදිහත්වීමෙන් රජය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ ව්‍යාපෘතීන් සඳහා දායකත්වය ලැබීය.

සාමාජයීය

සවිමත් කළමනාකරණ සංස්ථාවක් සුවපහසු මහල් නිවාස දිවියක් යන තේමාව යටතේ කළමනාකරණ සංස්ථාව සහ නිවාස හිමියන් අතර ඇති වන ගැටළු විසඳීම සඳහා අවශ්‍ය මැදිහත්වීම සහ මඟ පෙන්වීම සිදු කරමින් වඩා සුභදශීලී මහජන සේවාවක් ලබා දීමට හැකි වූ අතර ඊට අමතරව සභාධිපත්‍ය දේපළ ක්ෂේත්‍රයේ නියැලෙන වෘත්තිකයින් සභාධිපත්‍ය දේපළ නීතිය සම්බන්ධයෙන් දැනුවත් කරනු ලැබීය.

සභාධිපත්‍ය දේපළ ඉදි කිරීමේදී කළමනාකරණ සංස්ථා පිහිටුවීමේදී ගැටළු අවම කර ගැනීම මෙහි අරමුණයි.

එමඟින් ක්ෂේත්‍රය වෙනුවෙන් වන ඔවුන්ගේ දායකත්වය වඩාත් පුළුල් අන්දමින් ලබා ගැනීමට හැකිවනු ඇත. තවද මහල් නිවාසයන්හී කළමනාකරණ සංස්ථා නිසි ලෙස පවත්වා ගෙන යන්නේ නම් එය එම මහල් නිවාසවාසීන්ගේ අන්‍යෝන්‍ය සුභඳතාවට මහත් පිටුවහලක් වේ.
මෙකී හේතූන් නිසා නිවාස ක්‍රමයන්හී සුබ සාධක සංගම්, ක්‍රීඩා සමාජ, මරණාධාර සමිති යනාදිය පිහිටුවා ගැනීමද පහසුය. එමඟින් සාමාජීය වශයෙන් යහපත් සමඟි සම්පන්න සමාජයක් බිහිවීම තුළින් මහල් නිවාස දිවිය සුවදායී පරිසරයක් නිර්මාණය කරනු ඇත.

රජය

පසුගිය මූල්‍ය වර්ෂය වෙනුවෙන් රජයට ගෙවිය යුතු බදු නිසියාකාරයෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට හැකිවීම තුළින් කොවිඩ් 19 බලපෑම හේතුවෙන් සංකෝචනය වූ දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා දායකවන්නට අධිකාරියට හැකිවිය.

එමෙන්ම රජයේ මහල් නිවාස යෝජනා ක්‍රම නඩත්තුව, පරිපාලනය සහ කළමනාකරණය සඳහා කළමනාකරණ සංස්ථා ව්‍යුහය හඳුන්වා දුන් අතර සෑම මහල් නිවාසයකම එම සංස්ථාව ක්‍රියාත්මකව පවතී.
මේ නිසා මහල් නිවාස නඩත්තුව සඳහා මීට පෙර මහා භාණ්ඩාගාරය මඟින් සැළකිය යුතු මුදලක් ප්‍රතිපාදන ලෙස වෙන් කරනු ලැබීය. මේ වන විට කළමනාකරණ සංස්ථා මඟින් නඩත්තු කටයුතු සිදු කරන බැවින් රජයේ ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදු නොවේ. එබැවින් එය චක්‍රීය ලෙස මෙරට ආර්ථිකයට වාසිදායක තත්ත්වයක් නිර්මාණය කර ඇත. මේ නිසා මහල් නිවාස නඩත්තුවට වෙන් කළ ප්‍රතිපාදන රටේ අනෙකුත් සංවර්ධන කටයුතු වෙනුවෙන් යෙදවීමට රජයට හැකිවිය.

තවද, ජාතික කොවිඩ් අරමුදලට රු. මි. 10 ක මුදලක් ප්‍රදානය කරමින් ආයතනය මෙම අසීරු මොහොතේදීත් තම සමාජ වගකීම සහ යුතුකම පැහැර නොහැර කටයුතු කරන ලදී.

කාර්යාලයීය සංවිධාන ව්‍යුහය



ඉංජිනේරු අංශය

ඉදිකරමින් පවතින සභාධිපත්‍ය දේපළ නියාමනය කිරීම හා උපදෙස් ලබා දීම, සභාධිපත්‍ය සහතික නිකුත් කිරීම, සභාධිපත්‍ය දේපළ තුළ පිහිටා ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම, පැමිණිලිවලට අදාළ ස්ථානීය පරීක්ෂාවන් සිදු කරනු ලබයි

පාරිභෝගික සේවා අංශය

කළමනාකරණ සංස්ථාවන්ට අදාළ සියළු කාර්යයන් කළමනාකරණය හා ඒකක හිමියන් සංවර්ධනකරුවන් ගේ ගැටළුවලට අවශ්‍ය අවස්ථාවන්හීදී උපදේශනයන් ලබා දෙයි.

සහතිකපත් අංශය

සභාධිපත්‍ය දේපළ ඉදිකිරීම්වලට අදාළව පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් පරීක්ෂා කර බලා ඒවා නියමානුකූලව ඇති බවට සහතික කර සභාධිපත්‍ය සහතික නිකුත් කිරීම මෙම අංශයෙන් සිදු කෙරේ.

මානව සම්පත් කළමනාකරණ අංශය / පාලන අංශය

අධිකාරියේ කාර්යය මණ්ඩලය පරිපාලනය සඳහා අවශ්‍ය වන සියළු කාර්යයන් සිදු කෙරෙනුයේ පාලන අංශයෙනි.

නීති අංශය

සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් වන ආරවුල් විසඳීම සඳහා මැදිහත් වන අතර, කාලීන අවශ්‍යතාවන්ට අනුව සිදු කළ යුතු පනත් සංශෝධනයන් සහ රෙගුලාසි ගැසට් නිවේදන නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ.

මුදල් අංශය

අධිකාරියේ මූල්‍ය පරිපාලනය, සැළසුම් සකස් කිරීම, ඉලක්ක සමාලෝචනය කරමින් කළමනාකරණයට තොරතුරු හා වාර්තා සැපයීම සිදු කෙරෙනුයේ මුදල් අංශය මඟිනි.

තොරතුරු තාක්ෂණ අංශය

අධිකාරියේ තොරතුරු තාක්ෂණයට අදාළ කාර්යයන් මෙම අංශය මඟින් ඉටු කරනු ලබන අතර සභාධිපත්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා හඳුනාගැනීම, දැනුවත් කිරීම්වලට අදාළ ප්‍රකාශන සැකසීම යනාදිය සිදු කරයි.

අභ්‍යන්තර විගණන අංශය

අධිකාරියේ සියළු අංශයන්හී විගණන කාර්යයන් සිදුකරනු ලබයි.

මෙහෙයුම් / නඩත්තු අංශය

කාර්යාලයීය නඩත්තු කටයුතු, අළුත්වැඩියාවන් සහ සභාධිපත්‍ය දේපළ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම මෙම අංශය මඟින් සිදු කරයි.



සහාධිපත්‍ය ව්‍යාපෘති සඳහා අනුමැතිය සහ සහතික නිකුත් කිරීම.

රාජ්‍ය සහ පෞද්ගලික අංශය මඟින් ඉදි කරනු ලබන මහල් නිවාසයන්හී පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග පාලනය, නඩත්තුව, පරිපාලනය සහ කළමනාකරණයට පහසු වන සේ එම දේපළ සැළසුම් කර ඇති බවට සහතික කරමින් සහතිකපත් නිකුත් කරනු ලබන අතර ඉදිකරනු ලබන සහාධිපත්‍ය දේපළවල එක් එක් අදියරයන් සඳහා නීත්‍යානුකූලව එක් එක් ඒකකයන්හී අයිතිය පැවරීමේ ලේඛනයක් දේපළ සංවර්ධකයා / සහාධිපත්‍ය දේපළ ඉදිකරන්නන් සහාධිපත්‍ය සහතිකය ලබා ගැනීමෙන් පසු ගැනුම්කරු වෙත නිකුත් කිරීමට හැකියාව ඇත. එනම්, නිවාස සංකීර්ණයක එකිනෙකට බැඳුණු නිවාස පිහිටා ඇති අතර එම නිවාස සඳහා වෙන් වෙන්ව කටයුතු කිරීම සහ අයිතිවාසිකම් පෙන්නුම් කිරීම සඳහා නිවාස සංකීර්ණයක සෑම මහලකම පිහිටි නිවාස සඳහා එම සීමාවන් දක්වමින් පිඹුරුපත් පිළියෙළ කරන අතර එම පිඹුර සහාධිපත්‍ය පිඹුර ලෙස හඳුන්වයි. ඒ අනුව සහාධිපත්‍ය පිඹුර සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් සහතික කර දීමෙන් අනතුරුව ප්‍රකාශන ඔප්පුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ හැක. එමෙන්ම තාවකාලික කොටස් හැර සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ ඉතිරි ඒකක සඳහා ඔප්පු ලබාදීමේ හැකියාවද ඇත.

රාජ්‍ය අංශය මඟින් සහ පෞද්ගලික අංශය මඟින් ඉදිකරනු ලබන සහාධිපත්‍ය දේපල වල පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් නිසි හා ප්‍රමාණවත් පරිදි පවතින්නේද යන්න පරීක්ෂා කර බලා සහාධිපත්‍ය සහතිකය 2003 අංක 24 දරණ පොදු පහසුකම් සංශෝධන පනත මඟින් පිහිටුවන ලද නියාමන අධිකාරිය වූ සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් නිකුත් කරනු ලබයි. තවද, මෙම සහාධිපත්‍ය සහතිකය නිකුත් කිරීමේදී 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනතේ ප්‍රතිපාදන අනුව ක්‍රියා කරනු ලබන අතර එහිදි නිවාස ඒකක හිමියන්ට එම දේපල වල පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමටද අවකාශ සැලසී ඇත.

තවද, මෙම සහතික ආදායම අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. 2005 වර්ෂයේ සිට 2020.12.31 දක්වා අධිකාරිය මඟින් සහතික පත් 1,301 ක් නිකුත් කර ඇත. 2020 වර්ෂයේදී සහතික පත් 217 ක් ඉලක්ක කරන ලද අතර වර්ෂය අවසානය වන විට ප්‍රගතිය 62 ක් විය.

2005-2020
නිකුත් කළ සහතික
1301

2017 - 2020 දක්වා කාලය තුලදී අධිකාරිය විසින් ලබාදුන් සහාධිපත්‍ය සහතිකයන්හි භෞතික හා මූල්‍ය ඉලක්ක

		වාර්ෂික ඉලක්ක	ප්‍රගතිය
2017	මූල්‍ය (රු.මි)	356.21	224.54
	භෞතික	105	102
2018	මූල්‍ය (රු.මි)	424.39	304.0
	භෞතික	171	111
2019	මූල්‍ය (රු.මි)	369.73	154.25
	භෞතික	102	176
2020	මූල්‍ය (රු.මි)	171.58	168.16
	භෞතික	217	62

සහාධිපත්‍ය සහතික නිකුතුවේ මූල්‍ය ඉලක්ක හා ප්‍රගතිය



සහාධිපත්‍ය සහතික නිකුතුවේ භෞතික ඉලක්ක හා ප්‍රගතිය



කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂය තුළ ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි විය.

2020 වසරේදී සහාධිපත්‍ය සහතිකය ලබාගැනීම සඳහා අයදුම් කළ අයදුම්පත් අතරින් අනුකූලතා සහතිකය නිකුත් නොකිරීමෙන් හා වෙනත් අඩුපාඩු නිසා එම වසර තුළදී සහතිකපත් ලබා නොදුන් සහාධිපත්‍ය දේපළ සංඛ්‍යාව 16 කි.

2014 වර්ෂයේ සිට විදේශ ආයෝජකයන් සහාධිපත්‍ය දේපළ ඉදිකිරීම සඳහා ඉදිරිපත්වීම හේතුවෙන් සහාධිපත්‍ය දේපළ ඉදිකිරීම සම්බන්ධ නව ප්‍රවණතාවක් ඇති වී ඇත.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය විසින් වතු නිවාස පදිංචිකරුවන් පදිංචි කිරීම සඳහා සහාධිපත්‍ය දේපළ ඉදිකිරීම සහ රජයේ නව වැඩපිළිවෙල යටතේ නිවාස 500,000 ක් ඉදිකිරීමේ වැඩසටහන මඟින්ද සහාධිපත්‍ය දේපළ ඉදිකිරීමේ වැඩි ප්‍රවණතාවක් ඇති වී ඇත.

තවද, පුද්ගලික අංශයේ අවසන් කරන ලද ගොඩනැගිලි යම් ප්‍රමාණයක් අනුකූලතා සහතිකය ලබා ගත නොහැකි වීම නිසා මෙම අධිකාරියේ සහතිකය ඉල්ලුම් කළ නොහැකිව ඇත.

මෙම ගැටළුව විසඳීම සඳහා අධිකාරිය, සහාධිපත්‍ය ක්ෂේත්‍රයේ නියාමකයා ලෙස 2018 අංක 23 දරණ බද්ධ නිවාස විශේෂ විධිවිධාන පනත හඳුන්වාදීම හේතුවෙන් 1999/12/31 දිනට පෙර ඉදි කරන ලද ජාතික නිවාස කොමසාරිස්වරයා, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, සුනාමි නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ රජයට අයත් ඉඩම්වල ගොඩනඟා ඇති සහාධිපත්‍ය දේපළ සඳහා ලිහිල් ක්‍රමවේදයක් අනුගමනය කරමින් සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම සහ අයිතිය බැහැර කිරීමට හැකියාව ලැබී ඇත.

2020 වර්ෂයේදී සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් නිකුත් කරනු ලැබූ සභාධිපත්‍ය සහතික

PPC - 75

මූලික නිෂ්කාශණ සහතික
Preliminary Planning Clearance

මූලික නිෂ්කාශණ සහතිකය

සභාධිපත්‍ය දේපලක් ඉදිකිරීම සඳහා ගොඩනැගිලි අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට පෙර යෝජිත ඉඩම පරීක්ෂා කර බලා ඉදිකිරීම ආරම්භ කිරීමට පෙර ගොඩනැගිලි සැළසුම් සකස් කරන අවස්ථාවේදී සභාධිපත්‍ය දේපළ නීතියට අදාළ පොදු පහසුකම් පොදු අංගෝපාංග ගොඩනැගිලි සැළසුම් තුළ ඇතුළත් කිරීමටත් එම දේපළ ඉදි කිරීමේදී ඉදිකිරීම් නිම වන තෙක් පිළිපැදිය යුතු කරුණු පිළිබඳව මාර්ගෝපදේශයක් ලෙස මූලික නිෂ්කාශණ ලිපිය නිකුත් කරනු ලබයි.
ඒ අනුව 2020 වර්ෂයේදී ඉදිකිරීමට යෝජිත සභාධිපත්‍ය දේපළ 75 ක් සඳහා මූලික නිෂ්කාශණයන්ට අදාළව නිෂ්කාශණ ලිපි ලබා දී ඇත. මෙම නිෂ්කාශණ උපදෙස් දේපළ සංවර්ධකයින් හට ඉදිකිරීම් කටයුතු වලදී මඟ පෙන්වීමක් සිදු කරනු ලබයි.

සභාධිපත්‍ය සහතික

2020 වර්ෂයේ නිකුත් කරනු ලැබූ සමස්ථ සභාධිපත්‍ය සහතික ප්‍රමාණය - 62

පූර්ණ / තාවකාලික / අර්ධ සභාධිපත්‍ය සහතික ප්‍රමාණය







පූර්ණ සභාධිපත්‍ය සහතිකය

පූර්ණ සභාධිපත්‍ය සහතිකයක් සභාධිපත්‍ය දේපළක් ඉදි කර අවසන් කළ පසු ලබා ගත යුතුය. මෙය ලබා ගැනීමට නම් එම ගොඩනැගිල්ල අනවසර ඉදිකිරීම්වලින් තොරව ගොඩනැගිලි සැළසුම්වලට අනුව සකස් කර තිබිය යුතුය.



අදාළ ලිපිලේඛණ සියල්ල නිවැරදිව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අධිකාරිය මඟින් අය කරනු ලබන පෙරසැරි ගාස්තුව ගෙවූ පසු එකී දේපළට අදාළ ලිපි ගොනුව සඳහා සේවා සැපයීම අරඹනු ලැබේ. ක්ෂේත්‍රයේ යම් කිසි වෙනස්කමක් හෝ සභාධිපත්‍ය පිඹුරේ යම්කිසි දෝෂයක් නොමැති නම් සහතිකය ලබා ගත හැක. ඉන්පසු ප්‍රකාශණ ඔප්පුවක් නීතීඥ වරයෙකු / වරියක ලවා සකස් කර ගැනීමෙන් පසු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචිය සිදු කළ යුතුය. එයින් පසු එක් එක් ගැනුම්කරුවන් සඳහා ඔප්පු නිකුත් කිරීමට හැකියාව ඇත.

තාවකාලික සභාධිපත්‍ය සහතිකය

සියළුම සභාධිපත්‍ය දේපළ ඉදිකරන්නන් සඳහා ඉදි කිරීම ආරම්භ කරන මූලික අවස්ථාවේදී මෙම තාවකාලික සභාධිපත්‍ය සහතිකය ලබා ගැනීමට අයදුම් කළ හැකිය. මෙය දේපළ සංවර්ධන සමාගමට බැංකු ණය ලබා ගැනීමට මෙන්ම එකී දේපලේ නිවාස විකිණීමට අදාළව ගැණුම්කරුවන් සඳහා ණය පහසුකම් ලබා ගැනීමටද උපකාරී වේ.



මෙම සහතිකය නිකුත් කිරීමේදී සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් තාවකාලික සභාධිපත්‍ය පිඹුරක් අනුමත කරනු ලබන අතර එය සාමාන්‍යාධිකාරිතුමන්ගේ අත්සන ඇතිව නිකුත් කරන ප්‍රධාන නීත්‍යානුකූල ලේඛනයකි. සභාධිපත්‍ය දේපළ මිළ දී ගන්නන් සඳහා සකස් කරන විකුණුම්කර එම තාවකාලික සභාධිපත්‍ය පිඹුරට අනුව සකස් කර ගත හැක. එසේම ඊට අදාළ ප්‍රකාශණ ඔප්පුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කිරීමටද බද්ධ නිවාස පනත මඟින් ප්‍රතිපාදන ලබාදී ඇත.

අර්ධ සභාධිපත්‍ය සහතිකය

අර්ධ සභාධිපත්‍ය සහතිකයක් යනු යෝජිත සභාධිපත්‍ය දේපළෙහි කොටසක් නිම කර ඉතිරිය පසුව සංවර්ධනය සඳහා ඉතිරි කරන අවස්ථාවකදී එකී අවසන් කළ කොටස සඳහා අනුකූලතා සහතිකයත් ලබා ඇති විට අයදුම් කළ හැකි සහතිකයකි. මෙය පැතිරුණු නිවාස ක්‍රමයක් ලෙස හෝ කුළුණු (Tower) ලෙස ඇති විටෙක හෝ නිවාස 02 ක් හෝ 03 ක් වැනි කුඩා අවස්ථාවක් සඳහා යොදා ගත හැක.



ඒ සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ලියාපදිංචි ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරයෙකුගේ සහතිකය ලබා ගත යුතුය.

මෙම සහතිකය ලබා ගැනීමේදී වැදගත්වන්නේ සාදා නිම කර ඇති කොටස් සඳහා හිමිකම් ඔප්පු ලබාදීමට හැකියාව තිබීමයි.

පාරිභෝගික සේවා අංශයේ කාර්යයභාරය

සභාධිපත්‍ය දේපළක පොදු අංගෝපාංග නඩත්තු කිරීම ඒකක අයිතිකරුවන් විසින් පිහිටුවා ගනු ලබන සංගම් හෝ මණ්ඩල මඟින් සිදු කළ යුතු බව 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනතේ 16 වන වගන්තියේ දක්වා ඇත. එහි සඳහන් පරිදි ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය දේපළක සියළුම අයිතිකරුවන් විසින් පොදු අංගෝපාංග පාලනය, කළමනාකරණය, නඩත්තුව හා පරිපාලනය කිරීම සඳහා ඔවුන්ගේ සංගම් හෝ මණ්ඩල පිහිටුවා ගැනීම නීත්‍යානුකූල බව සඳහන්ය. එසේ නමුත් එම කාර්යය සඳහා ප්‍රායෝගික ගැටළු මෙන්ම සභාධිපත්‍ය දේපළක කළමනාකරණය, නඩත්තුව සහ පරිපාලනය සඳහා එම පනතේ විධි විධාන ප්‍රමාණවත් නොවූ බැවින් ඊට වඩා පුළුල් බලතල සහිත යාන්ත්‍රණයක අවශ්‍යතාව මතු විය.

ඒ අනුව ඊට පිළියමක් ලෙස 1982 අංක 45 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනතේ 20 වන වගන්තිය තුළින් සභාධිපත්‍ය දේපළක පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් පාලනය, කළමනාකරණය සහ නඩත්තුව විධිමත්ව පවත්වාගෙන යාම සඳහා කළමනාකරණ සංස්ථාව නැමැති නීතිමය ව්‍යුහය හඳුන්වාදෙනු ලැබීය.

මහල් නිවාසවල පදිංචිව සිටින රජයේ මෙන්ම පෞද්ගලික අංශයේ බොහොමයක් මහල් නිවාසවාසීන් අප ආයතනයේ පාරිභෝගික සේවා අංශයේ ලියාපදිංචි වී සක්‍රීය කළමනාකරණ සංස්ථා පිහිටුවා ගෙන එම යාන්ත්‍රණය ඔස්සේ තම මහල් නිවාසයන්හී ඉදිරි යහ පැවැත්ම උදෙසා අවශ්‍ය කටයුතු සිදු කරගෙන යනු ලබයි.

ඒ අනුව මෙම සියළු සභාධිපත්‍ය දේපළ කළමනාකරණ සංස්ථාවන් හි බලයලත් නිළධාරී මණ්ඩලය වසරකට වරක් එම සභාධිපත්‍ය දේපළෙහි නිවාසලාභී සියළු මහල් නිවාසවාසීන්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන මහා සභා රැස්වීමකදී පත් කර ගනු ලබයි. එය කළමනාකරණ සංස්ථාවක් පිහිටුවීම කෙරෙහි බලපැවැත්වෙන මූලික නෛතික කොන්දේසියකි. එසේ පිහිටුවා ගනු ලබන කළමනාකරණ සංස්ථාව නිසි පරිදි ක්‍රමවත්ව සහ නීත්‍යානුකූල අන්දමින් පවත්වාගෙන යාම පිණිස වැදගත් වන මාර්ගෝපදේශයන්, උපදේශනමය සහ පරිපාලනමය සහාය ලබා දෙන්නේ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පාරිභෝගික සේවා අංශය විසිනි.

අධිකාරියේ ලියා පදිංචි වූ එක් එක් කළමනාකරණ සංස්ථා වෙනුවෙන් වෙන් වෙන්ව ලිපිගොනුවක් පවත්වා ගෙන යාම සිදු කරන අතර එම කළමනාකරණ සංස්ථාවල වාර්ෂික වාර්තා හා පැමිණිලි එම ගොනු තුළ ඇතුළත් වේ. තවද, කළමනාකරණ සංස්ථා හා කළමනාකරණ කමිටු ලියාපදිංචි කිරීම වාර්ෂික ලියාපදිංචිය අළුත් කිරීම හා ඒ සඳහා ගාස්තු අය කිරීමද පාරිභෝගික සේවා අංශයේ වගකීමකි.

පොදු අංගෝපාංග සඳහා වූ සහතිකය නිකුත් කළ සභාධිපත්‍ය දේපළවල කළමනාකරණ සංස්ථාව පිහිටුවීම සඳහා දේපළ සංවර්ධකට මඟ පෙන්වවීම සහ සම්බන්ධීකරණයද පාරිභෝගික සේවා අංශය මඟින් සිදු කරන අතර සභාධිපත්‍ය දේපළවලට අදාළව රජය \ ව්‍යවස්ථාපිත අධිකාරියක් \ පළාත් පාලන ආයතනයක් විසින් සිදු කරන තීරණ \ නිවේදන \ නියෝග සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමද සිදු කෙරේ.

එමෙන්ම අප පාරිභෝගික සේවා අංශයේ ලියාපදිංචි වී තිබෙන කළමනාකරණ සංස්ථාවන්හී සභාධිපත්‍ය දේපළට අදාළව ලැබෙන නිවාසවාසීන්ගේ පැමිණිලි සහ ගැටළු විසඳීමට මැදිහත්වීමද අපගේ පාරිභෝගික සේවා අංශය ඔස්සේ සිදුවන තවත් කාර්යයකි. එහිදී යම් නිවැසියෙකු විසින් කරනු ලබන පැමිණිල්ලකදී ප්‍රථමයෙන්ම එම පැමිණිල්ලේ ස්වභාවය හඳුනාගෙන ඉන් අනතුරුව එම ගැටළුව නිරාකරණය කිරීම සඳහා ඊට අදාළව ක්‍රියාත්මක වන අනෙකුත් ආයතනික අංශ වෙතට එම ගැටළුව යොමු කෙරේ. උදාහරණයක් වශයෙන් ගත් කළ පාරිභෝගික සේවා අංශය වෙත ලැබෙන පැමිණිල්ලක් ඊට අදාළ ඉදිරි පියවර සඳහා යොමු කළ යුතු වන්නේ ඉංජිනේරු අංශය වෙතටද නීති අංශය වෙතටද විගණන අංශය වෙතටද යන්න තීරණය කෙරෙන්නේ එම පැමිණිල්ලේ අන්තර්ගතය අනුවය. අප වෙත ලැබෙන පැමිණිලි අතරින් බහුතරයක් අනවසර ඉදිකිරීම්, ජල කාන්දුවීම්, ශබ්ද දූෂණය, සුරතල් සතුන් ඇති කිරීම, පොදු අංගෝපාංග අවහිර කිරීම, සාමාජික හෝ නඩත්තු මුදල් නොගෙවීම, වාහන අංගනයන්හී රථ වාහන ගාල් කිරීම වැනි ප්‍රශ්න අරබයා ඉදිරිපත් වේ. නීති අංශය විසින් පවරනු ලබන නඩු කටයුතු සඳහා සාක්ෂි ලබාදීමේ කටයුතු සිදු කිරීමද පාරිභෝගික සේවා අංශය මඟින් සිදු කෙරේ.

අනවසර ඉදිකිරීමක් සම්බන්ධයෙන් යම් කෙනෙකු පැමිණිල්ලක් අප අධිකාරිය වෙත ඉදිරිපත් කළ පසු එය ඉංජිනේරු අංශය වෙතටද කළමනාකරණ සංස්ථාවක මූල්‍යමය ගැටළුවක් සම්බන්ධයෙන් නම් එය විගණන අංශයටද නෛතික කරුණාක් සම්බන්ධව නම් නීති අංශය වෙතටද යොමු කෙරෙන්නේ එහි අන්තර්ගත ස්වභාවය සැළකිල්ලට ගනිමිනි. ඊළඟ පියවරේදී එම පැමිණිල්ල සඳහා ස්ථානීය පරීක්ෂාවක් අවැසි වේ නම් අපගේ ඉංජිනේරු අංශයේ කණ්ඩායමක් පැමිණ එම පැමිණිල්ලට අදාළ කරුණු සොයා බලා ඊට සුදුසු පිළියම් යෝජනා කරමින් අදාළ කළාපය භාර සහකාර සාමාන්‍යාධිකාරිවරයා වෙත යොමු කෙරේ. ඉන්පසුව පැමිණිල්ලට අදාළ නිර්දේශයන් පාරිභෝගික සේවා අංශය වෙත යොමු කෙරේ. එම නිර්දේශයන් අඩංගු වාර්තාවට අනුව පාරිභෝගික සේවා අංශය විසින් සිය අවසාන තීරණය පැමිණිලිකාර පාර්ශවය වෙත ඉදිරිපත් කරයි.

මීට අමතරව අනවසර ලෙස මූලික සභාධිපත්‍ය ගොඩනැගිල්ලේ ව්‍යුහය වෙනස් කිරීම, සංවර්ධක නිසි පරිදි දේපළ ඉදි නොකිරීම නිසා ඇති වන ගැටළු, දේපළ සංවර්ධක සහ කළමනාකරණ සංස්ථාව අතර වන ගැටළු වැනි දෑ පාරිභෝගික සේවා අංශය වෙත ලැබෙන පැමිණිලි අතර වේ.

කඩිනමින් පාරිභෝගික පැමිණිලිවලට විසඳුම් සෙවීම අරමුණු කර ගනිමින් පාරිභෝගික සේවා අංශය විසින් ක්ෂණික ඇමතුම් අංකයක් හඳුන්වාදී ඇති අතර 011-2444575 අංකය ඇමතීමෙන් සතියේ වැඩ කරන දිනයන්හීදී සභාධිපත්‍ය ක්ෂේත්‍රයට අදාළ වන කරුණු පිළිබඳව අප ආයතනය හා සම්බන්ධව තොරතුරු සහ අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාව ඒ අනුව ලැබී ඇත.

මීට අමතරව සියළුම සභාධිපත්‍ය දේපළ හිමියන් සභාධිපත්‍ය නීතිය හා ඔවුන්ට වැදගත්වන අනෙකුත් කරුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම සභාධිපත්‍ය නීතිය පිළිබඳව රාජ්‍ය ආයතන හා නිළධාරීන් දැනුවත් කිරීම දිවයින පුරා පිහිටි සභාධිපත්‍ය දේපළ පිළිබඳ සමීක්ෂණ කටයුතු සිදු කිරීම වැනි කටයුතුද පාරිභෝගික සේවා අංශය මඟින් සිදු කරනු ලබන අතර සභාධිපත්‍ය දේපළක මනා පැවැත්ම වෙනුවෙන් එම දේපළෙහි වෙසෙනා ජනතාවගේ දායකත්වය සක්‍රීයව ලබා ගනිමින් ප්‍රජා සහභාගීත්ව කළමනාකරණ උපක්‍රම හරහා එම ප්‍රජාව නැවත බලගැන්වීමද සිදු කරනු ලබයි.

මීට අමතරව,

- අක්‍රිය කළමනාකරණ සංස්ථා නැවතත් සක්‍රීය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශනය ලබාදීම.
- සභාධිපත්‍ය දේපළවල පොදු උද්‍යාන, ළමා ක්‍රීඩාංගන, අතුරු මාර්ග ආදී පොදු දේපළ පළාත් පාලන ආයතන වෙත පැවරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා මැදිහත්වීමක් පාරිභෝගික සේවා අංශය විසින් සිදු කරනු ලබයි.
- සභාධිපත්‍ය දේපළේ ආයු කාලය අවසන් වූ පසුව ඒ පිළිබඳව කළමනාකරණ සංස්ථා හරහා තොරතුරු ලබා ගෙන අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට කටයුතු කිරීම වැනි කාර්යයන්ද පාරිභෝගික සේවා අංශය විසින් ඉටු කරනු ලබයි.

පාරිභෝගික සේවා අංශයේ සහාධිපත්‍ය පැමිණිලි සම්බන්ධයෙන් විසඳුම් ලබාදීමේ යාන්ත්‍රණය









කළමනාකරණ සංස්ථා සවිබල ගැන්වීම

දේපළක හිමිකාරිත්වය දරණ පුද්ගලයෙකුට එම දේපළ හිමිකරු / හිමිකරුවන් විසින් නඩත්තු කිරීම සිදුවුවද, හවුලේ භුක්ති විඳින සභාධිපත්‍ය පොදු අංගෝපාංග සහ පොදු පහසුකම් නඩත්තු කිරීම නිශ්චිත පුද්ගලයෙකු විසින් කළ හැක්කක් නොවන බැවින් හවුලේ භුක්ති විඳින සියළු දෙනා එක්ව මෙම පොදු පහසුකම් සහ පොදු අංගෝපාංග කළමනාකරණය සහ පරිපාලනය සඳහා ඇති කර ගනු ලබන නෛතික ව්‍යුහය වන්නේ කළමනාකරණ සංස්ථාවයි.

2005 වසරේ සිට මේ දක්වා අධිකාරිය සභාධිපත්‍ය දේපළ 1,093 ක කළමනාකරණ සංස්ථා පිහිටුවා ඇත.

කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් සුපුරුදු ලෙස මහජනතාව හා ගැටෙමින් රාජකාරිමය කටයුතු ඉටු කළ නොහැකි පසුබිමක වුවද සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පාරිභෝගික සේවා අංශය, ඉංජිනේරු අංශය හා නීති අංශය සභාධිපත්‍ය දේපළ තුළ ජීවත් වන ජනතාවගේ සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් වන ගැටළු විසඳීම සඳහා සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් මේ සඳහා හැකි උපරිම දායකත්වය දක්වන ලදී.

ඒ අනුව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් කළමනාකරණ සංස්ථාවලින් ලැබුණු පැමිණිලි 512 කින් 416 කට විසඳුම් ලබා දීමට 2020 වර්ෂය තුළ හැකිවිය.

2017 සිට 2020 දක්වා පිහිටුවන ලද එවැනි කළමනාකරණ සංස්ථා සම්බන්ධ ප්‍රගතිය

කළමනාකරණ සංස්ථා හා කමිටු ලියාපදිංචි කිරීම / ලියාපදිංචිය අළුත් කිරීම / අක්‍රිය කළමනාකරණ සංස්ථා සක්‍රිය කිරීම.

වර්ෂය	ලියාපදිංචි කිරීම.		ලියාපදිංචිය අළුත් කිරීම/ අක්‍රිය කළමනාකරණ සංස්ථා සක්‍රිය කිරීම.		මූල්‍ය (රු.දහස්)	
	ඉලක්ක	ප්‍රගතිය	ඉලක්ක	ප්‍රගතිය	ඉලක්ක	ප්‍රගතිය
2017	102	46	891	400	2,385	1,370
2018	48	56	299	546	3,350	1,805
2019	45	59	235	487	2,770	1,753
2020	80	60	750	390	2,700	2,072

කළමනාකරණ සංස්ථා ලියාපදිංචි කිරීම.



ලියාපදිංචිය අළුත් කිරීම/ අක්‍රිය කළමනාකරණ සංස්ථා සක්‍රිය කිරීම.



කළමනාකරණ සංස්ථා හා කමිටු ලියාපදිංචි කිරීමෙන් ලද ආදායම



කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂය තුළ මූල්‍ය හා භෞතික ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි විය.

කළමනාකරණ සංස්ථා පිහිටුවීමේදී මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා

- දේපළේ පොදු අංගෝපාංග නඩත්තුව සඳහා කළමනාකරණ සංස්ථාවේ වැදගත්කම පිළිබඳ දේපළ අයිතිකරුවන්ගේ ඇති දැනුවත්භාවයේ අඩුපාඩු පැවතීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන විසින් ඉදිකරන ලද මහල් නිවාස ක්‍රමවල පදිංචිකරුවන් තවමත් කළමනාකරණ සංස්ථාවන් පිහිටුවීම සම්බන්ධයෙන් උනන්දුවක් නොදැක්වීම.
- පෞද්ගලික ආයතන විසින් ඉදිකරනු ලබන බොහෝ දේපළවල අයිතිකරුවන් ස්ථිර ලෙස වේවායේ පදිංචි නොවීම.
- කළමනාකරණ සංස්ථාවේ කටයුතු කිරීම සඳහා තමාගේ කාලය හා ශ්‍රමය කැප කිරීමට නිවාසවාසීන් තුළ ඇති අකමැත්ත.
- රාජ්‍ය සභාධිපත්‍ය දේපළවල පදිංචිකරුවන් නඩත්තු මුදල් ගෙවීම පැහැර හැරීම හා කළමනාකරණ සංස්ථාවේ නිළධාරී මණ්ඩලයට අනෙක් පදිංචිකරුවන්ගේ සහාය නොදැක්වීම.
- රජය ඉදිකළ සභාධිපත්‍ය දේපළවල අනවසර ඉදිකිරීම් බහුලවීම හේතුවෙන් බහුතර පදිංචිකරුවන් ඒ සඳහා දක්වන විරෝධතාව
- රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම සංවර්ධනකරු හෝ දේපළ මිළ දී ගන්නා පුද්ගලයින්ගේ පවතින ගැටළු හේතුවෙන් නිවාස ඒකක හිමිකරුවන් සඳහා ඔප්පු නොලැබී යාම මත කළමනාකරණ සංස්ථා පිහිටුවීමේ නොහැකියාව

2005 - 2020 දක්වා ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වී ඇති රාජ්‍ය සහ පෞද්ගලික සභාධිපත්‍ය දේපල



සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවීමෙන් පසු ශ්‍රී ලංකාවේ ඉදිකරනු ලැබූ සභාධිපත්‍ය දේපළ විකාශනය ඉහත සිතියමෙහි දැක්වේ. 2005 සිට 2020 දක්වා එම සභාධිපත්‍ය දේපලයන්හි කළමනාකරණ සංස්ථා 1,093 ක් පිහිටුවා ඇත.



නීති අංශයේ කාර්යයභාරය

සංශෝධිත පනත්වලින් සංශෝධනය කරන ලද 1973 අංක 10 දරණ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනතේ 6 (ක) වන වගන්තිය ප්‍රකාරව සභාධිපත්‍ය දේපලේ හෝ ලියාපදිංචි තාවකාලික සභාධිපත්‍ය දේපලේ සභාධිපත්‍ය කොටස්වල කළමනාකරණ සංස්ථාව සහ එහි අයිතිකරු අතර හෝ අයිතිකරු හෝ පදිංචිකරු අතර හෝ අයිතිකරු සහ මිළ දී ගත් තැනැත්තා අතර හෝ අයිතිකරු සහ උකස්කරු අතර හෝ උකස්කරු සහ මිළ දී ගැනීමට අදහස් කරන තැනැත්තා අතර හෝ උකස්කරු සහ උකස්ලාභියා අතර ඇති වන ආරවුල් විසඳීමේ බලය සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට ලැබී ඇත.

ඒ යටතේ එකී පනතේම 16 (1) වගන්තියේ දක්වා ඇත්තේ ඉහත සඳහන් කළ පාර්ශවයන් අතර සභාධිපත්‍ය කොටසක් භාවිතා කිරීමේදී හෝ අත්කර ගැනීමේදී හෝ එයට අනුබද්ධව පොදු පහසුකම් හෝ පොදු අංගෝපාංග භුක්ති විඳීමට යාමේදී කිසියම් ආරවුලක් මතු වූ අවස්ථාවක ඒ තැනැත්තා හෝ කළමනාකරණ සංස්ථාව විසින් ඒ බව අධිකාරියට දැනුම් දිය යුතු අතර අධිකාරිය විසින් නිසි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු යුක්ති සහගත සහ සාධාරණ නියෝගයක් නිකුත් කරනු ලැබිය යුතු බවයි.

ඒ අනුව පාරිභෝගික සේවා අංශය මඟින් කළමනාකරණ සංස්ථාවලට සහ සභාධිපත්‍ය දේපලේ පදිංචිකරුවන්ට අදාළ ගැටළු මෙන්ම ඉංජිනේරු අංශය මඟින් දේපළ සංවර්ධනකරුවන්ට අදාළ ගැටළු ලිඛිතව හෝ සාකච්ඡා මාර්ගයෙන් විසඳීමට නොහැකි වූ අවස්ථාවන්හිදී නීති අංශය වෙත යොමු කරන අතර නීති අංශය මඟින් එම ගැටළු සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් පත් කරනු ලබන පරීක්ෂණ නිලධාරියෙකු වෙත යොමු කරයි. පරීක්ෂණ නිලධාරී විසින් නිකුත් කරන ලද නිර්දේශ ප්‍රකාරව සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් නියෝගය නිකුත් කරනු ලබන අතර එකී නියෝගය උල්ලංඝනය හෝ පිළිපැදීම පැහැර හරින පුද්ගලයින් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව වරදකරුවෙකු වේ. නීති අංශය විසින් නියෝග පිළිනොපදින පුද්ගලයින්ට විරුද්ධව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කරනු ලබන අතර වෙනත් පාර්ශවයක් විසින් අධිකාරියට විරුද්ධව පවරනු ලබන නඩු වෙනුවෙන්ද නීති අංශය පෙනී සිටී.

එකී කාර්යයන්වලට අමතරව කාලීන අවශ්‍යතාව අනුව සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරී පනතට හා බද්ධ නිවාස අයිතිකම් පනතට අදාළ සංශෝධනයන් හඳුනා ගනිමින් එකී පනත් සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමද නීති අංශයට අදාළ කාර්යයභාරයක් වේ.

එසේම සභාධිපත්‍ය දේපළවලට අදාළ යම් පුද්ගලයෙකුගෙන් හෝ සභාධිපත්‍ය දේපළවල අයිතිකරුවෙකුගෙන් යම් මුදල් ප්‍රමාණයක් අයවිය යුතු අවස්ථාවකදී එම මුදල් අය කර ගැනීමට අදාළ නීති කටයුතු කිරීම.

නීතිපති දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වැනි ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් සභාධිපත්‍ය දේපළවලට අදාළ නීතිමය කටයුතු ආවරණය කිරීම සිදු කරනු ලබයි.

තවද, සභාධිපත්‍ය දේපළ සංවර්ධකයින්, කළමනාකරණ කමිටු නිළධාරීන්, සභාධිපත්‍ය දේපළ පදිංචිකරුවන් මෙන්ම සභාධිපත්‍ය දේපළ ක්ෂේත්‍රයට අදාළ වෘත්තිකයින් සභාධිපත්‍ය නීතිය පිළිබඳ දැනුවත් කිරීමද නීති අංශය විසින් සිදු කරනු ලැබේ. මීට අමතරව සභාධිපත්‍ය දේපළ පිළිබඳව පවතින නීතිමය ගැටළු විසඳීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමද නීති අංශය මඟින් සිදු කරනු ලබන අතර සභාධිපත්‍ය දේපළ ඉදි කිරීම් කරනු ලබන සංවර්ධකයින් මෙන්ම සභාධිපත්‍ය දේපලේ ජීවත් වන ජනතාවගේ නීතිමය ගැටළු විසඳමින් වඩාත් සුවපහසු ජීවිතයක් ලඟා කර ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම නීති අංශය මඟින් සිදු කරනු ලබයි.

නීති අංශයේ පැමිණිලි සම්බන්ධයෙන් විසඳුම් ලබාදීමේ යාන්ත්‍රණය



සභාධිපත්‍ය දේපළ භාවිතයේදී පැන නඟින ගැටළු

පරීක්ෂණ සභාව වෙත ඉදිරිපත් වන පැමිණිලි ස්වරූපය අනුව පහත දැක්වෙන ලෙස වර්ග කළ හැක.

- සභාධිපත්‍ය ගොඩනැගිල්ල ඉදිකර විකිණීමේ ගිවිසුමකින් විකුණා මාස 10 කට අධික කාලයක් ගතවී ඇතත් සභාධිපත්‍ය පිඹුර ලියාපදිංචි නොකර පදිංචිකරුවන්ට ඔප්පු ලබා නොදීම.
- සභාධිපත්‍ය දේපළේ පවතින අඩුපාඩු සංවර්ධනකරු විසින් පිළිසකර නොකිරීම.
- පොදු අංගෝපාංග හා පොදු පහසුකම් අනුමත ගොඩනැගිලි සැළැස්මට අනුකූලව ඉදිකිරීම් නොකිරීම.
- අයිතිකරුවන් කළමනාකරණ සංස්ථාවට මාසික නඩත්තු මුදල් නොගෙවීම.
- අනවසර ඉදිකිරීම් සිදුකිරීම සහ වාහන නැවතුම් ස්ථාන, පොදු භූමිය පරිහරණයේදී ඇතිවන ගැටළු
- සභාධිපත්‍ය දේපළ තුළ සුරතල් සතුන් ඇති කිරීම.

2020 වර්ෂයේදී කොවිඩ් තත්වය යටතේ වුවද මෙලෙස ලැබුනු පැමිණිලි 51 කින් 32 ක් විසඳීමට අධිකාරියේ නීති අංශය කටයුතු කර ඇත.

විසඳුම් ලබාදුන් ආරවුල් සංඛ්‍යාව	
2018	48
2019	64
2020	32

මහජන දුක් ගැනවිලි වලට ප්‍රශස්ථ ප්‍රතිචාර දැක්වීම සඳහා වූ ආයතනික යාන්ත්‍රණය

පැමිණිල්ලක් ලැබුණු පසු වග උත්තරකාර පාර්ශවය වෙත පැමිණිල්ලේ පිටපතක් යවා ඒ සම්බන්ධ නිරීක්ෂණ දින 14 ක් ඇතුලත ලබා ගැනීම.

- නිරීක්ෂණ ලැබී සති 02 ක් ඇතුළත පරීක්ෂණයට කැඳවීම.
- සමථයක් ඇත්නම් ප්‍රථම දිනයේම එය වාර්ථා කර පරීක්ෂණය අවසන් කිරීම.
- සමථයකට පත් නොවන්නේ නම් පරීක්ෂණයකට ඉදිරිපත් කිරීම. / කැඳවීම.
- වාචික සාක්ෂි හෝ ලිඛිත සාක්ෂි ලබා ගැනීම.

ඒ අනුව,

- නියෝග නිකුත් කිරීම.
- නියෝග පිළි නොපඳින අවස්ථාවකදී අධිකරණමය ක්‍රියාමාර්ග ගැනීම.

ප්‍රජා සෞඛ්‍ය සුරක්ෂාව සඳහා

කොවිඩ් 19ට එරෙහිව



2020 කොවිඩ් තත්ත්වයට මුහුණදීම සඳහා රජය මඟින් ඉටු කළ නිරෝධායන වැඩසටහන ලෝකයේ අනෙකුත් රටවල් අබිබවා රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ගනු ලැබූ විශිෂ්ඨ ක්‍රියාදාමයකි. එහිදී ආයතනික සමාජ ආරක්ෂණ, වගකීමක් ලෙස සළකා 2020 වර්ෂයේදී සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියද කොවිඩ් මර්ධන අරමුදල සඳහා සංචිත තැන්පතුවෙන් රු. මී. 10 ක මූල්‍ය පරිත්‍යාගයක් අධිකාරියේ සභාපතිතුමා විසින් ගරු අග්‍රාමාත්‍යතුමන් වෙත පරිත්‍යාග කරන ලදී.



11

තිරසර නගර හා ජනාවාස ඇති කිරීම.



15

ජෛව විවිධත්වය හා ජෛව පද්ධති සුරැකීම.

තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන උපාය මාර්ග

ඉදිරි වසරේ සිට දේපළ සංවර්ධකයින්, ඉංජිනේරුවරුන්, වාස්තු විද්‍යාඥයින්, ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන් සඳහා පරිසර හිතකාමී සහ ඒ මත වැඩි වටිනාකමක් සහිත සභාධිපත්‍ය දේපළ ඉදිකිරීම් සම්බන්ධයෙන් මූලික නිෂ්කාශන අවස්ථාවේදී දැනුවත්කිරීමට කටයුතු කරනු ලැබේ.

තිරසර සංවර්ධන උපාය මාර්ග 07

එමෙන්ම සභාධිපත්‍ය දේපළක් සැළසුම් කිරීමේදී ස්වභාවික ආලෝකය සහ වාතාශ්‍රය වැඩිවන පරිදි නිර්මාණය කිරීමෙන් බලශක්තිය ඉතිරි කර ගැනීමට දායකවීම.

සූර්ය බල ශක්තිය උපයෝගී කර ගෙන විදුලි බලය ජනනය කිරීම.

අප ජලය, මළ අපවාහන පද්ධති ප්‍රතිචක්‍රීකරණය

වැසි ජල ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලිය

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති පිහිටුවීම.

තිරසර සංවර්ධන උපාය මාර්ග 11

මේ යටතේ නව කළමනාකරණ සංස්ථා පිහිටුවීම, අක්‍රිය කළමනාකරණ සංස්ථා සක්‍රිය කිරීම සහ සක්‍රිය කළමනාකරණ සංස්ථා විධිමත්ව පවත්වාගෙන යාමට උපදෙස් සහ සහය ලබාදීම සිදුකරනු ලබයි. ”සවිමත් කළමනාකරණ සංස්ථාවක් සුවපහසු මහල් නිවාස දිවියක සවියයි තේමාව ඔස්සේ සභාධිපත්‍ය මහල් නිවාසවාසීන්ට ප්‍රශස්ථ සේවාවක් ලබාදීම එමගින් සිදුකෙරේ.

තිරසර සංවර්ධන උපාය මාර්ග 15

සභාධිපත්‍ය දේපළක් ඉදිකිරීමේ හා සැළසුම් කිරීමේ අවස්ථාවන්හී පැරණි ගස් ආරක්ෂා වන සේ සහ ඉදිකිරීමෙන් පසු පොදු ස්ථානයන්හී නව රුක් රෝපණයන් සිදු කිරීම. එමඟින් නිවාසවාසීන්ට වඩාත් පිරිසිදු වාතාශ්‍රයක් ලබා ගැනීමට හැකිවීම.

යන කරුණු සම්බන්ධයෙන්ද සභාධිපත්‍ය දේපළක් ඉදි කිරීමට පෙර ඊට සම්බන්ධ පාර්ශවයින් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

තිරසර සංවර්ධන උපාය මාර්ග 15

2020 වසරේදී ලෝක ව්‍යාප්ත කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ජාතියේ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් රජය මඟින් “හෙට දිනය වෙනුවෙන් අද වවමු” දීප ව්‍යාප්ත වගා සංග්‍රාමය ක්‍රියාත්මක කරන ලදී. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියද සභාධිපත්‍ය ක්ෂේත්‍රයේ නියාමන අධිකාරිය ලෙස එම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා මහල් නිවාසවාසීන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම වෙනුවෙන් වේළුවනපුර නිවාස යෝජනා ක්‍රමයෙහි නියාමන ව්‍යාපෘතියක් ලෙස වගා සංග්‍රාම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

ආරක්ෂාකාරී, සුනම්‍ය හා තිරසාර නගර හා මානව ජනාවාස ඇති කිරීමට අනුගතවෙමින් නිවාස යෝජනා ක්‍රමයන්හී රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර හෝමාගම ජල්තර සහ වේළුවනපුර නිවාස සංකීර්ණයන්හී ඖෂධ පැළෑටි හා ශාක රෝපණ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මෙහිදී එම නිවාස යෝජනා ක්‍රමයන්හී වටිනා දේශීය ශාක හා ඖෂධ පැළෑටි 300 ක පමණ ප්‍රමාණයක් රෝපණය කරන ලදී.

2000 වසරේදී තිරසර සංවර්ධන අභිමතාර්ථ එළි දක්වන ලදී. එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටු ඇතුළු විවිධ රාජ්‍ය හා පෞද්ගලික සංවිධාන මඟින් පවත්වනු ලැබූ දීර්ඝ සහ සංකීර්ණ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉදිරිපත් කර ඇත. ප්‍රධාන වශයෙන් සැලකුවිට තිරසර සංවර්ධන අභිමතාර්ථ ව්‍යුහය දිළිඳුකම පිටුදැකීම, පෘථිවිය ආරක්ෂා කිරීම සහ සැමට සෞභාග්‍යය උදා කිරීම සඳහා වූ ක්‍රියාකාර් සැළැස්මකි. තිරසර සංවර්ධන අභිමතාර්ථ ව්‍යුහය ලෝකයේ තිරසාර, ස්ථායී සංවර්ධන මාවතකට යොමු කිරීමට දායකවන පැහැදිලි පරිවර්තනාත්මක මුල්පිරීම් රැසක් අරමුණු කර ඇත. මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් සියළු සාමාජික රටවල් එකී අභිමතාර්ථයන් ඉටු කිරීම සඳහා බැඳී සිටී.

අරමුණු 17 ක්, සම්බන්ධිත ඉලක්ක 169 ක්, දර්ශක 230 ක් ඔස්සේ තිරසර සංවර්ධන අභිමතාර්ථ රටක ආර්ථික, සාමාජීය හා පාරිසරික ප්‍රමිතීන් වර්ධනය උදෙසා ක්‍රියාවට නැංවීමට උපාය මාර්ගික සැළසුම් සකසා ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවද එකී අභිමතාර්ථයන්ට ලඟාවීම සඳහා 2017 අංක 19 ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත මඟින් අදාළ මාර්ගෝපදේශයන් ලබා දී ඇත. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියද සභාධිපත්‍ය ක්ෂේත්‍රයේ රාජ්‍ය නියාමන අධිකාරිය ලෙස අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ ව්‍යාපෘති හා උපාය මාර්ගික සැළසුම් මඟින් එකී අභිමතාර්ථයන් බලගැන්වීම සඳහා දායක වී ඇත.





වේළුවනාරාම නිවාස යෝජනා ක්‍රමය සහ ජල්තර රාජ්‍ය සේවක නිවාස යෝජනා ක්‍රමයන්හී ක්‍රියාත්මක කරනු ලැබූ රුක් රෝපණ ව්‍යාපෘතිය

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නියාමන මැදිහත්වීම

බලතල හා ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, අතිශය වැදගත් සේවාවන් රැසක් ඉටුකිරීමට සමත්විය.

- පසුගිය දශක ගණනකට පෙර ඉදිකර පදිංචිය ලබා දී ඇති නමුත් මෙතෙක් සභාධිපත්‍ය දේපළක් ලෙස ලියාපදිංචි නොකරන ලද නිවාස පදිංචිකරුවන්ට අයිතිය පැවරීමට නොහැකිව ඇති දේපළ ලියාපදිංචි කළ හැකි පරිදි 1999 අංක 04 දරණ බද්ධ නිවාස අයිතිකම් විශේෂ විධි විධාන පනත නැවත සංශෝධනය කර අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා ගැනීම සඳහා 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2017 වසරේදී එම කාර්යය වේගවත් කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම පනත 2018.08.08 වන දින සම්මත කළ අතර එමගින් වසර 15 ක පමණ කාලයක සිට ඔප්පු ලබාගැනීමට නොහැකිව සිටි පවුල් 8,000 කට පමණ මෙමඟින් සෙත සැලසේ.

- 1973 අංක 10 දරණ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරි පනතට හා 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනතට අදාළ සංශෝධන සකස්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද විද්වත් කමිටුව මේ වන විට අවශ්‍ය වන සියළු සංශෝධන යෝජනා කර එම වාර්තාව නීති කොටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මෙමඟින් සභාධිපත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රායෝගික ගැටළු බොහොමයක් සඳහා විසඳුම් ලැබෙන අතර අධිකාරියට කාලීන අවශ්‍යතාවන්ට අනුව විසඳුම් ලබාදීමට හැකියාවද මෙමඟින් සැළසී ඇත.

- සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරි පනතට හා බද්ධ නිවාස අයිතිකම් පනතට අදාල වන රෙගුලාසි වලට අදාල අති විශේෂ ගැසට් පත්‍රය 2017 ජූලි මස 05 වන දින අංක 2026/25 යටතේ නිකුත් කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

2020 වර්ෂයේ මාර්තු මස 16 දින සිට මැයි දක්වාත් නැවත 2020 ඔක්තෝම්බර් 04 සිට ඉදිරියටත් දිවයිනට අවාසනාවන්ත ලෙස බල පෑ කොවිඩ් 19 වසංගත තත්ත්වය මත කොළඹ බල ප්‍රදේශය ඇතුළුව මුළු දිවයින පුරාම විටින්විට අගුළු දැමීම සහ සංචරණ සීමාවන් පැනවීම යනාදිය මත 2020 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්ද පැවැත්වීම සීමා වන ලදී. 2020 වර්ෂයේදී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 07 ක් පවත්වන ලද අතර, ක්ෂේත්‍රය සම්බන්ධ වැදගත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා රාශියක් සඳහා තීරණ ගන්නා ලදී.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනුමත සහ සත්‍ය සේවක ඇස්තමේන්තුව

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
සාමාන්‍යාධිකාරී - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	01	01	-
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නියාමන)	01	-	01
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	01	01	-
සහකාර සාමාන්‍යාධිකාරී (නීති)	02	01	01
සහකාර සාමාන්‍යාධිකාරී (නියාමන)	01	01	-
සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් නඩත්තු)	04	03	01
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් පරිපාලන)	01	-	01
සහකාර සාමාන්‍යාධිකාරී (වාස්තු විද්‍යාඥ)	01	-	01
සහකාර සාමාන්‍යාධිකාරී (පාරිභෝගික සේවා)	01	-	01
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)	01	01	-
අභ්‍යන්තර විගණක	01	01	-
පාරිභෝගික සේවා නිළධාරී	02	02	-
ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර	05	01	04
කළමනාකරණ තොරතුරු පද්ධති නිළධාරී	01	01	-
ලේකම්	02	01	01
පරිපාලන නිළධාරී	01	-	01
ගිණුම් නිළධාරී	01	01	-
අභ්‍යන්තර විගණක නිළධාරී	01	01	-
කළමනාකරණ සහකාර - තාක්ෂණික (ඉංජිනේරු සහකාර / සැළසුම් ශිල්පී)	14	13	01
කළමනාකරණ සහකාර - තාක්ෂණික (පොත් තබන්නා)	01	01	-
කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන	39	38	01
ප්‍රාථමික ශිල්පීය - (රියදුරු)	14	14	-
වඩුකාර්මික	02	02	-
පෙදරේරු	02	02	-
පොම්ප ක්‍රියාකරු / භාරකරු	08	07	01
ජල නළ වැද්දුම්කරු	01	01	-
ප්‍රාථමික - අර්ධ ශිල්පීය (විදුලි කාර්මික)	02	02	-
පොත් බැඳුම්කරු	01	-	01
ප්‍රාථමික ශිල්පීය නොවන - (කාර්යාල සහායක) / (නුපුහුණු කම්කරු)	21	19	02
නිවාස පරිපාලක	07	07	-
එකතුව	140	122	18

සේවක මණ්ඩල ප්‍රතිසංවිධානය

2020 වර්ෂයේ දී අනුමත කාර්ය මණ්ඩලය 140 ක් වූවත් 2020 දෙසැම්බර් වනවිට කාර්ය මණ්ඩලය 122 ක් විය. බඳවා ගැනීමේ පටිපාටිය අනුව පවතින පුරප්පාඩු 2021 වර්ෂයේදී පිරවීමට කටයුතු කිරීමට අපේක්ෂිතය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය පුහුණු වීම්

2020 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට අනුව සැළසුම් කළ අධිකාරියේ කාර්ය මණ්ඩලය පුහුණු වීම් කිහිපයක් පමණක් පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද සිදු කිරීමට හැකි විය.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2020 වර්ෂයේදී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමට කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ නොහැකිවිය.

ආයතනික සැලැස්ම
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය



බඳවා ගැනීමේ පටිපාටිය අනුව අනුමත සේවක සංඛ්‍යාව



ජ්‍යෙෂ්ඨ කළමනාකරණ	03
මධ්‍යම කළමනාකරණ	12
කනිෂ්ඨ කළමනාකරණ	13
කළමනාකරණ සහකාර - තාක්ෂණික	15
කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන	39
ප්‍රාථමික - ශිල්පීය	18
ප්‍රාථමික - අර්ධ ශිල්පීය	12
ප්‍රාථමික - ශිල්පීය නොවන	28

2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචිත වාර්තාව

2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටුව පහත සඳහන් නිළධාරීන්ගෙන් සමන්විත වේ.

බී. එන්. ගමගේ මහත්මිය
කමිටු සභාපතිනිය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
(භාණ්ඩාගාර නියෝජිත)

ලලිත් එදිරිසිංහ මහතා
කමිටු සාමාජික
සාමාන්‍යාධිකාරී (වැ. බ)
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
කොළඹ - 02

නීතීඥ රෝෂණී දිසානායක මහත්මිය
කමිටු සාමාජික
නාගරික කොමසාරිස්
කොළඹ මහ නගර සභාව

ඩබ්. ටී. ඒ. මානෙල් මහත්මිය
කමිටු සාමාජික
නාගරික කොමසාරිස්
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම මහතා
කමිටු සාමාජික
නාගරික කොමසාරිස්
දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව
2020.12.21 දින සිට

ඒ. ඩී. එස්. සදීකා මහත්මිය
කමිටු සාමාජික
නාගරික කොමසාරිස්
ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව

සංජීව බන්ධුකීර්ති මහතා
කමිටු සාමාජික
නාගරික කොමසාරිස් (වැ. බ)
ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව
2020.12.07 දින සිට

පී. එල්. එම්. චතුරංග මහතා
කමිටු සාමාජික
නාගරික කොමසාරිස් (වැ. බ)
ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභාව
2020.12.21 දින සිට

වී. ඩී. සීතා මහත්මිය
කමිටු නිරීක්ෂක
විගණන අධිකාරි
නියෝජ්‍ය විගණකාධිපති නියෝජිත
විගණකාධිපති දෙපාර්තමේන්තුව

ආර්. එස්. සමරක්කොඩි මහතා
කමිටු නිරීක්ෂක
ප්‍රධාන අභ්‍යන්තර විගණක
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

ඊ. එල්. ඒ. පී. කුමාර මහතා
කමිටු නිරීක්ෂක
ප්‍රධාන අභ්‍යන්තර විගණක
නාගරික සංවර්ධන වෙරළ සංරක්ෂණ අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
2020.12.07 දින සිට

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නිළධාරීන් ලෙස පහත සඳහන් නිළධාරීන් සහභාගී විය.

නීතීඥ සරණ කරුණාරත්න මහතා
සභාපති
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

ආර්. කේ. ජයවීර මහතා
සාමාන්‍යාධිකාරි
2020.04.30 දින දක්වා

මාධවී එස්. පරණයාපා මහත්මිය
සාමාන්‍යාධිකාරි (වැ. බ)
2020.06.12 දින සිට 2020.11.25 දින දක්වා

ආචාර්ය ඉඳුනිල් ලියනගේ මහතා
සාමාන්‍යාධිකාරි
2020.11.26 දින සිට

කේ. එච්. ඒ. උපාලි මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)

ජේ. ඩී. එන්. චන්ද්‍රපාල මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නියාමන) (වැ. බ)
2020.10.13 දක්වා

පී. එම්. මහේෂ් ගුණතිලක මහතා
අභ්‍යන්තර විගණක

පී අමිල නිශාන්ත මහතා
සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්)

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය 2020 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇති අතර පහත සඳහන් විගණන හා කළමනාකරණ කමිටු පත්‍රිකා සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශයට ඉදිරිපත් කර ඇත.

තවද, 2020 වසරේ මාර්තු 16 දින සිට මැයි දක්වාත් නැවත 2020 ඔක්තෝම්බර් 04 සිට ඉදිරියටත් දිවයිනට අවාසනාවන්ත ලෙස බල පෑ කොවිඩ් 19 වෛරස් වසංගත තත්ත්වය මත කොළඹ බල ප්‍රදේශය ඇතුළුව මුළු දිවයින පුරාම විටින්විට රට අගුළු දැමීම සහ සංචරණ සීමාවන් පැනවීම යනාදිය මත 2020 වර්ෂය සඳහා දෙවන කාර්තුවට අදාළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම නොපැවැත්විණි.

01. 2020.03.06 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුව විසින් පහත සඳහන් වාර්තා සාකච්ඡා කරන ලදී.

1.1 2019 ඔක්තෝම්බර් මස 31 වැනි දින ප.ව. 3.00 ට පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තා සටහන් සහතික කිරීම.
1.2 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අවසන් ගිණුම් (කාර්යය සාධන ප්‍රකාශය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය)
1.3 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2020 වර්ෂය සඳහා අයවැය ලේඛනය
1.4 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2020 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම
1.5 2020 වසරට අදාළව සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරී බලතල පැවරීම.
1.6 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2020 වසරට අදාළ අභ්‍යන්තර විගණන වැඩසටහන
1.7 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2019 වසරට අදාළ විගණකාධිපති විගණන විමසුම්
1.8 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අභ්‍යන්තර විගණන විමසුම්
1.9 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2020 - 2024 ට අදාළ සංයුක්ත සැළැස්ම

02. 2020.09.03 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුව විසින් පහත සඳහන් වාර්තා සාකච්ඡා කරන ලදී. ඒ සඳහා අවශ්‍ය නිර්දේශ / නිරීක්ෂණ / අඩුපාඩු පෙන්වා දෙන ලදී.

2.1 2020 මාර්තු මස 06 දින ප. ව. 3.00 ට පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තා සටහන් සහතික කිරීම.
2.2 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව
2.3 2020 ජනවාරි මස 01 දින සිට 2020 ජූලි මස 31 දින දක්වා මූල්‍ය ක්‍රියාකාරිත්ව (ආදායම සහ වියදම) වාර්තාව
2.4 සභාධිපත්‍ය දේපළවල කළමනාකරණ සංස්ථා ලියාපදිංචි කිරීම් සහ ලියාපදිංචිය අළුත් කිරීම් සම්බන්ධ යාවත්කාලීන කරන ලද වාර්තාව
2.5 අබිලි භාණ්ඩ අපහරණය - 2020 වර්ෂය
2.6 වෙනත් කරුණු යටතේ,
(1) 2021 වසර සඳහා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම, මූල්‍ය බලතල පැවරීම, අභ්‍යන්තර විගණන වැඩසටහන, සංයුක්ත සැළැස්ම ප්‍රසම්පාදන සැළැස්ම ආදිය සකස් කර විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීමට කමිටුව උපදෙස් ලබා දෙන ලදී.
(2) ප්‍රසම්පාදන සැළැස්ම සකස් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ දක්වා ඇති ආකෘති අනුව සකස් කරන ලෙස විගණන අධිකාරී උපදෙස් ලබා දෙන ලදී.

03. 2020.12.17 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුව විසින් පහත සඳහන් වාර්තා සාකච්ඡා කරන ලදී. ඒ සඳහා අවශ්‍ය නිර්දේශ / නිරීක්ෂණ හා අඩුපාඩු පෙන්වා දෙන ලදී.

3.1 2020.09.03 වැනි දින ප.ව. 3.00 ට පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තා සටහන් සහතික කිරීම.
3.2 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව
3.3 2020 සැප්තැම්බර් මාසයට අදාළ බැංකු සැසඳුම් විස්තරය
3.4 2020 ඔක්තෝම්බර් මාසයට අදාළ බැංකු සැසඳුම් විස්තරය
3.5 මානව සම්පත් වාර්තාව - 2020 ඔක්තෝම්බර්
3.6 2019 වර්ෂයේදී පැවති විගණන හා කළමනාකරණ කමිටු සමාලෝචන වාර්තාව
3.7 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ

2019.01.01 දින සිට 2019.12.31 දක්වා වාහන වියදම් පරීක්ෂාවට අදාළ අභ්‍යන්තර විගණන විමසුම

3.8 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට අදාළ විගණකාධිපති විමසුම

3.9 2020 ජනවාරි මස 01 දින සිට 2020 නොවැම්බර් මස 30 දින දක්වා මූල්‍ය ක්‍රියාකාරිත්ව වාර්තාව (ආදායම් හා වියදම්)

3.10 වෙනත් කරුණු යටතේ,

(1) 2021 වසර සඳහා අයවැය ලේඛනය සකස් කර විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කමිටුව උපදෙස් ලබා දෙන ලදී.

(2) ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පළමු වන මහලේ පිහිටි සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය කුලී පදනම යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙතින් ලබා ගෙන ඇති බැවින් ඊට අදාළ බදු ගිවිසුම 2020 දෙසැම්බර් 01 වන දින සිට 2022 නොවැම්බර් 30 කාල සීමාවකට අත්සන් කිරීමට කමිටුව මඟින් උපදෙස් ලබා දෙන ලදී.

(3) සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස සැළකෙන බැවින් පරිපාලන, කළමනාකරණ මෙහෙයුම් කටයුතු වලදී මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ හා සාජ්පු හා කාර්යාල සේවක පනත මඟින් ලබා දෙන උපදෙස්වලට අමතරව එකී චක්‍රලේඛවලින් ආවරණය නොවූ කරුණු සඳහා විවිධ ගැටළුවලට මුහුණපෑමට සිදුවන බැවින් අවශ්‍ය අවස්ථාවලදී පමණක් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපයෝගී කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගැනීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කමිටුව උපදෙස් ලබා දෙන ලදී.

04. 2020.12.21 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුව විසින් පහත සඳහන් වාර්තා සාකච්ඡා කරන ලදී. ඒ සඳහා අවශ්‍ය නිර්දේශ / නිරීක්ෂණ හා අඛණ්ඩ පෙන්වා දෙන ලදී.

4.1 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2021 වර්ෂය සඳහා වූ වාර්ෂික අයවැය වාර්තාව

4.2 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ අධිකාරි බලතල පැවරීම - 2021

4.3 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2021 වසරට අදාළ අභ්‍යන්තර විගණන වැඩසටහන

4.4 2020 නොවැම්බර් මාසයට අදාළ බැංකු සැසඳුම් විස්තරය

4.5 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2021 - 2025 වසරට අදාළ සංයුක්ත සැළැස්ම

4.6 සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2021 සිට 2023 දක්වා සංයුක්ත ප්‍රසම්පාදන සැළැස්ම හා 2021 වර්ෂයේ විස්තරාත්මක ප්‍රසම්පාදන සැළැස්ම

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2021 වසරට අදාළ වාර්ෂික අයවැය ලේඛනය, වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම, ක්‍රියාකාරී සැළැස්ම, සංයුක්ත සැළැස්ම සහ අභ්‍යන්තර විගණන සැළැස්ම නිරතුරුවම සමාලෝචනයට ලක් කරමින් අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීම සඳහා කමිටුව උපදෙස් ලබා දෙන ලදී.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පවත්නා විනය පරීක්ෂණ කඩිනම් කිරීමටත් පුරප්පාඩු වී ඇති තනතුරු කඩිනමින් බඳවා ගැනීමට පියවර ගැනීමටත් කටයුතු කිරීම සඳහා කමිටුව උපදෙස් ලබා දෙන ලදී.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කර ගැනීම සඳහාත් යහපත් පරිපාලන මූල්‍ය විනය පවත්වා ගෙන යාම සඳහාත් විගණන හා කළමනාකරණ කමිටුව නිරන්තරයෙන් උපදෙස් ලබා දෙන ලදී.

ඊට අමතරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය හා අනුමැතිය පිණිස ඉදිරිපත් කර ඇත. මෙම රැස්වීම් වාර්තාවල පිටපත් රේඛීය අමාත්‍යංශයේ ලේකම් වෙතද යොමු කර ඇත.



සවිමත්
කළමනාකරණ
සංස්ථාවක්

සුවපහසු මහල් නිවාස දිවියක සවියයි.

විගණකාධිපති වාර්තාව

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශන

- තත්ත්වාගණනය කළ මතය
- තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
- අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් තොරතුරු
- මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
- මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

වෙනත් කරුණු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / My No. } විවි/යූ/ඩී/සීවිම්වී/01/20/04

ඔබේ අංකය / Your No. }

දිනය / Date. } 2021 ජූලි 22 දින

සභාපති
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

.....

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්. ජී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් - 1. ලේකම්, නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යංශය
2. ලේකම්, මුදල් අමාත්‍යංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: චිවි/යූ/ඩී/ඒ/සීවිම්ඒ/01/20/04

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2021 ජූලි 22 දින

සභාපති
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

.....

1. මූල්‍ය ප්‍රකාශන

.....

1.1 තත්ත්වාගණනය කළ මතය

.....

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 55 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 8,949,317 ක් වූ ප්‍රත්‍යාගණන සංචිතය සම්බන්ධයෙන් අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. මේ අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු. 34,610,524 ක් වූ වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කර ගිණුම්වල ගැළපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් හා අධිකාරියට එරෙහිව පැවති නඩු 39 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 105 සහ 108 ඡේදයන් ප්‍රකාරව ඇතිවිය හැකි අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම සිදු කර නොතිබුණි.

(ඇ) 2019 වර්ෂයේ මෘදුකාංග මිළ දී ගැනීම සඳහා දරණ ලද රු. 950,880 ක මුදල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත නොකර පරිගණක වියදම් ලෙස මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ ආදායමට එරෙහිව කපා හැර තිබීම තිබීම සමාලෝචිත වර්ෂයේදීද නිවැරදි කර නොතිබුණි.

(ඈ) " නගමු පුරවර " වැඩසටහන සඳහා මහා භාණ්ඩාගාරයෙන් සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලැබී තිබුණු රු. 1,144,729 ක් දීර්ඝකාලීන වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට වසර 05 කට අධික කාලයක සිට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරිය සතු ගබඩා භාණ්ඩ ශුද්ධ උපලබ්ධි අගයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද රු. 1,584,997 ක් වූ එම භාණ්ඩවල ශුද්ධ උපලබ්ධි අගය ගණනය කළ ආකාරය පිළිබඳ විස්තර සහ වැකතුව රු. 1,386,534 ක් වූ ණයගැතියන් තිදෙනෙකු ඔවුන්ගේ ණය නිරවුල් කළ බව දක්වා ජර්නල් සටහනක් මඟින් එම ණය පෙර වර්ෂ ගැලපුම් ගිණුමට ගැලපීමේ විස්තරයද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිඳු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබා ගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සළකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩව පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත ගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛණ සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තයේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයන්ට යොමුව		විස්තරය
(අ)	2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනතේ 5 ඡේදයේ (උ) වගන්තිය	සභාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම අධිකාරියේ අරමුණක් වුවද මාළිඟාවත්ත සහ ජල්තර නිවාස ක්‍රමවල පොදු පහසුකම් පළාත් පාලන ආයතන වෙත පවරා නොතිබුණි.
(ආ)	2006 අංක 12 දරණ මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත	(i) රු. 25,000 කට වැඩි යම් මුදලක් නිදහස් කිරීමේදී රු. 25 ක මුද්දර ගාස්තු අය කළ යුතු වුවත්, අධිකාරියේ ගෙවීම් වවුචර් පරීක්ෂාවේදී රු. 1,092,341 ක් වටිනාකමැති ගෙවීම් 16 ක් සඳහා අදාළ මුද්දර ගාස්තුව අය කිරීමට කටයුතු කර නොතිබුණි.
		(ii) අධිකාරියේ රු. 789,800 ක් වටිනාකමැති ආපදා ණය මුදල් ගෙවීමේ අවස්ථා 16 ක ලිපි හුවමාරුවේදී භාවිතා කළ මුද්දර නැවත භාවිතා කර තිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
	(i) II වන පරිච්ඡේදයේ 1.10.1 සහ අධිකාරියේ බඳවාගැනීමේ පරිපාටියේ 8.3 ඡේදය	ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂවලින් තොරව 2017 සහ 2018 වර්ෂයන්හී සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්), පාරිභෝගික සේවා නිළධාරි හා පරිපාලන නිළධාරි යන තනතුරු තුන සඳහා නිළධාරීන් සහ 2019 වර්ෂයේ තනතුරු 05 ක් සඳහා සේවකයින් 14 දෙනෙකු බඳවා ගෙන තිබුණි. ආයතන සංග්‍රහයේ පරිච්ඡේද 1:10:1 ට අනුකූලව අදාළ අනුමැතීන් ලබා නොගෙන අධිකාරියේ සභාපති විසින් 2019 වර්ෂයේ යටෝක්ත සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) ගේ තනතුර 2013 වර්ෂය දක්වා පෙරදාතම් කර තිබුණි.
	(ii) II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13:1 ඡේදය සහ 13:2 ඡේදය	කිසියම් විෂමාචාරයක් සම්බන්ධ සිදුවීමක් පිළිබඳව මූලික විමර්ෂණයක් පැවැත්වීමට නියෝග කරන බලධරයෙකු විසින් ඒ ඒ සිදුවීමේ ස්වභාවය සැළකිල්ලට ගෙන මූලික විමර්ශණය කොතරම් කාලයක් ඇතුළත නිම කළ යුතුද යන්න නියෝගය නිකුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබූ අධිකාරියේ සේවකයින් 07 දෙනෙකු සඳහා අවස්ථා 10 කදී ගොනු කර තිබුණු විවිධ චෝදනා සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. විෂමාචාරය පිළිබඳව තමන් විසින් සොයා ගත් කරුණු පිළිබඳව අප්‍රමාදව තම නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කිරීම මූලික විමර්ෂණ නිළධරයෙකු හෝ නිළධර කමිටුවක් හෝ විසින් ඉටු කළ යුතු මූලික කාර්යයක් වුවද සමාලෝචිත වර්ෂයේ සිදු වූ සිද්ධීන් 05 ක් සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 30 දින වන විටත් අදාළ සිද්ධීන් සම්බන්ධව නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මු. රෙ. 218	එකම ගෙවීමක් සම්බන්ධයෙන් දෙවරක් මුදල් ගෙවීම වැළැක්වීම සඳහා විශේෂ පියවර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ බිල්පත් පියවීම සඳහා රු. 2,298,748 ක ගෙවීම් වවුචර් සමඟ ජායාස්ථ බිල්පත් අමුණා තිබුණු අතර ඒ පිළිබඳ නොසළකා ගෙවීම් කර තිබුණි.

	(ii) මු. රෙ. 231	හැකිතාක් දුරට වෙනත් ලේඛනයක් නොබලා හරි වැරදි බැලීමට හැකි වන පරිදි සම්පූර්ණ විස්තර වවුචර්වල අඩංගු වියයුතු වුවද, නියැඳි පරීක්ෂාවේදී රු. 60,101,890 ක ගෙවීම් සඳහා සනාථ කෙරෙන ලේඛන වවුචරය සමඟ ඉදිරිපත් කර නොතිබුණි.
	(iii) මු. රෙ. 502 (2)	අධිකාරිය සතු රු. 96,409,808 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් පොදු 287 අකෘතියේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි. වාර්ෂික වැකතු වන වත්කම් සඳහා ලේඛනයක් පවත්වා ගෙන ගියද විධිමත්ව යාවත්කාලීන කර නොතිබුණි අතර, වාර්ෂිකව විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අතර විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය කිරීමේ වෙනස රු. 177,578 ක් වී තිබුණි.
	(iv) මු. රෙ. 757 (2)	ඌනතා හා නැතිවීම් කිසිවක් වෙතොත් ගණන්දීමේ නිළධාරියා විසින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු වුවත්, අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට සිදු කළ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් රු. 425,221 ක් වටිනාකමැති ස්පෘශ්‍ය වත්කම් 12 ක් සම්බන්ධයෙන් වලෙස කටයුතු කර නොතිබුණි.
(ඈ)	2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
	(i) 6.5.1 ඡේදය සහ 6.5.3 ඡේදය	පාලක මණ්ඩලය විසින් අනුමත කළ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, 6.5.3 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විගණන වාර්තා ඇතුළත් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.
	(ii) 8.2.2 ඡේදය හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වන වගන්තිය	රාජ්‍ය සංස්ථාවක අතිරේක අරමුදල්, ඇමතුම් තැන්පතු, කෙටි කාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු හෝ වෙනත් ඕනෑම තැන්පතුවක් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ආයෝජනය කළ යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ආයෝජනය කරන ලද රු. 181,171,713 ක් වූ විවිධ තැන්පතු 08 ක් සම්බන්ධයෙන් අදාළ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.
(ඉ)	2015 මැයි 25 දිනැති PED 2/2015 අංක දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ නිළධාරීන්ගේ දුරකතන බිල්පත් පියවීමට අවස්ථා 22 කදී රු. 109,524 ක අත්තිකාරම් මුදල් ලබා දී තිබූ අතර, මෙම අත්තිකාරම් මු. රෙ. 371 ප්‍රකාරව අත්තිකාරම් ලේඛනගත කොට පියවීම සඳහා කටයුතු කර නොතිබුණි.
(ඊ)	2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මු. රෙ. 371 (5)	අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය ගිණුම් අංශය වෙත නැවත පියවිය යුතු වුවත් අධිකාරියේ අවස්ථා 09 කදී රු. 315,500 ක් වූ අග්‍රිම දින 16 සිට දින 115 දක්වා ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි.

(උ)	2015 මැයි 25 දරණ PED 1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4 වන ඡේදය	සංචිත වාහන පාලනය සහ නඩත්තු කිරීම් සඳහා විධිමත් ක්‍රමවේදයන් පවතින බවට අධිකාරියේ කළමනාකාරිත්වය වග බලා ගත යුතු අතර පිරිවැය පිළිබඳවද සැළකිලිමත් විය යුතු වුවද වාහන අනතුරු අවම කර ගැනීමට, අනතුරකදී කඩිනම් පිළිසකර කිරීමට හා ප්‍රතිපූර්ණය කිරීමට, වෙන් කළ වාහන සම්බන්ධ පවත්නා රීතීන්ට අනුකූලව අනෙකුත් නිළධාරීන්ට පූර්වාදර්ශයක් සපයමින් රජයේ වාහන භාවිතයට, ධාවන සටහන් යාවත්කාලීන කිරීමට, ගේට්ටු අවසර පත්‍ර අනුව වාහන පිටවීම හා පැමිණීමට අදාළව ආරක්ෂක අංශයේ ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණු බව වැඩිදුරටත් විගණනයේදී නිරීක්ෂණය විය.
(ඌ)	2016 මාර්තු 03 දිනැති හා 2/1/13/332 අංක දරණ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශ ලේකම්ගේ ලිපිය	යොමුගත ලිපිය මඟින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමැතිය ලබාදිය නොහැකි බවත් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව බඳවා ගැනීම් සිදු කළ යුතු බවත් දන්වා තිබුණු නමුත් අමාත්‍යංශ ලේකම්ගේ අනුමැතිය සළකා බැලීමකින් තොරව සහකාර සමාන්‍යාධිකාරි (මානව සම්පත්) තනතුරට 2016 පෙබරවාරි 25 දින වසරක කොන්ත්‍රාත් කාලයකටද 2017 නොවැම්බර් 27 දින සිට වසර 03 ක පරිවාස කාලයකට යටත්ව ස්ථිර තනතුරකට ද පත්වීම් ලබා දී තිබුණි.
(එ)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PE/1/CMA/4/11 (i) හා 2019 සැප්තැම්බර් 09 දිනැති ලිපිය	2018 මූල්‍ය වර්ෂයේ බදු පසු ලාභයෙන් රු. මිලියන 47 ක් (සියයට 33 1/3) ක් හා 2019 වර්ෂයේ සිට බදු පසු ලාභයෙන් සියයට 33 1/3 ක් අය බදු වශයෙන් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට නියම කර ඇතත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් කරුණු

.....

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරී කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිලි පරිශ්‍රය සඳහා වාර්ෂිකව රු. 4,460,772 බැගින් කුලී වියදම් හා වාර්ෂික නඩත්තු වියදම් පිළිවෙළින් 2019 හා 2020 වර්ෂයන්හි රු. 4,593,220 ක් හා රු. 1,434,114 බැගින් වියදම් කර තිබුණද විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් 2011 වර්ෂයේදී මිළ දී ගත් රු. 5,890,000 ක් වූ මෝටර් රථයක් සමාලෝචිත වර්ෂයේදී එම වටිනාකමටම රක්ෂණය කර තිබූ අතර මිළ දී ගත් වර්ෂයේ සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) වෙත අනුයුක්ත කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2021 වර්ෂයේ ජනවාරි දක්වා අනතුරු 16 ක් සිදුව තිබූ අතර අවස්ථා 02 කදී පමණක් මු. රෙ. 104 (3) හා 104 (4) ප්‍රකාරව කටයුතු කර තිබුණි. අනතුරු 13 ක් සඳහා රු. 1,682,160 ක් වූ වන්දි රක්ෂණ ලබා ගෙන තිබුණද එම තොරතුරු අදාළ ලිපි ගොනුවල ඇතුළත් කර නොතිබුණි. අදාළ නිළධාරියා විසින් මෙම රථය ධාවනය කර තිබුණද ඒ සඳහා නිසි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

(ඇ) ඉහත සඳහන් මෝටර් රථය 2019 ඔක්තෝම්බර් 01 දින අනතුරකට ලක්ව තිබුණද පොලිස් වාර්තා, කාර්මික වාර්තාවක් නොමැතිව අධිකාරියේ අළුත්වැඩියා සම්බන්ධව පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතියෙන් බැහැරව කටයුතු කර තිබුණි. අධිකාරිය වෙත රු. 570,295 ක් වූ ඉන්වොයිසියක්ද, රක්ෂණ සංස්ථාවට රු. 251,350 ක් බිල්පත් ගාස්තු වශයෙන් එකිනෙකට වෙනස් අගයන් සහිත බිල්පත් අළුත්වැඩියා කටයුතු කර පෞද්ගලික ගරාජයෙන් නිකුත් කර තිබූ අතර රක්ෂණ සංස්ථාවෙන් ලැබුණු වන්දි මුදල රු. 144,019 ක් පමණ විය. අළුත්වැඩියා කටයුතු අවසන් කළ බවට 2019 දෙසැම්බර් 23 ගරාජය මඟින් දන්වා තිබුණද 2020 දෙසැම්බර් 31 දක්වා එම රථය අධිකාරිය වෙත ගෙන ඒමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2019 දෙසැම්බර් 19 දින අධිකාරිය සතු මෝටර් රථයකට සිදු වූ අනතුරක් සම්බන්ධයෙන් පොලිස් වාර්තාවක් ලබාගෙන තිබුණද එය ලොග් සටහන් පොතෙහි සටහන් කර නොතිබුණි. රියදුරු විසින් දක්වා තිබූ ආකාරයට වැවැනි අනතුරක් සිදු වූ බවට රක්ෂණ ආයතනය එකඟව නොතිබුණු අතර රු. 2,764,012 ක් වූ අළුත්වැඩියා ඇස්තමේන්තුවක් වෙනුවෙන් රු. 500,000 ක හානිපූර්ණයක් පමණක් කිරීමට රක්ෂණ ආයතනය එකඟව තිබුණි. මෙම වාහනය 2020 ජනවාරි 01 දින සිට විගණිත දින වන 2021 ජුනි 30 දක්වා මෝටර් රථ නියෝජිත ආයතනයෙහි ගාල් කර තිබූ නමුත් කිසිඳු අළුත්වැඩියාවක් සිදු කර නොතිබුණි.

(ඉ) 2019 නොවැම්බර් 01 දින සිට 2019 නොවැම්බර් 22 දින දක්වා රේඛීය අමාත්‍යංශය වෙත මුදා හැර තිබූ මෝටර් රථයට එම කාලය තුළ දී සිදු වූ අනතුරක් යථා තත්ත්වයට පත් කිරීමට අධිකාරිය විසින් රු. 55,090 ක් වියදම් කර තිබුණු අතර රු. 33,447 ක් තවදුරටත් ප්‍රතිපූර්ණය කර ගත යතුව පැවතුණි. එසේම මෙම අනතුරට සම්බන්ධ තොරතුරු ලොග් පොතට ඇතුළත් කර නොතිබුණි.

(ඊ) අධිකාරියේ වාහන 04 ක මයිලෝ මීටරය හා දෛනික ධාවන සටහන් අතර කි. මී. 317 සිට කි. මී. 7,250 දක්වා විචලනයන් නිරීක්ෂණය විය.

(උ) පසුගිය වර්ෂ කිහිපයක ඉලක්කගත දිනයන් සහිතව ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර තිබුණු 1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල පනතේ සංශෝධන කටයුතු සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම අනුව 2020 ජුනි මාසය දක්වා කාලය දීර්ඝ කර තිබුණි. 2017 ජුනි 30 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබූ මෙම පනත්වල සංශෝධිත කෙටුම්පත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිඳු ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි. 2019 දෙසැම්බර් 16 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව විසින් එවන ලද ලිපිය අනුව නව අමාත්‍ය මණ්ඩලයෙන් මේ සඳහා අනුමැතිය ලබා ගන්නා ලෙස දක්වා තිබුණද අදාළ අනුමැතිය ලැබී නොතිබුණි.

(ඌ) රු. 3,000,000 ක් වූ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ආයෝජිත අරමුදල් වෙනුවෙන් ආයෝජන ආදායම් ලැබී නොතිබුණි.

(එ) ගම්පහ හා මිගමුව රෝහල්වල පොම්පාගාර නඩත්තුව වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යතු ශේෂය රු. 7,393,054 ක් වන අතර අධිකාරියේ විෂය පථය තුළ නොමැති මෙම කාර්යය නිරවුල් කර ගැනීමට කටයුතු නොකර ණයගැතියන් ලෙස හිණුම්ගත කරමින් පැවතුණි. එසේම 2020 දෙසැම්බර් 31 දිනට රු. 12,899,599 ක ණයගැති ශේෂය තුළ වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද ණයගැතියන් 12 දෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂය රු. 7,370,329 ක් වූ අතර එය මුළු ණයගැතියන්ගෙන් 57% ක් විය.

(ඒ) 2003 ජුනි 02 දිනැති පී‍ඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.1.3 ඡේදය ප්‍රකාරව පාලක මණ්ඩලය අනුමත කරන ලද සංශෝධිත අයවැය අදාළ වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යංශය හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අධිකාරිය විසින් 2020 වර්ෂයේ සංශෝධිත අයවැය සඳහා පමණක් පාලක මණ්ඩලය අනුමැතිය 2020 නොවැම්බර් 23 දින ලබා ගෙන තිබුණි.

ඩබ්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති



මූල්‍ය වාර්තාව

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශය

මූල්‍ය කාර්යය සාධනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

ගිණුම් පිළිබඳ සටහන්

මූල්‍ය සටහන්

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් සහ මූල්‍ය උපලේඛණ

ශුද්ධ වත්කම් ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

අයවැය සහ සත්‍ය අගයන් සැසඳීමේ ලේඛණය

මූල්‍ය කාර්යය සාධනය

2020 වර්ෂය යනු සමස්ථ ආර්ථික ක්‍රියාවලියට, කර්මාන්ත හා සේවා අංශයන් රැසකට අහිතකර බලපෑම් එල්ල කළ අභියෝගාත්මක වර්ෂයකි. කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ 2020 මාර්තු මස සිට 2020 පුනි මස දක්වා සම්පූර්ණයෙන් රට වසා දැමීමෙන් ඇති වූ ආර්ථික පසුබෑම හමුවේ ඉදිකිරීම් කර්මාන්තය පහත වැටී තිබූ වටපිටාවක් තුළ රු. මි. 32.96 ක බදු පසු ලාභයක් (ශුද්ධ ලාභයක්) ඉපයීමට අධිකාරියට හැකි වූ අතර 2019 වර්ෂයට සාපේක්ෂව එය 81% ක වර්ධනයකි. මෙය සපුරා ගැනීම සඳහා අධිකාරියේ ආදායම් ඉහළ යාම හා පුනරාවර්ථන වියදම් පහළ යාම යන සාධක ද්විත්වයම ඉවහල් වී ඇත.

අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා ලැබූ ලාභයෙන් රු. මි. 11.57 ක් රජයට ආදායම් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

අධිකාරියේ ප්‍රධානතම ආදායම් ප්‍රභවය වනුයේ සභාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් හා පොදු අංගෝපාංග සම්බන්ධයෙන් සභාධිපත්‍ය සහතික නිකුත් කිරීමේ කාර්යයන් හරහා ලැබෙන ආදායමෙනි. 2020 වර්ෂයේ සභාධිපත්‍ය සහතික නිකුත් කිරීමෙන් රු. මි. 168 ක ආදායමක් අධිකාරිය විසින් උපයා ගත් අතර එය 2019 වසරට සාපේක්ෂව 9% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. එමෙන්ම අධිකාරියේ සමස්ථ ආදායම ලෙස රු. මි. 203.72 ක් උපයා ගැනීමට හැකි වී ඇත.

ආදායම් විශ්ලේෂණය

වර්ෂය	2016	2017	2018	2019	2020
ආදායම	197.19	265.43	348.31	198.52	203.72

කාර්යක්ෂමව වියදම් කළමනාකරණය කිරීම තුළින් 2020 වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් වියදම් 2019 වර්ෂයට සාපේක්ෂව 11% කින් අඩු කර ගැනීමට හැකියාව ලැබී ඇත. රජය විසින් නියම කර ඇති සෞඛ්‍යමය හා සමාජ දුරස්ථ මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපදිමින් රාජකාරී වැඩ කටයුතු කරගෙන යනු ලබන අතර සේවක මහත්ම මහත්මීන්ට සමාජ දුරස්ථව රාජකාරී ඉටු කිරීමට අවස්ථාව ලබාදීමට කටයුතු කර ඇත. මෙම තත්ත්වය හමුවේ සේවක අතිකාල වියදම්, ගමන් වියදම් ආදිය කළමනාකරණය කිරීමට හැකිවීම හේතුවෙන් මෙන්ම ඊට අමතරව වාහන නඩත්තු වියදම්ද සැළකිය යුතු අයුරින් අඩු කර ගැනීමට හැකිවීම මෙම පුනරාවර්ථන වියදම් පහළ යාම කෙරෙහි ඍජුවම බලපෑමක් ඇති කරනු ලැබූ බව පෙනෙන්නට තිබේ.

අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලැබූ අය වැය 2020 වර්ෂයේ මැයි මස 15 වන දින නැවත සංශෝධනය කරන ලද අතර එම සංශෝධිත අයවැයෙන් ආයතනික සමාජ වගකීම් (CSR) වැය ශීර්ෂය යටතේ වෙන් කළ මුදලින් රු. මි. 10 ක් ජාතික කොවිඩ් නිවාරණ අරමුදලට පරිත්‍යාග කිරීමට අධිකාරියට හැකි විය. එම වියදම මෙහෙයුම් නොවන වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර එම වියදමත් සමඟින් අධිකාරියේ සමස්ථ වියදම 2020 වර්ෂය සඳහා රු. මි. 159.18 ක් වූ අතර එය 2019 ට සාපේක්ෂව 8% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

වියදම් විශ්ලේෂණය

වර්ෂය	මෙහෙයුම් වියදම් රු. මි.	මෙහෙයුම් නොවන වියදම් රු. මි.	සමස්ථ වියදම් රු. මි.
2016	95.48	12.95	108.43
2017	130.08	10.98	141.06
2018	151.79	4.07	155.86
2019	167.07	5.17	172.24
2020	148.09	11.09	159.18

තවද, අධිකාරියේ ශේෂ පත්‍රයේ වත්කම් සංයුතිය පැහැදිලි වර්ධනයක් පෙන්නුම් කරන අතර එයට ප්‍රධානතම හේතු සාධකය වන්නේ ස්ථාවර තැන්පතු ආයෝජනයන්හී තැන්පතු මුදල් ප්‍රමාණය ඉහළ යාමයි. අධිකාරියේ අතිරික්ත මුදල්, සත් දින තැන්පතු, මූල්‍ය වෙළඳපොළ තැන්පතු හා ත්‍රෛමාසික තැන්පතු ලෙස අඛණ්ඩව ආයෝජනය කර තිබේ.

අධිකාරිය දැනට කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිල්ලක සිය දෛනික කටයුතු පවත්වා ගෙන යනු ලබන අතර අධිකාරිය සඳහා ස්ථිර හිමිකම සහිත නව ඉඩමක් හා ගොඩනැගිල්ලක් මිළ දී ගැනීමේ අරමුණෙන් මෙම ආයෝජනයන් අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි. ඒ සමඟම අධිකාරියේ ශේෂ පත්‍රයේ දිගු කාලීන වත්කම්වල වර්ධනයක්ද ඉදිරියේදී අපේක්ෂා කෙරේ.

එමෙන්ම අධිකාරියේ සේවය කරනු ලබන සියළුම සේවක පිරිසගේ පාරිතෝෂිත දීමනාව සඳහා මුදල් වෙන් කිරීම් වාර්ෂිකව සිදු කරනු ලබන අතර එම පාරිතෝෂිත වගකීම් පියවා ගැනීම සඳහා 2020 වර්ෂය තුළදී රු. මි. 4 ක මුදලක් දිගු කාලීනව ආයෝජනය කර ඇත.

සියළු අභියෝගයන් හමුවේ සාර්ථකව අධිකාරියේ කටයුතු සාර්ථකව කළමනාකරණය කර ගැනීමට දැක්වූ දායකත්වය අගයමින් සේවක අභිප්‍රේරණය ඇති කිරීම සඳහා 2020 වර්ෂය තුළදී සේවක පිරිස අතරේ රු. මි. 1.75 ක මුදලක් ප්‍රසාද දීමනා ගෙවීම වෙනුවෙන් අධිකාරිය වෙන් කරන ලදී.

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

		2020	2019	2020 අයවැයගත
		රුපියල්	රුපියල්	රුපියල්
වත්කම්				
ජංගම නොවන වත්කම්				
ස්ථාවර වත්කම්				
දේපළ පිරියත සහ උපකරණ	සටහන 01	20,173,275	28,264,691	23,119,000
ආයෝජන				
පාරිතෝෂික ප්‍රතිපාදන ආයෝජන		45,000,000	41,774,759	50,000,000
		65,173,275	70,039,449	73,119,000
ආයෝජන - දිගුකාලීන				
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ කොටස්		3,000,000	3,000,000	3,000,000
		68,173,275	73,039,449	76,119,000
ජංගම වත්කම්				
මුදල් හා මූල්‍යමය අයිතම	සටහන 02	2,330,873	37,680,359	5,430,000
කෙටිකාලීන ආයෝජන	සටහන 03	39,609,351	16,890,887	18,000,000
වෙළඳ ණයගැතියෝ, සේවක ණය සහ ලැබිය යුතු ශේෂ	සටහන 04	25,719,603	28,669,220	38,400,000
තොග ගිණුම	සටහන 05	1,529,126	1,898,001	3,100,000
ස්ථාවර තැන්පතු (ත්‍රෛමාසික)	සටහන 06	327,840,827	261,454,091	310,000,000
ඉදිරියට කළ ගෙවීම්	සටහන 07	195,946	96,645	300,000
වෙනත් ලැබිය යුතු ශේෂ	සටහන 08	3,192,297	2,861,819	5,000,000
		400,418,023	349,551,022	380,230,000
මුළු වත්කම්		468,591,297	422,590,471	456,349,000
වගකීම්				
ජංගම වගකීම්				
ණයහිමියෝ / අත්තිකාරම්	සටහන 09	22,655,585	17,960,208	16,995,000
උපචිත වියදම්	සටහන 10	2,137,066	4,222,681	2,000,000
ගෙවිය යුතු	සටහන 11	2,719,304	2,755,003	4,105,000
ප්‍රතිපාදන	සටහන 12	13,154,449	3,573,165	9,500,000
මුළු ජංගම වගකීම්		40,666,403	28,511,058	32,600,000
ජංගම නොවන වගකීම්				
භාණ්ඩාගාර ප්‍රතිපාදන - ස්ථාවර වත්කම් මිල දී ගැනීම සඳහා යෙදවීම්		717,155	1,135,273	-
පාරිතෝෂික ප්‍රතිපාදන		35,903,263	33,342,779	37,000,000
මුළු වගකීම්		77,286,821	62,989,109	69,600,000
ශුද්ධ වත්කම්/ස්කන්ධය		391,304,476	359,601,362	386,749,000
ශුද්ධ වත්කම් / නියෝජනය වන්නේ				
අනුදත් ප්‍රාග්ධනය		500,000	500,000	500,000
රජයේ ප්‍රාග්ධනය		500,000	500,000	500,000
ප්‍රසාද කොටස්		2,500,000	2,500,000	2,500,000
		3,000,000	3,000,000	3,000,000

	2020	2019	2020 අයවැයගත
	රුපියල්	රුපියල්	රුපියල්
පසු ගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ අතිරික්තය	344,039,382	323,808,077	344,039,000
අඩු කළා			
පසු ගිය වර්ෂ ගැළපුම්	(1,260,542)	2,044,567	(10,674,000)
එකතු කළා			
ප්‍රවර්ථන වර්ෂයේ ශුද්ධ අතිරික්තය	32,963,656	18,186,738	37,771,000
එකතු වූ අරමුදල	375,742,496	344,039,382	371,136,000
ප්‍රත්‍යාගණන සංචිත	8,949,317	8,949,317	9,000,000
පොදු සංචිතය	1,350,000	1,350,000	1,350,000
ප්‍රාග්ධනය මාරුකිරීම්	2,262,663	2,262,663	2,263,000
ශුද්ධ වත්කම් / හිමිකම් එකතුව	391,304,476	359,601,362	386,749,000

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2020.12.31 දිනට අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2021.02.23 දිනැති 140 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු විසින් පහත අත්සන් තබා ඇත.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කර ගන්නා ලද ගිණුම්කරණ ප්‍රමිත පිටු අංක 03 සිට 05 දක්වාද සටහන් පිටු අංක 06 සිට 09 දක්වාද අමුණා ඇත. එමෙන්ම ඉහත මූල්‍ය ප්‍රකාශ සකසා ඉදිරිපත් කිරීමේ වගකීම අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් දරනු ලැබේ.

පී. අමිල නිශාන්ත
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

ආචාර්ය ඉඳුනිල් ඒම්. ලියනගේ
සාමාන්‍යාධිකාරී
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

බී. එන්. ගමගේ
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

නීතීඥ සරණ කරුණාරත්න
සභාපති
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

	සටහන	2020	2019	2020 අයවැයගත
		රුපියල්	රුපියල්	රුපියල්
ආදායම්				
මෙහෙයුම් ආදායම්	සටහන 13	176,852,745	162,661,179	180,680,000
වෙනත් මෙහෙයුම් ආදායම්	සටහන 14	2,172,132	1,946,917	2,870,000
මෙහෙයුම් නොවන ආදායම්	සටහන 15	24,693,205	33,868,778	32,530,000
මුළු මෙහෙයුම් ආදායම		203,718,082	198,476,874	216,080,000
මෙහෙයුම් වියදම්				
සේවක වැටුප් හා දීමනා	සටහන 16	110,820,596	117,368,596	109,358,000
ගමන් වියදම්	සටහන 17	1,060,558	3,147,682	1,065,000
සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය	සටහන 18	5,728,412	7,359,344	5,200,000
නඩත්තු වියදම්	සටහන 19	6,051,013	14,275,872	8,800,000
ව්‍යවස්ථාපිත වියදම්	සටහන 20	9,385,712	9,242,498	9,926,000
සෘජු වියදම්	සටහන 21	2,073,206	2,937,619	2,350,000
ස්ථාවර වත්කම් ක්ෂයවීම්	-	12,666,348	12,401,023	3,350,000
වෙනත් මෙහෙයුම් වියදම්	සටහන 22	301,618	337,119	12,370,000
මුළු මෙහෙයුම් වියදම්		148,087,462	167,069,753	152,419,000
මෙහෙයුම් ක්‍රියාකාරකම් - අතිරික්තය/(ඌණතාවය)		55,630,620	31,407,121	63,661,000
මූල්‍ය වියදම්	සටහන 23	860,745	4,578,238	3,010,000
මෙහෙයම් නොවන වියදම්	සටහන 24	10,235,214	595,002	11,230,000
මුළු මෙහෙයුම් නොවන වියදම්		11,095,959	5,173,240	14,240,000
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුළු අතිරික්තය/(ඌණතාවය)		44,534,661	26,233,881	49,421,000
අබිලි ද්‍රව්‍ය විකිණීමේ අතිරික්තය/ (ඌණතාවය)	සටහන 25	-	43,950	250,000
බදු අඩු කිරීමට පෙර ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)		44,534,661	26,277,831	49,671,000
ආදායම් බදු ප්‍රතිපාදන		11,571,005	8,091,093	11,900,000
ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)		32,963,656	18,186,738	37,771,000
පසුගිය වසරින් ඉදිරියට ගෙන ආ එකතු වූ අතිරික්තය / (ඌණතාවය)		330,679,934	310,448,629	310,448,629
		363,643,590	328,635,367	348,219,629
පෙර වර්ෂයට අදාල ගැලපුම්				
හර එකතුව		1,260,542	_	
බැර එකතුව		-	2,044,567	
		362,383,048	330,679,934	

සටහන්

1 ගිණුම් පිළිබඳ සටහන්

පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ අනුමත කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත තෝරා ගැනීම තුළින් අවස්ථානෝචිත පරිදි සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කර ගනිමින් මෙම ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මනා අභ්‍යන්තර පාලනයක් සැළසුම් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීමට හා පවත්වාගෙන යාම තුළින් සාධාරණ ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බවට සහතික වෙමු.

2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව අන්‍යෝන්‍ය වශයෙන් කාල පරිච්ඡේද පිළිබඳව අන්තර් සම්බන්ධතාවයකින් යුක්තව ඓතිහාසික අය පදනම මත අධිකාරියේ ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රතිපත්තිවලට බලපෑ හැකි උද්ධමනකාරී සාධක අරභයා ගැලපුම් කිරීමක් කර නැති අතර උපචිත පදනම මත වාර්තා සකස් කර ඇත.

3 අධිකාරියේ පිහිටීම.

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය, කොළඹ 02, ශ්‍රී චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පිහිටා ඇති අතර මුළු දිවයිනටම අදාළ වන පරිදි සභාධිපත්‍ය දේපළ සම්බන්ධ නියාමන කාර්යයන් ඉටු කරනු ලබයි.

4 අධිකාරියේ නෛතික ස්වභාවය

2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනත මඟින් ලැබී ඇති බලතල අනුව සභාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් හා පොදු අංගෝපාංග නඩත්තුව පරිපාලනය හා පාලනය සඳහා කළමනාකරණ සංස්ථා පිහිටුවීම සහ ඒවා නියාමනය කිරීමත් සභාධිපත්‍ය දේපළ ඉදිකිරීමේදී එම දේපළවලට අදාළ පොදු පහසුකම් පරදුදරන්නන්ගේ අවශ්‍යතාවන් සපිරෙන පරිදි ලබාදී ඇති බවට සහතික කිරීමත් අධිකාරිය විසින් සිදු කරනු ලබයි.

5 අධිකාරියේ ක්‍රියාකාරිත්වයට අදාළ වන පනත්

- 1973 අංක 10 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනත
- 1982 අංක 46 දරණ පොදු පහසුකම් මණ්ඩල පනත
- 2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධන) පනත
- 1973 අංක 11 දරණ බද්ධ නිවාස පනත
- 1982 අංක 45 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත
- 1999 අංක 04 දරණ බද්ධ නිවාස අයිතිකම් විශේෂ විධිවිධාන පනත
- 2003 අංක 39 දරණ බද්ධ නිවාස අයිතිකම් (සංශෝධන) පනත

6 ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන් කිරීමේදී අධිකාරියේ ප්‍රතිපත්තිය අනුව මිළ දී ගත් දින සිට විකුණන දිනය දක්වා සරළ මාර්ග ක්‍රමය මත ක්ෂය වෙන් කිරීම සිදු කෙරේ.

මෝටර් රථ	-	පිරිවැය මත	25%
කාර්යාලීය ලී බඩු හා උපකරණ	-	පිරිවැය මත	20%
යන්ත්‍ර හා උපකරණ	-	පිරිවැය මත	20%
මෙවලම් හා උපකරණ	-	පිරිවැය මත	20%
ගොඩනැගිලි	-	පිරිවැය මත	04%

7 පාරිතෝෂික

අධිකාරියේ සේවය කරනු ලබන සියළුම සේවකයින්ගේ පාරිතෝෂික දීමනාව සඳහා ඔවුන්ගේ සේවා කාලය පදනම් කර ගනිමින් ගිණුම්වල වෙන් කිරීම කරනු ලැබ ඇත. 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂයට අදාළ එම වටිනාකම රු. 35,903,263/- ක් වන අතර ඒ සඳහා ගිණුම්වල වෙන් කිරීම් සිදු කිරීමට කටයුතු කර ඇත.

එමෙන්ම මෙම පාරිතෝෂික වගකීම් පියවා ගැනීමට ප්‍රමාණවත් මුදලක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් ස්ථාවර තැන්පතු ලෙසයෙන් ආයෝජනය කිරීමටද අධිකාරිය විසින් කටයුතු කර ඇත.

8 තොග

තොග මිළ දී ගැනුම් පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත ආගණනය කර ගිණුම්වල ගැළපීම් කර ඇති අතර කිසිදු ලාභ ප්‍රතිශතයක් ඇතුළත් කර නොමැත.

9 ආදායම

දළ ආදායම පදනම් කර ගනිමින් ලාභාලාභ ගිණුම් සකසා ඇත.

10 බොල් හා අඩමාන ණය වෙන් කිරීම.

වර්ෂ අවසානයේදී පවත්නා ණයගැතියන්ගේ වයස් විශ්ලේෂණ පදනම් කර ගනිමින් පහත පරිදි බොල් ණය අඩමාන ණය වෙන් කිරීම සිදු කර ඇත.

වර්ෂ 0 - 2	10%	රු.	109,251
වර්ෂ 2 - 3	20%	රු.	439,376
වර්ෂ 3 - 4	30%	රු.	-
වර්ෂ 4 - 5	50%	රු.	1,486,063
වර්ෂ 5 ට වැඩි	100%	රු.	7,372,983

මේ අනුව ප්‍රවර්තන වර්ෂයේ ගිණුම් මඟින් රු. 9,407,673/- ක වටිනාකමක් බොල් හා අඩමාන ණය වශයෙන් ගිණුම්වල වෙන් කිරීම් සිදු කර ඇත.

11 අසම්භාව්‍ය වගකීම්

ලංකා කෙට් (පුද්) සමාගමෙන් අයවිය යුතුව ඇති රු. 807,187/- ක මුදල අය කර ගැනීම සඳහා නඩු අංකය 53429 / එම්. ආර් යටතේ කොළඹ දිසා අධිකරණයෙහි නඩු පවරා තිබුණි. ඒ අනුව 2020 වර්ෂයේ එම මුදලට අදාළ පොලියද සමඟ රු. 2,000,000/- ක මුදලක් අධිකාරිය වෙත ලබා දීමට කටයුතු කර ඇත. ලංකා කෙට් (පුද්) සමාගමෙන් පොලී මුදල වන රු. 1,192,813/- ක මුදල මෙහෙයුම් නොවන ආදායම් යටතේ දක්වා ඇත. අධිකාරියට හෝ අධිකාරිය විසින් පවරණ පද වෙනත් නඩු සඳහා අසම්භාව්‍ය වගකීමක් නොමැති බැවින් ඒ සඳහා ගිණුම්වල වෙන් කිරීම් සිදු කර නොමැත.

12 නිඟ සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල්

සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගේ වැටුපෙන් 10% ක්ද සේව්‍යයාගෙන් 12% ක්ද වශයෙන් හා සේවක භාරකාර අරමුදලට සේව්‍යයාගෙන් 03% ක්ද වශයෙන් බැර කිරීමට අධිකාරිය විසින් කටයුතු කරනු ලබයි. සේවක අර්ථසාධක පනතේ නියමයන්ට අනුව අධිකාරියේ සේවකයින් සඳහා සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් සඳහා දායක මුදල් ගෙවීම සිදු කරනු ලබන අතර 2020.12.31 දිනට නිඟ මුදල් ගෙවිය යුතුව නොමැත.

13 සංචිත

අධිකාරියේ ශුද්ධ වත්කම් / ස්කන්ධය තුළ පහත සඳහන් සංචිතද නියෝජනය වී ඇත.

ප්‍රත්‍යාගණන සංචිතය	-	රු.	8,949,317
පොදු සංචිත	-	රු.	1,350,000
ප්‍රාග්ධන සංචිත	-	රු.	2,262,663
මුළු සංචිත	-	රු.	12,516,980

ඉහත සංචිත මඟින් නිරූපනය වන්නේ 2008 වර්ෂය ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම මඟින් රු. 8,949,317/- ක් සහ පැරණි පොදු පහසුකම් මණ්ඩලය මඟින් මෙම අධිකාරියේ ගිණුම් සඳහා ඉදිරියට ගෙන එන ලද රු. 1,350,000/- ක් පොදු සංචිතය හා රු. 2,262,663/- ක් වන ප්‍රාග්ධන මාරු කිරීම්ද ඇතුළුව රු. 12,516,980/- ක සංචිත වේ.

14 ප්‍රසාද කොටස්

1984.01.17 දිනැතිව පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය මඟින් යොමු කරන ලද අනුමැතියට අනුව 1984.01.19 දින රු. 100/- කොටස් 5,000 ක් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවෙන් ලබා ගෙන ඇත.

එම කොටසක වටිනාකමට අදාළව 2000.06.29 දින කොටස් 25,000 ක ප්‍රසාද කොටස් නිකුතුවක් සිදු කර ඇත. මේ අනුව ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව නමින් මෙම අධිකාරිය සතුව රු. 100/- කොටස් 30,000 සඳහා රු. 3,000,000/- ක ආයෝජනයක් ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත.

15 ආදායම් බදු

2020.12.31 දිනට එම වර්ෂයේ ලාභය වන රු. 44,534,661/- ක වටිනාකම පදනම් කර ගනිමින් රු. 11,571,005/- ක බදු මුදලක් ආදායම් බදු වශයෙන් ගෙවීම සඳහා ගිණුම්වල ප්‍රතිපාදන වෙන් කර ඇත.

16 රාජ්‍ය ප්‍රධාන ගිණුම් තැබීම.

2017 වර්ෂයේදීත් භාණ්ඩාගාරය විසින් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සභාධිපත්‍ය දේපළ පදිංචිකරුවන් සහ අදාළ පාර්ශව දැනුවත් කිරීම් කටයුතු සඳහා රු. 10,000,000/- ක් වෙන් කරන ලද අතර ඉන් රු. 2,090,588/- ක් යොදවා එම ව්‍යාපෘතිය සඳහා ස්ථාවර වත්කම් මිළ දී ගෙන ඇත. එම වටිනාකමට සමානව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දිගු කාලීන වගකීම් - භාණ්ඩාගාර ප්‍රතිපාදන යනුවෙන් වාර්ෂිකව ක්‍රමයෙන් ක්ෂය වන පරිදි පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත. ප්‍රවර්ථන වර්ෂයේ එම වටිනාකම රු. 717,155/- ක් වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම් කර ඇත.

17 ක්ෂය වෙන්කිරීම්

ස්ථාවර වත්කම් සඳහා සටහන් අංක 06 මඟින් පෙන්නුම් කර ඇති ප්‍රතිශත පදනම් කර ගනිමින් ක්ෂය වෙන් කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව වාර්ෂික ක්ෂය වටිනාකම වශයෙන් රු. 12,666,348/- ක් ප්‍රවර්ථන වර්ෂයේ ලාභයට ගැළපීමටද කටයුතු කරන ලදී. එමෙන්ම දැනුවත් කිරීම් වැඩසටහන් සඳහා ලබා දුන් භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් මිළ දී ගන්නා ස්ථාවර භාණ්ඩ සඳහා ක්‍රම ක්ෂය වශයෙන් රු. 418,118/- ක මුදලක් ගිණුම්වල ගැළපීම සඳහාද කටයුතු කර ඇත.

18 මුදල් හා මුදල් සමාන දෑ / කෙටි කාලීන ආයෝජන

බැංකුවල ඇති මුදල් සත් දින තැන්පතු සහ කෙටි කාලීන ආයෝජනයන්ගෙන් මුදල් හා මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජනවලින් සමන්විත වේ. මුදල් ප්‍රවාහයේ මුදල් හා මුදල්වලට සමාන දෑ පහත ප්‍රකාශනයේ මූල්‍ය තත්ත්වයේ වටිනාකම්වලින් සමන්විත වේ.

මුදල් හා මූල්‍යමය අයිතම	2019	2020
බැංකු සහ අතැති මුදල්	37,680,359	2,330,873
කෙටි කාලීන ආයෝජන	16,890,887	35,125,597
සත්දින තැන්පතු	-	4,483,754
	54,571,246	41,940,224

19

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 15 ට අනුකූලව මූල්‍ය වාර්තා අයවැයගත තොරතුරු සමඟ සැසඳීම් කර ඊට අදාළ වාර්තාව ගිණුම් සමඟ ඉදිරිපත් කර ඇත.

20 ණයගැති අයකිරීම්

2015 වර්ෂයට පෙර තාවකාලික සහාධිපත්‍ය සහතිකය නිකුත් කිරීමේදී අවසාන සහතිකයේ වටිනාකමින් 35% ක් ලබා ගැනීම සිදු විය. පහත සඳහන් දේපළ සංවර්ධකයින් සහාධිපත්‍ය සහතික ඉල්ලුම් කිරීමේදී ලැබිය යුතු ඉතිරි 65% ක මුදල් ණයගැතියන් ලෙස හිණුම්ගත කර ඇත. පසුව අවසාන සහාධිපත්‍ය සහතිකය ලබා ගැනීමේදී ඉතිරි මුදල් ගෙවන විට එම මුදල් අදාළ වර්ෂවල අවසාන සහතික ආදායමට ගැළපීම හේතුවෙන් ලාභය අධිගණනය වී ඇත. ප්‍රවර්ථන වර්ෂයේදී එම හිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට රු. 1,386,533/- ක මුදල් සමුච්චිත ලාභයෙන් අඩු කිරීම සිදු කරන ලදී.

01.	හෝම් ලෑන්ඩ්ස්	රු.	1,049,151
02.	කේ. එච්. ටී. සී. සිල්වා (ගම්පහ ඩිවලොප්මන්ට්)	රු.	216,477
03.	සිවිමෙක් කන්ස්ට්‍රක්ෂන්ස්	රු.	120,905
		රු.	1,386,533

21

2020 හිණුම් වර්ෂයේදී Covid - 19 අරමුදලට රු. මි. 10 ක මුදලක් පරිත්‍යාග කළ අතර එය මෙහෙයුම් නොවන වියදම් යටතේ ආයතනික සමාජ වගකීමක් ලෙස දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

01. දේපළ පිරියත සහ උපකරණ

	2020.01.01 දිනට පිරිවැය	වර්ෂය තුළ අත්පත් කර ගැනීම්	වර්ෂය තුල බැහැර කිරීම්	2020.12.31 දිනට පිරිවැය	2019
කතරගම සංචාරක බංගලා ඉඩම	1,520,000	-	_	1,520,000	1,520,000
කතරගම සංචාරක බංගලා ගොඩනැගිල්ල	6,700,000	-	_	6,700,000	6,700,000
කාර්යාල ලී බඩු සහ උපාංග	6,840,380	949,957	_	7,790,337	6,840,380
මෝටර් රථ	62,400,214	_		62,400,214	62,400,214
යන්ත්‍ර සහ උපකරණ	14,479,729	3,132,742	_	17,612,471	14,479,729
මෙවලම් සහ උපකරණ	3,469,484	492,234	_	3,961,718	3,469,484
	95,409,807	4,574,933	-	99,984,740	95,409,808

	2020.01.01 දිනට සමුච්චිත ක්ෂය වෙන්කිරීම්	වර්ෂය සඳහා ක්ෂය වෙන්කිරීම්	බැහැර කිරීම් සඳහා ක්ෂය වෙන්කිරීම්	2020.12.31 දිනට සමුච්චිත ක්ෂය වෙන් කිරීම	2019
අඩු කලා ක්ෂය ප්‍රතිපාදන					
කතරගම සංචාරක බංගලා ගොඩනැගිල්ල	3,216,000	268,000	-	3,484,000	3,216,000
කාර්යාල ලී බඩු සහ උපාංග	3,878,523	889,840	-	4,768,363	3,878,523
මෝටර් රථ	50,578,523	8,974,875	-	59,553,398	50,578,523
යන්ත්‍ර සහ උපකරණ	6,832,654	2,212,187	-	9,044,841	6,832,654
මෙවලම් සහ උපකරණ	2,639,418	321,446	-	2,960,864	2,639,418
	67,145,118	12,666,348	-	79,811,466	67,145,118
2020.12.31 දිනට ලියා හරින ලද වටිනාකම				20,173,275	28,264,691

02. මුදල හා මූල්‍යමය අයිතම

		2020	2019
බැංකු සහ අතැති මුදල්	උපලේඛණ 01	2,330,873	37,680,359
		2,330,873	37,680,359

03. කෙටිකාලීන ආයෝජන

එඩිමන්ටන් රජයේ නිවාස ක්‍රමයේ අරමුදල් ආයෝජන	14,981,791	13,563,311
පාරිතෝෂික වෙන් කිරීම් ආයෝජන - ඉතුරුම් ගිණුම	3,455,847	3,327,576
මූල්‍ය වෙළඳපොළ ආයෝජන	16,687,959	-
සත්දින තැන්පතු	4,483,754	-
	39,609,351	16,890,887

04 වෙළඳ ණයගැතියෝ, සේවක ණය හා වෙනත් ලැබිය යුතු ශේෂ

ලැබිය යුතු විවිධ තැන්පතු	උපලේඛණ 02	388,125	383,187
ණය ගැතියන්	උපලේඛණ 03	3,491,886	6,831,531
කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	උපලේඛණ 04	21,839,592	21,454,502
		25,719,603	28,669,220

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

		2020	2019
05. තොග ගිණුම්			
ප්‍රධාන කාර්යාල තොග		99,610	119,306
කාර්යාල සැපයුම් තොග		1,429,515	1,778,695
		1,529,126	1,898,001
06. ස්ථාවර තැන්පතු			
මහජන බැංකුව		327,838,807	173,913,888
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව		2,020	87,540,203
		327,840,827	261,454,091
07. ඉදිරියට කළ ගෙවීම්			
ඉන්ධන දීමනා		-	51,000
වාහන ලියාපදිංචි ගාස්තු		23,553	45,645
රක්ෂණ		172,393	-
		195,946	96,645
08. වෙනත් ලැබිය යුතු			
සත් දින තැන්පතු පොලී		-	-
ස්ථාවර තැන්පතු පොලී		3,192,297	2,861,819
		3,192,297	2,861,819
09. ණය හිමියන් සහ අත්තිකාරම්			
ගණුදෙනුකරුවන්ගෙන් ලැබුන අත්තිකාරම්	උපලේඛණ 05	1,495,297	1,495,297
විවිධ ණය හිමියන්	උපලේඛණ 06	21,160,288	16,464,911
		22,655,585	17,960,208
10. උපචිත වියදම්			
වැටුප් හා වෙනත් වැඩබිම් දීමනා		-	50,852
සමතකරණ දීමනා		65,000	158,800
අතිකාල		1,069,574	2,087,404
නිවාඩු දින දීමනා		159,497	505,027
වාහන අළුත්වැඩියා		19,700	845,746
වාහන සේවා ගාස්තු		-	56,808
පරිවර්තන		11,615	-
දුරකතන		140,744	89,451
ප්‍රසාද දීමනා		-	9,493
තේ පැන් වියදම්		4,550	-
සහතිකපත් වියදම්		55,000	-
නීති ගාස්තු		3,000	5,000
විකතු කළ අගය මත බදු		23,830	5,130
විදුලි ගාස්තු		105,939	86,189

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

		2020	2019
ගමන් වියදම්		80,339	87,308
ජල බිල්පත්		20,098	844
කතරගම සංචාරක බංගලා වියදම්		24,116	7,689
ඉන්ධන වියදම්		105,833	97,995
පුවත්පත් දැන්වීම්		21,000	3,990
පුවත්පත්		5,990	-
යන්ත්‍ර නඩත්තු		21,240	-
කාර්යාල නඩත්තු		200,000	124,956
		2,137,066	4,222,681
11. ගෙවිය යුතු			
උපචිත වගකීම්	උපලේඛණ 07	1,441,816	1,734,129
සැපයුම්කරුවන් සඳහා ගෙවිය යුතු		514,935	45,786
රඳවාගත් මුදල්		566,164	773,637
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් ගාස්තු		63,264	73,264
සේවක ආරක්ෂිත තැන්පතු		133,125	128,187
		2,719,304	2,755,003
12. ප්‍රතිපාදන			
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		1,546,183	1,815,783
සේවක වන්දි සඳහා ප්‍රතිපාදන		54,986	54,986
ආර්ථික සේවා ගාස්තු ප්‍රතිපාදන		(17,725)	202,686
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන		11,571,005	1,499,710
		13,154,449	3,573,165
13. මෙහෙයුම් ආදායම්			
සභාධිපත්‍ය දේපල සඳහා සහතික නිකුත් කිරීමේ ආදායම්	උපලේඛණ 08	168,165,746	154,252,894
අළුත්වැඩියා හා නඩත්තු ආදායම්	උපලේඛණ 09	8,410,083	8,099,467
විවිධ මෙහෙයුම් ආදායම්	උපලේඛණ 10	276,916	308,817
		176,852,745	162,661,178
14. වෙනත් මෙහෙයුම් ආදායම්			
ලියාපදිංචි කිරීමේ ගාස්තු	උපලේඛණ 11	2,097,132	1,825,938
ඉල්ලුම් පත්‍ර ගාස්තු		75,000	118,750
පරිපාලන ගාස්තු		-	2,229
		2,172,132	1,946,917
15. මෙහෙයුම් නොවන ආදායම			
සේවක ණය සඳහා පොළිය		281,614	679,630
ඉතිරි කිරීම් සඳහා පොළිය		131,551	131,777
සත්දින තැන්පතු සඳහා පොළිය		-	519,931
ස්ථාවර තැන්පතු සඳහා පොළිය		21,828,112	31,975,303

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

	2020	2019
ස්ථාවර වත්කම් ක්‍රම ක්ෂය ගැළපීම්	418,118	418,118
රක්ෂණ වන්දි ලැබීම්	-	144,019
ලංකා කෙට් ආයතනයෙන් ලද පොලී	1,192,813	-
අඩමාන ණය අඩි වෙන්කිරීම්	840,998	-
	24,693,205	33,868,778
16. සේවක වැටුප් සහ දීමනා		
සභාපති දීමනා	793,966	820,000
වැටුප් හා වේතන	65,121,794	61,218,624
සේවක අර්ථ සාධක අරමුදල	8,089,902	7,819,735
සේවක භාරකාර අරමුදල	2,022,102	1,963,444
අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	20,532,803	28,348,490
ප්‍රසාද දීමනා	1,752,084	1,785,853
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා	492,000	390,000
සේවක සුභසාධනය	350,000	515,000
සේවක පුහුණු කිරීම්	796,083	1,067,089
සේවක වෛද්‍ය රක්ෂණය	5,229,296	4,919,428
සේවක නිළ ඇඳුම්	188,000	192,000
සේවක නිවාස ණය පොලී ප්‍රතිපූර්ණ වියදම්	1,876,161	2,584,612
පාරිතෝෂික	3,576,404	5,744,321
	110,820,596	117,368,596
17. ගමන් වියදම්		
රට ඇතුලත ගමන් වියදම්	1,001,758	2,097,976
වැඩබිම් දීමනා	58,800	58,800
විදේශ ගමන් වියදම්	-	990,906
	1,060,558	3,147,682
18. සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය		
මුද්‍රණ කටයුතු සහ ලිපි ද්‍රව්‍ය	1,279,827	1,501,133
තේ වියදම්	725,026	935,422
මෝටර් රථ සඳහා ඉන්ධන	2,547,614	3,780,042
ඉන්ධන දීමනා	333,338	869,805
කාර්යාල සැපයුම්	842,607	272,942
	5,728,412	7,359,344
19. නඩත්තු		සටහන 19
වාහන අලුත්වැඩියා සහ නඩත්තු	2,584,480	6,893,944
පරිගණක අලුත්වැඩියා සහ නඩත්තු	334,810	1,198,910
කතරගම සංචාරක නිවාස නඩත්තු	120,687	388,714

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

		2020	2019
ලී බඩු උපාංග යන්ත්‍ර සහ උපකරණ නඩත්තු		316,124	107,357
කාර්යාල ගොඩනැගිලි නඩත්තු		1,434,114	4,593,220
කාර්යාල නඩත්තු		1,260,798	1,093,727
		6,051,013	14,275,872
20. ව්‍යවස්ථාපිත වියදම්			
විදුලිය		1,019,938	996,846
දුරකතන		1,190,343	1,506,060
රක්ෂණය		1,086,790	1,160,705
ජල බිල්		192,020	196,705
වාහන බලපත්‍ර ගාස්තු		96,382	212,607
තැපැල් හා විදුලි පණිවිඩ ගාස්තු		100,705	161,065
නීතිඥ ගාස්තු		423,165	335,280
දැන්වීම් ගාස්තු		269,950	912,638
මාර්ගස්ථ මුදල් රක්ෂණ ගාස්තු		29,753	29,653
පුවත්පත්		50,970	91,610
කාර්යාල බදු කුළී		4,816,336	3,557,139
අර්ධ සුඛෝපභෝගී බදු		36,000	-
භාෂා පරිවර්තන ගාස්තු		73,360	82,190
		9,385,712	9,242,498
21. සෘජු වියදම්			
සහතික නිකුත් කිරීමේ වියදම්		478,595	481,685
අලුත්වැඩියා සහ නඩත්තු වියදම්	උපලේඛණ 12	610,011	1,126,584
සමතකරණ ගාස්තු		984,600	1,329,350
		2,073,206	2,937,619
22. වෙනත් මෙහෙයුම් වියදම්			
අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම		51,105	57,690
තොග සමීක්ෂණ කමිටු ගාස්තු		112,000	24,000
ප්‍රසම්පාදන වියදම්		-	5,500
දැනුවත් කිරීමේ වැඩසටහන්		34,505	228,774
කළමනාකරණ සංස්ථා වියදම්		104,008	21,155
		301,618	337,119
23. මූල්‍ය වියදම්			
විගණන ගාස්තු		765,072	792,396
බැංකු ගාස්තු		93,206	107,131
අඩමාන ණය වෙන් කිරීම		-	2,433,469
ආර්ථික සේවා ගාස්තු		-	992,374
ජාතිය ගොඩනැගීමේ බදු		-	240,826

මූල්‍ය ප්‍රකාශය සඳහා සටහන්

	2020	2019
මුද්දර ගාස්තු	2,467	12,042
	860,745	4,578,238

24. මෙහෙයුම් නොවන වියදම්

සභාපති හමුවීමට පැමිණෙන්නන්ට සංග්‍රහ වියදම්	35,825	41,527
විවිධ වියදම්	27,733	174,782
ආයතනික සමාජ වගකීම්	10,025,000	150,000
විනය පරීක්ෂණ ගාස්තු	146,657	64,055
යොවුන්පුරය ප්‍රදර්ශන වියදම්	-	164,638
	10,235,214	595,002

25. ස්ථාවර/ඉන්වෙන්ට්‍රිය අඛිලි ද්‍රව්‍ය විකිණීමේ අතිරික්තය / (ඌනතාව)

විකුණුම් මිල	-	43,950
සමුච්චිත ක්ෂය	-	266,935
	-	310,885
අඩු කළා		
පිරිවැය	-	266,935
අඛිලි ද්‍රව්‍ය විකිණීමේ අතිරික්තය / (ඌනතාව)	-	43,950

මූල්‍ය ප්‍රකාශය සඳහා උපලේඛණ

	2020	2019
01. බැංකු සහ අතැති මුදල් බැංකු සහ අතැති මුදල්		
මහජන බැංකුව - ගිණුම් අංක - 204-1-001-0081817	396,267	30,154,990
මහජන බැංකුව - ගිණුම් අංක - 204-1-002-19 - 0081817	1,080,532	1,080,532
ලංකා බැංකුව ගිණුම් අංක - 0000351042	854,074	6,409,735
ඉතිරි කිරීමේ ගිණුමේ තැන්පතු - මහජන බැංකුව	-	35,102
	2,330,873	37,680,359
02. විවිධ තැන්පතු		
සේවක ආරක්ෂක තැන්පතු ආයෝජන	133,125	128,187
ඉන්ධන තැන්පතු	250,000	250,000
තැපැල් මුද්‍රාව භාවිතය සඳහා තැන්පතුව	5,000	5,000
	388,125	383,187
03. ණයගැතියෝ		
මාදිවෙල පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය	783,461	1,832,524
ගම්පහ රෝහල පොම්පාගාර නඩත්තු	1,452,314	1,685,594
ලංකා කෝට් (පුද්) සමාගම	-	807,188
සමතකරණ ගාස්තු	2,671,161	2,671,161
ජල්තර රජයේ සේවක නිවාස ක්‍රමයේ විදුලි බිල්	419,775	422,429
මීගමුව රෝහල - පොම්පාගාර නඩත්තු	5,940,770	5,940,770
සීගල් ඩිවලොප්මන්ට් (පුද්) සමාගම	63,027	63,027
ආර්.එච්. එස්. විජේපාල	11,891	11,891
ගම්පහ සංවර්ධන සමාගම	-	216,477
සිවිමෙක් කන්ස්ට්‍රක්ෂන්ස්	-	120,905
ඒ.එම්.එම් තාහිර්	54,657	54,657
ප්‍රීඩම් පාක් සාප්පු සංකීර්ණය	165,376	165,376
කොරල් ප්‍රොපර්ටි	-	701,926
ෆ්ලවර් කෝට්	548,137	548,137
මහියංගන සතිපොළ	657,849	657,849
හිරු ඩිවලොප්මන්ට්	125,080	125,080
හෝම් ලෑන්ඩ්ස්	-	1,049,151
එම්.අබේසූරිය	6,061	6,061
	12,899,559	17,080,203
අඩු කළා.		
බොල් හා අඩමාන ණය වෙන් කිරීම	9,407,674	10,248,672
	3,491,886	6,831,531
04. කාර්යය මණ්ඩල ණය සහ අත්තිකාරම්		
ස්වභාවික ආපදා ණය	70,266	198,447
ආපදා ණය	19,851,215	19,769,907

මූල්‍ය ප්‍රකාශය සඳහා උපලේඛණ

		2020	2019
විශේෂ ආපදා ණය		517,500	573,750
උත්සව අත්තිකාරම්		46,250	80,000
පොත් මිළ දී ගැනීම් අත්තිකාරම්		742,400	480,000
සුභ සාධක සංගමය		350,000	-
හිරාජ් සුරංග		-	170,308
ජී. වී. යූ. ටී. සම්පත්		1,252	12,520
ප්‍රදීප් ප්‍රසන්න		55,284	75,186
ජේ. නිත්‍යකළා		-	1,500
නිශාදි අනුක්ෂිකා		92,884	92,884
චන්දන සමරසිංහ		30,313	-
ගම්පහ සේවක අයකර ගැනීම්		82,227	-
		21,839,592	21,454,502
05. ගණුදෙනුකරුවන්ගෙන් ලැබෙන අත්තිකාරම්			
නගමු පුරවර	උපලේඛණ 13	1,144,729	1,144,729
අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම - ජා.නි.ස.අ		350,568	350,568
		1,495,297	1,495,297
06. විවිධ ණය හිමියන්			
එකතු කල අගය මත බදු		5,949,882	1,906,008
ජාතිය ගොඩනැගීමේ බදු		36,164	36,164
විවිධ අත්තිකාරම්		3,176	3,176
එඩ්මන්ටන් රජයේ සේවක නිවාස ක්‍රමයේ නිදන්ගත අරමුදල්		14,981,791	13,563,311
ස්වයංසවිය, සොයිසාපුර නිවාස ක්‍රමය		6,865	6,865
ලුනාව සමුද්‍ර ශක්ති කළමනාකරණ සංස්ථාව		-	802,209
සෙවණ අරමුදල		82,564	82,564
සේවක සුබ සාධක අරමුදල		15,000	45,000
සේවක වෛද්‍ය රක්ෂණ ප්‍රතිපූර්ණය		-	7,747
ස්පෑන් ඉංජිනියරින්		10,000	10,000
සුබෝධා කරුණාසේකර		-	1,867
සේවකයින් සඳහා ගෙවියයුතු		74,845	-
		21,160,288	16,464,911
07. උපචිත වගකීම්			
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්		1,221,062	1,193,553
මුද්දර ගාස්තු		48,720	9,197
ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල්		166,508	162,757
තෙවන පාර්ශවීය ගෙවීම්		5,525	368,622
		1,441,816	1,734,129

මූල්‍ය ප්‍රකාශය සඳහා උපලේඛණ

	2020	2019
08. සහාධිපත්‍ය දේපළ සඳහා සහතික නිකුත් කිරීම.		
ඉදිකර අවසන් කර ඇති දේපළ සඳහා නිකුත් කරන ලද සහතික - වීකක 05 දක්වා	4,242,229	3,408,638
ඉදිකර අවසන් කර ඇති දේපළ සඳහා නිකුත් කරන ලද සහතික - වීකක 05 වැඩි	120,032,723	110,724,989
තාවකාලික දේපළ සඳහා නිකුත් කරන ලද සහතික - වීකක 05 දක්වා	-	1,371,987
තාවකාලික දේපළ සඳහා නිකුත් කරන ලද සහතික - වීකක 05 වැඩි	518,661	558,799
අර්ධ ඉදිකිරීම් සඳහා නිකුත් කරන ලද සහතික - වීකක 05 දක්වා	-	-
අර්ධ ඉදිකිරීම් සඳහා නිකුත් කරන ලද සහතික - වීකක 05 වැඩි	21,525	7,146,409
සහාධිපත්‍ය සහතික අළුත්කිරීමේ ගාස්තු	7,500	36,000
25% සහාධිපත්‍ය සහතික (මූලික නිශ්කාෂණ)	43,343,107	31,002,072
සහාධිපත්‍ය දේපළ ඉවත්කිරීමට නිර්දේශ කිරීම් ගාස්තු	-	4,000
	168,165,746	154,252,894
09. අළුත්වැඩියා සහ නඩත්තු ආදායම්		
මාදිවෙල පාර්ලිමේන්තු නිවාස සංකීර්ණය නඩත්තු ආදායම	5,227,124	4,724,451
ගම්පහ රෝහල පොම්පාගාර නඩත්තු ආදායම	3,182,959	3,375,016
	8,410,083	8,099,467
10. විවිධ මෙහෙයුම් ආදායම්		
කතරගම සංචාරක බංගලා ආදායම	128,180	265,289
වෙනත් ආදායම්	148,736	43,528
	276,916	308,817
11. ලියාපදිංචි ගාස්තු		
පුද්ගලික කළමනාකරණ සංස්ථා ලියාපදිංචි ආදායම	106,794	92,542
පුද්ගලික කළමනාකරණ සංස්ථා ලියාපදිංචිය අළුත්කිරීමේ ආදායම	1,896,839	1,575,208
රජයේ නිවාස ක්‍රමවල කළමනාකරණ සංස්ථා ලියාපදිංචි ආදායම	-	42
රජයේ නිවාස ක්‍රමවල කළමනාකරණ සංස්ථා ලියාපදිංචිය අළුත්කිරීමේ ආදායම	36,667	75,708
පුද්ගලික කළමනාකරණ කමිටු ලියාපදිංචි ආදායම	4,375	625
පුද්ගලික කළමනාකරණ කමිටු ලියාපදිංචිය අළුත්කිරීමේ ආදායම	27,208	9,813
රජයේ නිවාස ක්‍රමවල කළමනාකරණ කමිටු ලියාපදිංචිය අළුත්කිරීමේ ආදායම	250	-
සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීමේ ආදායම	25,000	72,000
	2,097,132	1,825,938
12. අලුත්වැඩියා සහ නඩත්තු වියදම්		
මාදිවෙල පාර්ලිමේන්තු නිවාස ක්‍රමය නඩත්තු වියදම්	586,760	600,372
ගම්පහ රෝහල පොම්පාගාර නඩත්තු වියදම්	23,251	626,212
	610,011	1,226,584
13. නගමු පුරවර අත්තිකාරම්		
නගමු පුරවර ව්‍යාපෘතිය සඳහා ලද මුදල්	2,491,071	2,491,071
අඩු කලා - වැඩ වටිනාකම	(1,346,342)	(1,346,342)
2015.12.31 දිනට ඉදිරියට ගෙන ආ මුදල	1,144,729	1,144,729

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
ශුද්ධ වත්කම් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ඒකකය රු.000

	පාලන අස්ථිත්වයේ අයිතිකරුවන්ට අදාළ වන						සුළු කොටස් හිමි අයිතිය	මුළු ශුද්ධ වත්කම් ස්කන්ධය
	සහභාගී ප්‍රාග්ධනය	ව්‍යවස්ථාපිත සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	පොදු සංචිතය	සමුච්චිත ලාභ / අලාභ	මුළු එකතුව		
2019 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය	3,000	2,263	22,309	1,350	310,448	339,370	-	339,370
2019 වසර සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස	-	-	(13,360)	-	15,404	2,044	-	2,044
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌනතාව)	-	-	-	-	18,187	18,187	-	18,187
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	3,000	2,263	8,949	1,350	344,039	359,601	-	359,601
2020 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය	3,000	2,263	8,949	1,350	344,039	359,601	-	359,601
2020 වසර සඳහා ශුද්ධ වත්කම් ස්කන්ධය / වෙනස	-	-	-	-	(1,261)	(1,261)	-	(1,261)
කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌනතාව)	-	-	-	-	32,964	32,964	-	32,964
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	3,000	2,263	8,949	1,350	375,742	391,304	-	391,304

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
2020.12.31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහය	2020	2019
ආදායම් බදු සහ විශේෂිත අයිතමවලට පෙර ශුද්ධ (අලාභය) / ලාභය	44,534,661	18,186,738
ගැලපුම්		
ස්ථාවර වත්කම් ක්‍රමක්ෂය	(418,118)	-
ක්ෂය වෙන්කිරීම්	12,666,348	12,401,023
බොල් හා අඩමාන ණය අධි වෙන්කිරීම්	(840,998)	-
ගබඩා භාණ්ඩ විකිණීමේ ලාභ	-	(43,950)
විගණන ගාස්තු වෙන් කිරීම	765,072	792,396
පාරිතෝෂික සඳහා වෙන්කිරීම	3,576,404	5,744,320
ආයෝජන ආදායම් /මෙහෙයුම් නොවන ආදායම්	(22,241,277)	(33,868,778)
ආදායම් බදු ප්‍රතිපාදන	-	8,091,093
ආදායම් බදු ගෙවීම්	(1,499,710)	-
ආර්ථික සේවා ගාස්තු ප්‍රතිපාදන	-	202,686
	36,542,382	11,505,528
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්		
තොග (වැඩි වීම)/අඩුවීම	368,875	(104,251)
ණයගැති (වැඩි වීම)/අඩුවීම	3,790,615	(834,080)
වෙනත් ලැබිය යුතු ශේෂ (වැඩි වීම)/අඩුවීම	(330,478)	621,698
ඉදිරියට කළ ගෙවීම් (වැඩි වීම)/අඩුවීම	(99,301)	(500)
ගෙවිය යුතු ශේෂ (අඩුවීම)/වැඩිවීම	(35,699)	(7,791,639)
උපචිත වියදම් (අඩුවීම)/වැඩිවීම	(2,085,615)	(2,632,544)
ණය හිමියෝ (අඩුවීම)/වැඩිවීම	4,695,377	(5,632,216)
ස්ථාවර වත්කම් ක්‍රම ක්ෂය	-	(418,117)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ජනිත වන මුදල් ප්‍රවාහය	42,846,155	(5,286,171)
පාරිතෝෂික ප්‍රතිපාදන ගෙවීම්	(1,015,920)	(2,827,980)
ආර්ථික සේවා ගාස්තු ගෙවීම	(220,411)	-
විගණන ගාස්තු ගෙවීම්	(1,034,671)	(737,748)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	40,575,154	(8,851,899)
ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය		
ආයෝජන	(69,611,977)	(6,173,752)
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(4,574,933)	(5,648,689)
ගබඩා භාණ්ඩ විකිණීමෙන්	-	43,950
පොලී ලැබීම්	22,241,277	33,868,778
ආර්ථික සේවා ගාස්තු ගෙවීම	-	(453,924)
ආදායම් බදු ගෙවීම්	-	(43,205,596)
ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය	(11,370,479)	(30,421,132)
මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහය		
භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් වෙන්කිරීම්	-	(25,377,602)
පෙර වර්ෂ ගැලපුම්	(1,260,542)	2,044,566
මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහය	(1,260,542)	(23,333,036)
මුදල් හා මුදල් සමාන දෑ සඳහා ශුද්ධ මුදල් ප්‍රවාහය	(12,631,021)	(53,754,168)
ආරම්භක ශේෂය - මුදල් හා මුදල් සමාන දෑ	54,571,246	108,325,416
අවසාන ශේෂය - මුදල් හා මුදල් සමාන දෑ	41,940,224	54,571,246

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
අයවැයගත සහ සත්‍ය අගයන් සැසඳීමේ ලේඛණය

සත්‍ය වටිනාකම		සත්‍ය වටිනාකම	අයවැයගත සංඛ්‍යා			දෙවන සංශෝධිත අයවැය හා සත්‍ය වටිනාකම අතර වෙනස
			ප්‍රථම අයවැය	පළවන සංශෝධිත අයවැය	දෙවන සංශෝධිත අයවැය	
		2020	2020	2020	2020	
	ආදායම්					
162,661,179	මෙහෙයුම් ආදායම්	176,852,745	329,360,000	329,360,000	180,680,000	3,827,255
1,946,917	වෙනත් මෙහෙයුම් ආදායම්	2,172,132	2,710,000	2,710,000	2,870,000	697,868
33,868,778	මෙහෙයුම් නොවන ආදායම්	24,693,205	42,332,000	42,332,000	32,530,000	7,836,795
198,476,874	මුළු මෙහෙයුම් ආදායම	203,718,082	374,402,000	374,402,000	216,080,000	12,361,918
	මෙහෙයුම් වියදම්					
117,368,596	සේවක වැටුප් හා දීමනා	110,820,596	135,588,000	135,588,000	109,358,000	(1,462,596)
3,147,682	ගමන් වියදම්	1,060,558	4,070,000	4,070,000	1,065,000	4,442
7,359,344	සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය	5,728,412	9,500,000	9,500,000	5,200,000	(528,412)
14,275,872	නඩත්තු වියදම්	6,051,013	16,600,000	16,600,000	8,800,000	2,748,987
9,242,498	ව්‍යවස්ථාපිත වියදම්	9,385,712	9,828,000	9,828,000	9,926,000	540,288
2,937,619	සෘජු වියදම්	2,073,206	2,700,000	2,700,000	2,350,000	276,794
12,401,023	ස්ථාවර වත්කම් ක්ෂයවීම්	12,666,348	13,018,000	13,018,000	12,370,000	(296,348)
337,119	වෙනත් මෙහෙයුම් වියදම්	301,618	7,800,000	7,800,000	3,350,000	3,048,382
167,069,753	මුළු මෙහෙයුම් වියදම්	148,087,463	199,104,000	199,104,000	152,419,000	4,331,537
31,407,121	මෙහෙයුම් ක්‍රියාකාරකම් - අතිරික්තය/(ඌණතාවය)	55,630,619	175,298,000	175,298,000	63,661,000	8,030,381
4,578,238	මූල්‍ය වියදම්	860,745	3,300,000	3,300,000	3,010,000	2,149,255
595,002	මෙහෙයම් නොවන වියදම්	10,235,214	1,530,000	11,530,000	11,230,000	994,786
5,173,240	මුළු මෙහෙයුම් නොවන වියදම්	11,095,959	4,830,000	14,830,000	14,240,000	3,144,041
26,233,881	මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුළු අතිරික්තය/(ඌණතාවය)	44,534,660	170,468,000	160,468,000	49,421,000	4,886,340
						-
43,950	අබිලි ද්‍රව්‍ය විකිණීමේ අතිරික්තය/ (ඌණතාවය)	-	500,000	500,000	250,000	250,000
26,277,831	බදු අඩු කිරීමට පෙර ශුද්ධ අතිරික්තය / (ඌණතාවය)	44,534,660	170,968,000	160,968,000	49,671,000	5,136,340

සටහන්

සටහන්

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

නිවාසකරණයේ නව්‍ය පිවිසුම

පළමු මහළ
ජාතික නිවාස ගොඩනැගිල්ල
සර් විත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත
කොළඹ 02

දුරකතන +94 11 2444575 (ක්ෂණික ඇමතුම්)
+94 11 2447429
+94 11 2447432
+94 11 5757176
ෆැක්ස් +94 11 2423606
විද්‍යුත් තැපෑල info@condominium.lk
වෙබ් අඩවිය www.condominium.lk